ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 අප්‍රේල් 05 වන බදාදා
3 කාණ්ඩය 18 කලාපය
මිල රු. 80 යි




විශේෂ අතිරේකයක් නොමිලේ

අවුරුදු කෑම මේසෙට කෙසෙල් කිරිබත් ආවේ ගැහැණු පිරිමි අනාචාරයේ හැසිරුණ නිසාලු

සාධාරණ නඩු විභාගයක් තිබුණානම් ප්‍රමිලාගේ ලපය දැක්ක විදිය දසකොන්ටත් කියන්න තිබුණා

හුනියමකට මිනී ඔලුවක් ඕනෑ කර තිබේ

ලීක් වෙච්ච ෆොටෝ එක ගැන මිස මගේ දක්ෂතා ගැන ඉස්කෝලේ රැස්වීමේ කතා කළේ නෑ

සියදිවි නසාගත් දුවක් අවසන් වතාවට ලියයි

Celebrity Designer Wedding Show හි කැරොලයින් ජූරි සහ නිශාන් දීපාල්

ඡායාරූප pulse #LivingIt





# පාසල් ගුරුවරියෝ නටන්නට සැරසෙති

“දරුවෙක්ට සමාජයට පිවිසෙන්න තියෙන මුල්ම අඩිතාලම වැටෙන්නේ පෙරපාසල් අධ්‍යාපනයෙන් කියලා කියනවනේ. ළමා පෞරුෂය සංවර්ධනය කරගැනීමට, දෛනිකව ස්වඋත්සාහයෙන් තමන්ගේ කටයුතු කරගැනීමට, තම සිතැඟියාවන් දෙමාපිය ගුරුවරු වැඩිහිටියන්ට පැවසීමට වගේම අන් අයට ගරු සත්කාර කිරීමටත් දරුවන් මුලින්ම ඉගෙනගන්නේ පෙරපාසලෙන්. ඒ නිසා පෙරපාසල් අධ්‍යාපනයත් නිසි ප්‍රමිතියකට අනුව සකස් විය යුතුයි වගේම පෙරපාසල් ගුරුවරියන්ද ආකල්ප සහ කුසලතාවලින් පරිපූර්ණ විය යුතුයි. ඒ විතරක් නෙවෙයි ඔවුන් ළමා අධ්‍යාපනය සහ ළමා මනස ගැන නිසි අවබෝධයක් ඇතුව ඊට සුදුසුකම් සපුරා ඇති අයෙකු විය යුතුයි. විශේෂයෙන්ම ළමා වයසට සහ මනසට ගැළපෙන ක්‍රියාකාරකම්වල යෙදීමට නිරෝගීව සිටිය යුතුයි.”

උතුරු මැද පළාත් පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂක නිලන්ත ඒකනායක මහතා පවසන්නේ එසේ නොමැතිව සේවා කාලයෙන් පමණක්ම පරිණත ගුරුවරුන්ට එය සාර්ථකව කරගෙන යාමට නොහැකි බවක්.

“පෙරපාසල් ළමයින්ගේ පෞරුෂ වර්ධනයට පෙරපාසල් ගුරුවරුන්ගෙන් විශාල සේවයක් සිදුවිය යුතුයි. ඒ අතරින් ප්‍රධාන වෙන්නේ කුඩා දරුවන්ගේ හසුරු කුසලතාවයන් ඔපනංවන එකත්, ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවිශ්ට වෙන්න පුළුවන් විදියට දරුවන්ගේ හැකියාවන් ප්‍රගුණ කරවීමත් කියන කාරණා දෙක. ඒත් දැනට උතුරුමැද පළාතේ ඉන්න පෙරපාසල් ගුරුවරු 210කට වැඩි පිරිසක් අවුරුදු 65ට වැඩි අය. ඒ අතරිනුත් තවත් පිරිසක් අවුරුදු 80කට වැඩියි. එතකොට බලන්න මේ වගේ වයස්වල ඉන්න ගුරුවරියන්ට පුළුවන්ද හැදෙන වවයසේ දරුවොත් එක්ක නිතරම එහාට මෙහාට දුවලා පැනලා බාහිර ක්‍රියාකාරකම්වල නිරත වෙන්න? අන්න ඒ නිසයි මේ ගුරුවරුන්ගෙන් දරුවන්ට ලොකු කාර්යභාර්යයක් ඉෂ්ට වෙන්නේ නැහැයි කියලා මම කියන්නේ.



**නිලන්ත ඒකනායක**
කළමනාකාර අධ්‍යක්ෂක උතුරු මැද පලාත් පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

නමුත් අපි එහෙම කිව්වට ඒ ගුරුවරුන්ට ඒ රැකියාව අතෑරලා විශ්‍රාම යන්න විදියක් නෑ. ඒකට ප්‍රධානම හේතුව මෙතුවක් කාලෙකට ඒ අයට ගෙවලා තියෙන්නේ රුපියල් 2500ක පුංචි දීමනාවක් විතරයි. කිසිම විශ්‍රාමික අරමුදලක් දැනටත් නෑ. ඒ නිසා අපි හිතුවා උතුරුමැද පළාතේ ගුරු සංගම් එකතු කරගෙන එක ගුරුවරයෙකුට රුපියල් ලක්ෂයක් වගේ වෙන්න අරමුදලක් හදලා දීලා ඒ අයව විශ්‍රාම යවන්න.

ඊටපස්සේ සුදුසුකම් තියෙන තරුණ ගුරුවරුන්ව පෙරපාසල් අධ්‍යාපනයට හරියන විදියට පුහුණු කරවන්නත් අපි මේ වෙනකොට ‘කැකුළු ගුරු හරසර’ කියලා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරගෙන යනවා.

මේ වැඩසටහනට පොලොන්නරුව සහ අනුරාධපුර පළාත් දෙකේම පෙරපාසල් ගුරුවරුන්ව සම්බන්ධ කරගැනීමටත් අපි කටයුතු කරලා තියෙනවා.

ඒකේ මූලිකම අරමුණ තමයි පෙරපාසල් ගුරුවරුන්ගේ ප්‍රාසාංගික හැකියාවන් වැඩිදියුණු කරන එක. පෙරපාසල් ගුරුවරිය කියන්නෙත් දක්ෂතාවයන්ගෙන් හැකියාවන්ගෙන් පිරුණු කෙනෙක් කියලා සමාජයට අවබෝධ කරවීම.

ඒ නිසා මේ ‘කැකුළු ගුරු හරසර’ නමින් අප්‍රේල් මාසේ 5 වැනිදා හවස 5ට පොලොන්නරුව රාජකීය විද්‍යාල ශ්‍රවණාගාරයේදී ප්‍රාසාංගික උත්සවයක් පවත්වන්නත් අපි මේ වෙනකොට කටයුතු සූදානම් කරලා තියෙනවා.”

මෙම වැඩසටහනේ විශේෂත්වය ඊට සහභාගී වන සියලුම පෙරපාසල් ගුරුවරු ළමා ගීතවලට තමන්ගේ ප්‍රාසාංගික අත්දැකීම ඉදිරිපත් කිරීම බවයි ඔහු අවසාන වශයෙන් කියාසිටියේ.

**ලිහිණි මධුෂිකා**

මහාචාර්ය අත්තනායක එම්



# අවුරුදු කෑම මේසෙට කෙසෙල් කිරිබත් ආවේ අල්ලපු රටේ උදවිය අනාචාරයේ හැසිරුණු නිසාලු

ඉන්දියානු කතාවක බොහොම ආදරෙන් පවුල් ජීවිතය ගත කරපු තරුණ යුවලක් ගැන සඳහන් වෙනවා. ගොවිතැන් බත් කරලා තමයි මේ දෙන්නා ජීවත්වෙලා තියෙන්නේ. ඔහොම ඉන්දැද්දි ඒ අයගේ නැකත් කෙලි උත්සව කාලේ ආරම්භ වුණාලු. ඔය නැකත් කෙලියත් හරියට අපේ සිංහල හින්දු අලුත් අවුරුද්ද වගේ එකක්. අපි අලුත් අවුරුද්දට කරන ගෙවල් දොරවල් අලුත් කිරීම, අලුත් ඇඳුම් ආයිත්තම් ගන්න එක, නෑගම් යන එක විතරක් නෙවෙයි ඒ අයත් කැවිලි පෙවිලි පවා හදනවලු. මේ කියන කුමාරයත් නැකත් කෙලිය දවසට අඳින්න එයාගේ බිරිඳට ලස්සන ඇඳුමක් ගෙනත් දීලා තියෙනවා. ඒත් ඇය නම් ඒ ඇඳුමට පොඩ්ඩක්වත් කැමති වෙලා නෑ. ඒ වෙලාවේ ඇය ඔහුට කියලා තියෙනවා ඒ ඇඳුම අඳින්න ඕන නම් රාජකීය මල්වත්තේ තියෙන වනික් මලේ පාටින් සායම් කරලා දෙන්න කියලා. ඒ කිව්ව ගමන් මේ මෝඩ කුමාරයත් බිරිඳට තියෙන ආදරේ නිසා වනික් මලක් හොරකම් කරන්න රජාගේ වත්තට පැනලා. ඒත් කරුමෙක මහත කියන්නේ මල කඩාගන්නකොටම ඔහුව රාජපුරුෂයින්ට අහුවෙලා. පස්සේ ඔය සිද්ධිය නිසා ඔහුව උල තියලා මරලා තියෙන්නේ ඔය කියන නැකත් කෙලිය උත්සව දවසෙදිමලු.

ඔය කතාව ටිකක් මතක් කරලා හිටියේ අපේ සිංහල අලුත් අවුරුද්දත් ඔය නැකත් කෙලියට ඉතාමත් සමීපයි කියලා හිතුණ නිසා. අනික සිංහල හින්දු අලුත් අවුරුද්දත් අපිට ඇවිත් තියෙන්නේ ඔය නැකත් කෙලියෙන්ම වෙන්නත් බැරි නෑ. මොකද දුරාතීතේ ඉඳලම සිංහල අලුත් අවුරුද්දත් නැකත් කෙලිය කියන නමින්ම හඳුන්වනවනේ.

අනික ඉන්දියාවේ හරප්පා ශිෂ්ටාචාරයට අනුව ජීවත්වුණ උදවියත් එදා මේ විදියේ නැකත් මංගල්‍යයක් පවත්වලා තියෙනවලු. හැබැයි ඒක මීට වඩා ටිකක් වෙනස්. ඒ උදවියට එදා දවසෙදි තමන් කැමති ඕනම ගැහැනියෙක් පිරිමියෙක් එක්ක ලිංගිකව එකතු වෙන්න අවසර තියෙනවලු. ඒ නිසා ඒ උදවිය එදාට සූදානම් කරන කෑම මේසෙට ස්ත්‍රී නිමිත්ත සහ පුරුෂ නිමිත්ත සංකේතවත් වෙන විදියේ කෑමබීම යොදාගත්තලු. එතැනදී ඔවුන් කිරිබත්වලටයි, කෙසෙල් ගෙඩිවලටයි ප්‍රධාන තැනක් දීලා තියෙනවා. කිරිබත් කැටේ ත්‍රිකෝණ හැඩයට කපලා තියෙන්නේ ස්ත්‍රී නිමිත්ත සංකේතවත් කරන්නලු. එතකොට කෙසෙල් ගෙඩිවලින් සංකේතවත් කරලා තියෙන්නේ පුරුෂ නිමිත්තලු. එහෙම බැලුවම අපේ අවුරුදු මේසෙට ත්‍රිකෝණාකාර කිරිබත් කැටයි, කෙසෙල් ගෙඩියි එකතු වුණේ හරප්පා ශිෂ්ටාචාරයෙන් වෙන්නත් බැරි නෑ.

**'නව බග් ලසන්ද් දුක්**
**මිනිස ක් හු නො වජන්'**

ඔය තියන්නේ පස්වැනි සියවසේ තරුණයෙක් කැටපත් පවුරේ ලියලා තියෙන කුරුටු ගීයක්.

මේකේ තේරුම, මම බක් මාසේ නව සඳ බලපු තරුණයෙක්, අනේ සීගිරි ලලනාව මට කැමැත්ත දෙන්න කියන එකලු.

එහෙම බලනකොට අපේ සිංහල අලුත් අවුරුදු නැකත් පත්‍රයේ තියෙන නවසඳ බැලීමේ චාරිත්‍රය පස්වැනි සියවසේ ඉඳලම පැවතගෙන ආපු එකක් කියලත් කෙනෙකුට හිතන්න පුළුවන්. ඒකෙන් පැහැදිලි වෙන්නේ සිංහල අපිටත් මේකට දුර අතීතයේ ඉඳලම නෑකමක් තියෙන විත්තියක්.

ඊළඟට අපි අවුරුදු කෑම මේසේ පැත්තට ටිකක් හැරිලා බලමු. මේ කෑම මේසේ වුණාත් තියෙන්නේ අපිටම ආවේණික වුණ කෑම වර්ග නෙවෙයි. ඒකටත් විවිධ ජාතීන්ගේ කෑමබීම එකතුවෙලා තියෙන බව පැහැදිලිවම පේන්න තියෙනවා. උදාහරණයක් විදියට කේක් කියන්නේ අපිට පෘතුගීසින්ගෙන් ලැබුණු දෙයක්. කොකිස් ලැබිලා තියෙන්නේ පරන්ගීන්ගෙන්ලු. ඔය ටොපි, චොක්ලට්, මාස්මෙලෝස් වගේ කෑම අරන් ඇවිල්ලා තියෙන්නේ ලන්දේසීන් කියලයි කියන්නේ. හැබැයි කැවුම් කියන්නෙනම් අපේ ඇත්තන්ගෙම රසවත් කෑමක්. මොකද දුටුගැමුණු රජතුමා යුද්ධෙට ගිහින් ඇවිත් කකුල්වල ඇතිවුණු තුවාලවලට බෙහෙත් විදියට ගැටගහලා තියෙන්නෙත් කැවුම්ලුනේ. මේ කරුණු කාරණා එකින් එකට සලකලා බලනකොට අද අපි අපේ කියලා සමරන සිංහල හින්දු අලුත් අවුරුද්ද සිංහලයාගෙම සංස්කෘතික උත්සවයක්ද කියලා කතා කරලා බලන්න හිතුණා.

මහාචාර්ය අත්තනායක එම්.හේරත් මහතා ඒ ගැන කිව්වේ මේ වගේ කතාවක්.

ඇත්තටම මට හිතෙන්නේ සිංහල හින්දු අලුත් අවුරුද්ද කියන්නේ සිංහල බෞද්ධ අපිටම ආවේණික වුණ සංස්කෘතික උත්සවයක් නෙවෙයි කියලා. ඒක සියලුම ජාතීන්ට අයත් ලෞකික සංස්කෘතික මංගල්‍යයක් කියලයි මමනම් කියන්නේ. මේකට සිංහල බෞද්ධකම ගෑවිලා තියෙනවානම් ඒක වෙන්නේ නානු ගෑමයි හිසතෙල් ගෑමයි නිසා කියලා මම කියනවා.

හරි, සිංහල අලුත් අවුරුද්ද අපේය කියන තැනින්ම අපි කතාව පටන්ගමුකෝ. අපේ සිංහල ඇත්තෝ තමයි මේක සූර්ය මංල්‍යයය විදියට හඳුන්වන්නේ. හේතුව සිංහල අවුරුදුදට අපි සූර්ය නමස්කාරයට ඒ කිව්වේ ඉර දෙවියන්ට මුල්තැනක් දීලා කටයුතු කරන නිසා.

අනිත් කාරණාව සිරිපා කරුණා කරන්නෙත් උදුවප් පෝයේ ඉඳලා බක් මාසේ පෝය පහුවෙනකල් විතරයි. ඒ විතරක් නෙවෙයි එදා සහ අද උදවිය සිරිපා කරුණා කරන්න ගියේ සූර්ය නමස්කාරයටත් එක්කමයි. එහෙම බැලුවොත් සිංහල අලුත් අවුරුද්ද අපිට අයිති නැති දෙයක් කියලා කාටවත් කියන්න බෑ.

ඊළඟට තව සමහරු කියනවා සිංහල අලුත් අවුරුද්ද අපිට ලැබිලා තියෙන්නේ කාලිංඝ මාඝගෙන් කියලා. ඇත්තටම ඒකට එහෙමයි කියන්න ඉතිහාසයේ අද වෙනකල් කිසිම සාක්ෂියක් ලැබිලා නෑ. සිංහල අවුරුද්දට දෙමළ උදවියගේ පොඩිහරි සම්බන්ධයක් හැදිලා තියෙනවානම් එහෙම වෙලා තියෙන්නේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජ්ජුරුවන්ගේ දෙමළ භාර්යාවොත් අවුරුදු සමරපු නිසා කියලයි ඉතිහාස පොත්පත්වල තියෙන්නේ.

ඒ විතරක් නෙවෙයි ඒ කාලේ පෘතුගීසින් ජාතික සමගිය ඇතිකරවීමේ අරමුණින් සිංහල අලුත් අවුරුද්ද සිංහල දෙමළ අලුත් අවුරුද්ද කියලා වෙනස් කළා කියලත් ඒ පොත්පත්වලම සඳහන්වෙලා තියෙනවා. එතකොට මේක දෙමළ ජාතිකයන්ට අයිති එකක් නෙවෙයි කියලත් තවත් කෙනෙකුට කියන්න බෑ.

ඊළඟට අපි හැරෙමුකෝ කතෝලික උදවියගේ පැත්තට. මම නම් හිතන්නේ අවුරුදු කෑම කියන සංකල්පය අපි වැළඳගෙන තියෙන්නේ ඒ උදවියගෙන් කියලා. මොකද ඒ ඇත්තෝ එදා ඉඳලම නත්තල අර්ථනිරූපණය කරන්නේ 'නත්තල් කෑම' කියලා.

අනික අපේ උදවිය අවුරුද්දදාට අනුභව චාරිත්‍රය ඉෂ්ට කළේ ගෙදරම පොඩියට තේ මේසයක් පිළියෙල කරගෙන. ඒකට එකතු කරගත්තේ බොහොම සරල කැවිලි පෙවිලි ටිකක් විතරයි. හැබැයි පස්සේ කාලෙකදි දවල්ට තේ මේසයක් සූදානම් කළාට රෑට බටහිර පන්නේ කෑම ටික එකතු කරගෙන රාත්‍රී සාද පවත්වන්නත් අපේ ඇත්තෝ පටන්ගත්තා. එහෙම බලනකොට ඔය සාද කෙලිය අපි වැළඳගත්තෙත් කතෝලිකයන්ගෙන් කියලා කියන්න පුළුවන්. මොකද අවුරුදු චාරිත්‍ර ඇරුණම අවුරුදු පාටි කියලා දෙයක් සිංහල අපිට තිබුණේ නෑ.

එහෙම බලනකොට සිංහල අලුත් අවුරුද්දට කතෝලිකයන්ගෙත් යම්කිසි ඥාතීත්වයක් තියෙන්න පුළුවන්.

ඒ වගේම අර කතාවේ මුල කියලා තියෙන හරප්පා ශිෂ්ටාචාරයෙන් ලැබුණු ලිංග නිමිති සංකල්පය නිසා ඒ අයව පැත්තකට කරන්නත් බෑ.

ඉන්දියාවේ නැකත් කෙලියට සමාන සිරිත් විරිත් නිසා ඒ අයව මගඇරලා යන්නත් බෑ.

මේවත් එක්ක බලනකොට මට නම් හිතෙන්නේ සිංහල අලුත් අවුරුද්දට අපි සිංහල බෞද්ධකම එල්ලගෙන තියෙන්නේ පිටින් කියලා. හැබැයි ඉන්දියාවේ නැකත් කෙලියටත්, හරප්පා ශිෂ්ටාචාරවලටත්, දෙමළ සහ කතෝලික උදවියට අනුවත් මේක විනෝදස්වාදයට වෙන්වුණු උත්සවයක් විතරයි. ඒත් අපි සිංහල අලුත් අවුරුද්ද සමරන්නේ ඊට වඩා සංස්කෘතික වටිනාකමක් තියෙන විදියට. අන්න ඒ නිසා මම කියන්නේ මේක අපිට කොහෙන් කොහොම ලැබුණත් ඒකෙන් අපිට ගන්න තියෙන හරය ඇරෙන්න ආගිය තැන් හොය හොය ඉන්න අවශ්‍ය නෑ. මොකද අවුරුද්දට ගෙයක් පිරිසිදු කරනවානම්, නැකතට පන්සලකට ගිහිල්ලා වැඳලා ආශිර්වාද ගන්නවානම්, අවුරුද්දට එක දවසක් හරි ගම්තුලාවට ගිහිල්ලා තමන්ගේ නෑ සනුහරේ බලලා එන්න පුළුවන්නම් ඒකේ හොඳක් මිසක් නරකක් නෑ. ඇත්තම කිව්වොත් බක්මහ කියන්නේ අපේ උදවියගේ අතුපැලේ ඉඳලා මහමන්දිරේ වෙනකල්ම හිතවත්කම් නෑදෑකම් අලුත්වෙන කාලයක්. ඒක නිසා අවසාන වශයෙන් මට කියන්න තියෙන්නේ මෙදා පාර සිංහල හින්දු අලුත් අවුරුද්ද ජාති ආගම් කුල භේද පැත්තකට දාලා සතුටින් සාමදානයෙන් සමරන්න අපි කටයුතු කරමු කියලා.

එහෙනම් එකසිය විස්සට දෙසිය විස්සක් ආවඩා ආයුබෝ වේවා!



# හූනියමකට මිනී ඔළුවක් ඕනෑ කර තිබේ

ගම්බිම් හැරුණුකොට සෑම ප්‍රධාන නගරයකම පාහේ සිංහල බෙහෙත් බඩු කඩයක් දක්නට නොලැබුණොත් ඒ බොහොම කලාතුරකිනි. එවැනි සිංහල බෙහෙත් බඩු කඩවල බොහෝවිට තොවිල් බඩුද අලෙවි කරන බව මා දැක ඇත. තොවිල් බඩු ලෙස හැඳින්වෙන්නේ සත්ව, ශාක සහ පාෂාණ කොටස්ය. සිංහල බෙහෙත් බඩුවලට සාපේක්ෂව මේවා තරමක් මිලෙන් වැඩිය. එසේම මෙම තොවිල් බඩු අතරට පොල් මල්, පුවක් මල්, අළු පුහුල්, එක නැට්ටේ දෙහි, අගිල්, දේවදාර, කස්තුරි, කුංකුමප්පු, සැවැන්දරා, නෙළුම් රේණු, මොනර කුඩුම්බිය, සුදු ඊතණ, සුවඳ කොට්ටං, කඩොල්, හබරල, අළු කෙසෙල්, සාම්බ්‍රානි, ගෙන්දගම්, අමු හිරියල්, අමු රත්‍රන්, ගව හිස්කබල්, බඹර, දෙබර, දඬුවැල් බෑ, කණා මීවද ඇතුළු මෙකී නොකී බොහෝ දේ ඇතුළත්ය. ඊට අමතරව මෙම තොවිල් බඩු අතරේ හූනියම් බඩු වශයෙන් හැඳින්වෙන තවත් කොටසක්ද තිබේ. ඒවා තොවිල් බඩුවලටත් වඩා මිලෙන් වැඩිය. ඒවාද සත්ව, ශාක සහ පාෂාණ කොටස් වන අතර සොයාගැනීමට ඇති දුෂ්කරතාවය නිසා සහ ඇතැම් භාණ්ඩ ළඟ තබාගැනීමට නීතිමය වශයෙන් ඇති බාධා නිසා මෙසේ ඉහළ මිලකට අලෙවි කරනු ලබයි.

ක්‍රි.ව.1521 සිට 1592 තෙක් පැවැති සීතාවක රාජධානිය සහ ඒ අවට ප්‍රදේශවල අදටත් මෙම තොවිල් බඩු අලෙවි කරන වෙළඳසැල් වැඩි ප්‍රමාණයක් දක්නට ලැබේ. ඒ සීතාවක රාජධානියට ඉන්දියාවෙන් පැමිණි යකැදුරන් අප රට තුළ ව්‍යාප්ත කරන ලද යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් අනවින හදි හූනියම් නිසා බවයි මගේනම් විශ්වාසය. එමෙන්ම වත්මනේ අප හෝමාගම ලෙසින් හඳුන්වන ප්‍රදේශය, සීතාවක යුගයේ යාගහෝම කළ බමුණන් ජීවත් වූ ගම්වරයක් බවටත්, ඊට මදක් නොදුරින් පිහිටි පිළියන්දල එම යුගයේ විවිධ බිලි පූජා පැවැත්වූ දෙළක නාමයක් (බිලි+කම්+දෙළ) විපරීත වීමෙන් හටගත් එකක් බවටත් පොදු පිළිගැනීමක් තිබේ.

මේ හූනියම් බඩු අතරේ බෙහෙත්, තොවිල් සහ හූනියම් යන කටයුතු තුන සඳහාම යොදාගන්නා ශාකද තිබේ. බෙහෙත් බඩුවක් ලෙස ප්‍රකට අහු ශාකයේ ගෙඩි, හූනියම් කිරීමට සේම හූනියම් කැපීමටද යොදාගන්නා බව පැවසෙයි.

නමුදු ඇතැමුන් යක් නිවිති ලෙස හඳුන්වන රතු පැහැති දණ්ඩක් සහිත නිවිති බොහෝවිට යොදාගන්නේ කාන්තාවන් හට කිලි මාලය, ලේ මාලය යන රෝග උපද්‍රව ඇතිකරවන හූනියමකටය. මෙහිදී ලේ මාලය යනු මාස් ශුද්ධියේදී අධික රුධිර ප්‍රමාණයක් පිටවන Menorrhagia නම් රෝග තත්ත්වය වන අතර කිලි මාලය යනු අක්‍රමවත් මාස් ශුද්ධිය හෙවත් Metrorrhagia නම් රෝග තත්ත්වයයි.

රතු, කහ, සුදු යන පාට තුනෙන් නූල් හත්පොට බැගින් රැගෙන එක්තරා මන්ත්‍රයකින් මතුරා එය යක් නිවිති හෙවත් රතු නිවිති දණ්ඩක ඔතා වතුර ගලායන වක්කඩක් වැනි තැනක දිය යට සැඟවීමෙන් මෙම ගුරුකම සිදුකරනු ලබයි. එවිට ඒ රතු නිවිති අත්ත දිය යට තිබෙන තාක්කල් ඒ කාන්තාව ලේ මාලයට හෝ කිලි මාලයට ගොදුරු වන බවයි විශ්වාසය. ඒ හේතුව නිසාම පහසුවෙන් වගා කළ හැකි ඉතා පෝෂ්‍යදායී භෝගයක් වන මෙම රතු නිවිති පරිභෝජනය සඳහා ගැනීමට බොහෝදෙනෙකු මැළිකමක් දක්වයි. නමුත් ඉන්දියාවේ සමහර ප්‍රදේශවල රතු නිවිති ආහාරයක් වශයෙන් අතිශය ජනප්‍රියය. අපේ රටේ ඒ සම්බන්ධයෙන් පවතින හුඹස් බිය විනා ඒවා නිතර දෙවේලේ ආහාරයට ගන්නා කාන්තාවන්ට ඔය කියන්නාවූ මොන 'මාලයක්'වත් නොමැති බවනම් පෙනෙන්නට තිබේ.

**වසර විස්සකට පමණ පෙර මම එසේ ව්‍යාජව සකස් කරගත් හූනියම් බඩු ලැයිස්තුවක් රැගෙන මහරගම නගරයේ සිංහල බෙහෙත් බඩු වෙළඳසැලකට ගොඩවුණෙමි. එය උඩින් පල්ලෙන් කියැවූ එහි භාණ්ඩ අලෙවි කළ තැනැත්තා බඩු විකිණීම වෙනුවට මුලින්ම මගේ හිසේ සිට පාදාන්තය තෙක් විමසුම්සහගත බැල්මක් හෙළුවේය**

හූනියමක් කරන්නට යද්දී මුලින්ම හූනියම කරගැනීමට අපේක්ෂා කරන පුද්ගලයා ඇදුරෙකු සොයා තම අවශ්‍යතාව පැවසිය යුතුය. එහිදී දැරිය යුතු සම්පූර්ණ වියදම සේම හූනියම කරන්නා විසින් කළ යුතු කටයුතු සම්බන්ධයෙන්ද ඇදුරා ඔහුව දැනුවත් කරනු ලබයි. මගේ වැටහීමේ හැටියටනම් හූනියමක් සඳහා යන මුළු වියදම රුපියල් ලක්ෂ හත අටක්වත් වෙයි. හූනියමට අවශ්‍ය බඩු ලැයිස්තුව ලිවීමේදී ඒවා 'විශ්වාසවන්ත ලෙස' මිලට ගත යුතු ස්ථානයක්ද සඳහන් කිරීමද ඇදුරාගේ සිරිතය.

මීට වසර විස්සකට පමණ පෙර මම එසේ ව්‍යාජව සකස් කරගත් හූනියම් බඩු ලැයිස්තුවක් රැගෙන මහරගම නගරයේ සිංහල බෙහෙත් බඩු වෙළඳසැලකට ගොඩවුණෙමි. එය උඩින් පල්ලෙන් කියැවූ එහි භාණ්ඩ අලෙවි කළ තැනැත්තා එම බඩු විකිණීම වෙනුවට මුලින්ම මගේ හිසේ සිට පාදාන්තය තෙක් විමසුම්සහගත බැල්මක් හෙළුවේය. ඉන්පසු "කවුද මේක දුන්නේ?" යනුවෙන් ප්‍රශ්න කළේය. එවිට මම ගත්කටටම කීවේ "ඕක මගේ නෙවෙයි මගේ යාළුවෙකුගේ" යන්නයි. ඉන්පසු **"එහෙම බෑ මට මේක ලියපු කෙනාගේ ෆෝන් නම්බරේවත් ඕනේ"** යනුවෙන් පැවසූ වෙළෙන්ද එම තුණ්ඩුව නැවත මගේ අතට දිගු කළේය.

සාමාන්‍යයෙන් මෙහිදී සිදුවන්නේ විශ්වාසවන්ත ඇදුරෙකු විසින් ලියාදුන් හූනියම් බඩු ලැයිස්තුව පිරික්සන වෙළඳසැල් හිමියා ඒ මොහොතේම ලබාදිය හැකි බඩු මුලින් ලබාදීමයි. ඉන්පසු එම ලැයිස්තුව අවසානයේ සංකේතාත්මකව ලියා ඇති යමක් පෙන්වා **"දන්නවනේ මේ මොකක්ද කියලා?"** ආදී වශයෙන් අසා එහි ඇති දුර්ලභ බව පිළිබඳව ඉඟි කරයි. බොහෝවිට මෙසේ ඉඟි කරන්නේ මිනිස් හිස්කබලක් හෝ අඳුන් දිවි සමක් වැනි සන්තකයේ තබාගැනීම සපුරා නීතිවිරෝධී දෙයක් සම්බන්ධයෙන් බව ඒ වනවිට හූනියම කරන්නා ඇදුරා වෙතින් දැනුවත් වී ඇත.

එවැනි බොහෝ අවස්ථාවල **"කෝකටත් පොඩ්ඩක් ඉන්නකෝ බලන්න"** කියා බෙහෙත් බඩු අලෙවිසැල් හිමියා කිසිවකුට දුරකතන ඇමතුමක් දෙයි. ඉනුත් විනාඩි කිහිපයකට පසුව කිසියම් පුද්ගලයෙකු එම වෙළඳසැලට ගොඩවැදෙයි. ඒ අනුව දින කිහිපයකට පසු එම මිනිස් හිස්කබල හෝ අඳුන් දිවි සම අප්‍රකට ස්ථානයකදී හූනියම කරවන්නාට පෙන්වා රුපියල් ලක්ෂ පහක පමණ මිලක් එවෙලේම ලබාගැනීම සිදුවේ. මෙහිදී එම නීතිවිරෝධී භාණ්ඩ, හූනියම කරවන්නා අතට පත් නොකර සැපයුම්කරු පවසනුයේ එය රහසිගතවම ඇදුරා වෙතට පත් කරවන බවකි. ඒ අනුව මෙසේ හූනියම් කරවන්නවුන් විශාල පිරිසක් හමුවේ ප්‍රදර්ශනය කරමින් රුපියල් ලක්ෂ ගණනින් මුදල් කඩා වඩාගන්නේ එකම මිනිස් හිස්කබලක් හෝ අඳුන් දිවි සමක් විය යුතුය යන්න මගේ පෞද්ගලික අනුමානයයි.

නමුත් මෙම සංසිද්ධිය ඉහත සඳහන් ප්‍රදේශවල ඇති සියලුම සිංහල බෙහෙත් බඩු හා තොවිල් බඩු අලෙවිහල්වල සිදුවන බවට කිසිඳු සාක්ෂියක් නොමැති බවද විශේෂයෙන් අවධාරණය කළ යුතුය.



මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**


වරම් වරම් සතොස වරම්
අවුරුද්දට තෑගි වරම්...
මේ සිංහල දෙමළ
අලුත් අවුරුද්ද වෙනුවෙන්
උත්සව සමය සතුටින් ගෙවන්නට
ලංකා සතොස
අවුරුදු වරම
ලංකා සතොස
අවුරුදු වරම
ජංගම දුරකථන 100 ක්
GIFT VOUCHER
පැයකට වරක් ගිෆ්ට් වවුචර්
රුපියල් මිලියන 05ක් වටිනා රන් කාසි
රුපියල් මිලියනයක ත්‍යාගයක්
රුපියල් ලක්ෂයේ තෑගි 55ක්
මේ අවුරුදු සමය සතුටින් ඉන්න
ඔබත් ලගම ඇති ලංකා සතොසට එන්න...
අපේ රටේ අපේම තැන
ලංකා සතොස
LANKA SATHOSA | லங்கா சதொச



# මුලදී නෝක්කාඩු කිව්වට දැන් ගෙදර අයත් මට උදව් කරනවා

මෙරටදී උපාධියක් හිමිකරගත් තරුණියක් පිටරටට කැවුම් විකුණන ව්‍යාපාරයක් පටන්ගත් බව කියැවෙන ලිපියක් පසුගිය දිනෙක පත්තර පිටුවක පළ වී තිබිණි. නමුත් ඒ ලිපිය කියවූවන්ගෙන් කැවුම් බදින උපාධිධාරිනියට ගුණ වැනුම් වෙනුවට වැඩිමනක් ලැබී තිබුණේ ඇනුම් බැනුම්ය. කෙසේනමුත් ඒ කතාවලට නොසෙල්වුණු ඈ මේ වනවිට රටවල් ගණනාවකට කැවිලි අපනයනය කරන මහා පරිමාණ ව්‍යාපාරිකාවක් බවට පත්ව ඇත.

උපාධියක දැනුම අරන් එවැනි අත්හදාබැලීම් කරන එවැනි නිර්මාණශීලී ව්‍යවසායිකාවන් අපේ රටේ තවත් නැතුවාම නොවේ. මේ කියන්නට යන ඔසිකාගේ කතාවද ඊට උදාහරණයකි.

දිනක් ගලවා දැමූ දොර පියනක් නිවසේ මුල්ලක තිබෙනු දුටු ඔසිකාට අලුත් අදහසක් පහළ වී තිබේ. ඒ අදහස අනුවයි ඈ එහි කොටසක් කපා, තීන්තෙන් නෙළුම් මල් දෙකක් සිතුවම්කොට, ඒ මැදට 'නමෝ බුද්ධාය' යන වැකිය එක්කළේ. මුදල් ඉපයීමේ අරමුණකින් නොකළත් නමෝ විත්තියෙන් ඇඳි එම සිතුවම ඔසිකාව අලුත් බලාපොරොත්තුවක් වෙත රැගෙන ගියාය. ඒ නිවසට ආ අයෙක් ඇගේ එම සිතුවම දැක රුපියල් දෙදහසක මුදලට එය මිලදීගෙන යාමත් සමඟිනි.

**"ඔය සිදුවීම වුණේ 2020 අවුරුද්දෙ. ඒ කාලය වෙද්දි මම මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් කජුගම මධ්‍යස්ථානයෙන් අවුරුදු දෙකක චිත්‍ර හා මූර්ති පාඨමාලාවක් හදාරලයි හිටියේ. මූර්ති පැත්තෙන් ගැහැනු කෙනෙකුට ඉදිරියට යන්න ටිකක් අමාරු නිසා මම ලී වල චිත්‍ර ඇඳලා බැලුවා. එහෙම ඇඳපු දොර ලෑලි චිත්‍රයට ඇගයීමක් ලැබුණට පස්සේ මම කල්පනා කළා තවත් සිතුවමක් කරන්න. කොහොමද ඒ සිතුවම කරන්නේ කියලා ඊළඟට මම කල්පනා කරමින් ඉඳිද්දී දවසක් දැක්කා කෙනෙක් මහෝගනී ප්ලේට් (තැටි) හදලා විකුණනවා. මට අදහසක් ආවා ඒ වගේ පිඟානක සිතුවමක් ඇඳලා බලන්න."**

ඉන්පසු මහෝගනී තැටිවල සිතුවම් ඇඳි ඈ එම නිර්මාණ ප්‍රදර්ශනය සඳහා මුහුණුපොතේ ඉඩක් වෙන් කරගත්තාය.

"ඇත්තටම එහෙම දැම්මට මුල් කාලේ ඒකට කවුරුත් ලයික් එකක්වත් දලා තිබුණේ නැහැ. ඔය විදියට අවුරුද්දක් විතර ගෙවෙද්දී පේජ් එකට මැසේජ් එකක් ඇවිත් තිබුණා ඒ නිර්මාණය ගන්න කැමති කෙනෙක්ගෙන්. ඊටපස්සේ තමයි මම දිගටම මහෝගනී පිඟන් මත සිතුවම් අඳින්න පටන්ගත්තේ."

ඒ ඔසිකා තත්සරණී ය. ඇය උපන්නේ ගම්පහ මීරිගම ය. දියණියන් තිදෙනෙකුගෙන් යුත් පවුලේ දෙවැනියා ඔසිකායි. එමෙන්ම පවුලෙන් චිත්‍ර කලාවට හිතගිය දියණියද ඇයයි. කැලණිය විශ්වවිද්‍යාලයේ කලා උපාධිධාරිනියක වන ඇය චිත්‍ර කලාවද උපාධි විෂයක් ලෙස තෝරාගත්තාය. පුංචිම සන්දියේත් පාට කෑල්ලක් අහුවුණොත් මොනවා හෝ ඇඳීම ඔසිකාගේ පුරුද්දය. ඈ ඇඳි චිත්‍රවල අපූරු හැඩතල ඇතැයි ගුරුවරුන්ගේ පැසසුම් ලැබෙද්දී ඕ සාමාන්‍ය පෙළටත්, උසස් පෙළටත් විෂයයක් ලෙස තෝරාගත්තේ චිත්‍රය.

"මම ගෙදර ඉන්නවානම් ඉතින් වැඩේම චිත්‍ර අඳින එක තමයි. පළමු මහෝගනී ප්ලේට් එක විකුණලා ලැබුණු ප්‍රතිචාර එක්ක තවත් ප්ලේට් දහයක් අරගෙන ආවා. ඇත්තටම මම නුවර යුගයේ චිත්‍ර වගේම දළඳා මාලිගාවේ වියන් සැරසිලි චිත්‍ර අධ්‍යනය කරලා මම මගේ විදියට මේ සිතුවම් නිර්මාණය කරනවා. වර්ණ ගැලපීම කරනවා. පසුගිය කොරෝනා කාලේ මම ඊට වැඩිපුර මහන්සි වුණා. මුහුණුපොතේ මුලදි ලයික් එකක්වත් නැති වුණාට, පස්සේ සිතුවම් දහය විසිපහ වගේ අලෙවි වෙන්න පටන්ගත්තා. මට මතකයි මුල් කාලේ ස්වාමීන් වහන්සේ නමක් ඉන් විසිපහක් මිලට ගත්තා. උන්වහන්සේ එම සිතුවම් මිලදීගෙන තිබුණේ දන්න කියන පිරිසකට පරිත්‍යාග කරන්න. මහෝගනී ප්ලේට් එකක් මම මිලට ගන්නේ රුපියල් හත් සියයක් වගේ මුදලකට. තීන්තවලට යන වියදමත් එක්ක බලලා මම මේ එක නිර්මාණයක් අලෙවි කරන්නේ රුපියල් හාරදහසකටයි. ඒ අනුව අද මම රුපියල් පනස් දහසක විතර මාසික ආදායමක් ලබනවා."

උදෑසනම වැඩ පටන්ගන්නා ඇයට, මේ වනවිට ලැබෙන ඇණවුම් සියල්ල භාරගන්නට නොහැකි තරමට කාර්යබහුල බවද ඇය කීවාය. වයස අවුරුදු තුනේ කුඩා දියණියද රැකබලාගනිමින් ස්වෝත්සාහයෙන් කරගෙන යන මෙම කටයුත්ත තවත් දියුණු කරගැනීමට ඇය කැමතිය.

**"මගේ මහත්තයා රජයේ රැකියාවක නියැලුණත් මම රජයේ රැකියාවක් කරන්න ඕන කියලා හිතලා නැහැ. ඇත්තටම තමන්ගේ හැකියාවෙන් කරගෙන යන මෙවැනි කාර්යයක් උත්සාහයෙන් දියුණු වෙන්න හිතන කෙනෙකුට මෙය ලොකු දෙයක් කියලා මම හිතනවා. ඇත්තටම උපාධියක් තියාගෙන ඕක කරලා හරියනවද කියලා කෙනෙකුට හිතෙන්න පුළුවන්. මුලදි චිත්‍ර අඳිනකොට ගෙදර අයත් මට නෝක්කාඩු කියලා තියෙනවා නිතරම අඳින එකමයි වෙන වැඩක් නෑ කියලා. ඒත් අද අම්මා, තාත්තා වගේම පවුලේ හැමෝම මට උදව් කරනවා."**

ඔසිකා කියන්නේ ඕනෑම ගමනක කටුකකම් අත්විඳින තරමට කෙනෙකුගේ ගමන්මග ශක්තිමත් වන බවයි. අද දේශීය මෙන්ම, විදේශීය රටවල ගැණුම්කරුවන්ගෙන්ද ඇයගේ අලංකාර ලී තැටි සිතුවම්වලට ඉල්ලුමක් ඇතිව තිබේ.



"මම මේ ව්‍යාපාරය කරගෙන යන්නේ ඔන්ලයින් ක්‍රමයට නිසා, විදෙස් රටවල ඉන්න අයගෙන් පවා ඇණවුම් ලැබෙනවා. සමහර දවස්වල එකදිගටම වැඩ කරන්න වෙන අවස්ථාවල් තියෙනවා. මම කැමතියි මෙම චිත්‍ර කලාව ගැන හැදෑරීමක් ඇති, දක්ෂ කාන්තාවක් ඉන්නවානම් මේ කාර්යයට සම්බන්ධ කරගන්න. ගොඩක් වෙලාවට ගැහැනු ළමයි මූර්ති කලාව හා චිත්‍ර කලාවට යොමුවෙන්නේ අඩුවෙන්. ඒ ගැන ඉගෙනගත්තත්, ඒ කලාව හා රැඳෙන පිරිස අඩුයි. මට මතකයි මම මධ්‍යම සංස්කෘතික අරමුදලේ මෙම පාඨමාලාව හදාරන කාලෙ පිරිමි ළමයි දහතරදෙනෙක් ඒ පාඨමාලාව හදාරද්දි ගැහැනු ළමයි තුන්දෙනයි මේ පාඨමාලාව හැදෑරුවේ. ඒ අය අතරිනුත් කිහිපදෙනෙක් පන්සල් චිත්‍ර නිර්මාණය වගේ කටයුතුවලට දායක වෙනවා. ගැහැනු ළමයි වෙනත් රැකියාවල නිරත වෙනවා. මම කියන්නේ මේ කලාව තුළින් අපිට යමක් අපේම විදියට හිතලා කරන්න පුළුවන්නම් ආර්ථික වශයෙන් අපට සතුටුදායක තැනකට එන්න පුළුවන්කම තියෙනවා."

ඔසිකා එම ගමන් මාවත සාදාගත්තේ දිනකින් දෙකකින් නොවේ. එහෙත් දැන් මහෝගනී ලී තැටි මත ඇය දන හැඩවැඩ බොහෝදෙනෙකුගේ නෙත් සිත් පැහැරගෙනය. තවත් වෙහෙස වී එම ව්‍යාපාරය දියුණු කරගැනීම ඇයගේ ඉදිරි බලාපොරොත්තුවයි.



**රජයේ රැකියාවකට යනවට වඩා මේ සිතුවම් කලාව දියුණු කරගන්න මම කැමතියි**

■ දීපා වසන්ති එදිරිසිංහ


Vanitha Vasana
30th
ANNIVERSARY
හෙට ලොවට මං සදන
අසම සම ඇයට
ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන්
වනිතා වාසනා HIGH INTEREST
ඉතුරුම් ගිණුම සඳහා
12% දක්වා අසම සම පොලියක්
වනිතා වාසනා
money planner
ආයෝජන සැලසුම
වනිතා වාසනා
Branded
Debit Card
සඳහා සුවිශේෂී
වට්ටම්
ඔබ සිදුකරන තැන්පතු සඳහා
සුවිශේෂී ත්‍යාග
තොග අවසන් වනතුරු පමණයි
කොන්දේසි සහිතයි
රු.100,000/- ට
වැඩි තැන්පතු සඳහා
රු.500,000/- ට
වැඩි තැන්පතු සඳහා
රු.300,000/- ට වැඩි
තැන්පතු සඳහා
සෑම පුංචි සීට්ටුවකටම
ලස්සන Pouch එකක්
මහජන බැංකුවේ පවතින සියලුම තැන්පතු, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ ආවරණය කර ඇත.
www.peoplesbank.lk
1961 PEOPLE'S BANK CALL CENTRE
PEOPLE'S BANK
Pride of the Nation
A (lka) Fitch ශ්‍රේණිගත කිරීම AAA- සන්නාම මූල්‍ය ශ්‍රේණිගත කිරීම
මහජන බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.



අත්තනායක
එම්. හේරත්

රත්තරන් දුවේ

# ලීක් වෙච්ච ෆොටෝ එක ගැන මිස මගේ දක්ෂතා ගැන ඉස්කෝලෙ රැස්වීමේ කතා කළේ නෑ සර්

මම මේ කියන්නේ ලංකාවේ ඉතාම ජනප්‍රිය පාසලක් ගැන කතාවක්. එහි සිංහල ගුරුවරයා වුණේ මෑතකදී විශ්විද්‍යාලයෙන් පිටවුණු තරුණ ගුරුවරයෙක්. ඔහු විෂය නිර්දේශය විනිවිද ජීවිතය දකින්නට වෑයම් කරපු ගුරුවරයෙක් කිව්වොත් හරි. සරසවියෙන් ඇවිල්ලා ඉස්කෝලෙට ඇතුළුවෙච්ච ගමන් මේ ගුරුතුමාට උගන්වන්න ලැබුණේ නවය වසරේ සිංහල පොත. ඒ පොතේ අටවන පාඩමේ නම තමයි 'මහාධන සිටුපුත්හුගේ වස්තුව. එක්තරා කෝටිපති සිටුවරයෙක් තම පුතාට සංගීතය, ගීතය, නැටුම් පමණක් ඉගැන්වූ කතා පුවතක් ගැන තමයි ඒ පාඩමේ තිබුණේ. ඊට වඩා කිසිදෙයක් මේ තරුණ සිටු කුමාරයාට තිබුණේ නෑ. ඒ පළාතෙම තවත් සිටුවරයෙක්ට දුවෙක් හිටියා. එයාට ලැබුණෙත් ඒ වගේම අධ්‍යාපනයක්. ඉතින් දුවේ ඒ අයගේ දෙමාපියෝ මේ දෙන්නා විවාහ කරලා දීලා මියගියා. කිසිම මහන්සියකින් තොරව ලැබිච්ච ධනයක් හින්ද මේ දෙන්නට දෙමව්පියන්ගෙන් ලැබුණු දේපළ ගැන වැඩි දැනීමක් තිබුණේ නැහැ.

මෙහෙම යන අතරේ මහාධන සිටුපුත්‍රයා සිංදු කියන කණ්ඩායමක මත්පැන් බොන රංචුවකට එකතු වුණා. එයාගේ බිරිඳත් ඒ රංචුවටම එකතු වුණා. එයා කියන කරන දේම මෙයත් කළා. දෙන්නා මේ සංගීත සුරා කල්ලියට එකතුවෙලා මුදල් වියදම් කරලා ටික ටික දුප්පත් වේගෙන ආවා. අන්තිමට ගෙවල් දොරවල් විකුණලා දෙන්නා හිඟමනට වැටුණා. මේ දෙන්නා හිඟාකනවා බුදු හාමුදුරුවෝ දැක්කා. දැකලා සංගීතය, කලාව, නැටුම විතරක් දැනගෙන උන්නු ඒ දෙන්නා මත්පැනට ගොදුරුවෙලා හිඟන්නෝ වෙච්චි හැටි බුදු හාමුදුරුවෝ අනෙක් හාමුදුරුවන්ට කියලා දුන්නා. සද්ධර්මරත්නාවලිය පොතේ 138 වෙනි කතා වස්තුව තමයි සිංහල නවය පොතට දලා තිබුණේ.

අර මං කලින් කිව්ව සිංහල ගුරුවරයා මේ කතාව තමන්ගේ පාසලේ දරුවන්ට කියලා දුන්නා. ඉගෙනීම කියන්නේ නටන, ගයන එක විතරක් නෙවෙයි කියලා ඒ ගුරුතුමා පංතියෙන් ගියා. කාටවත් මේ කතාවේ යටිපෙළ අර්ථය තේරුණේ නැහැ. හැබැයි මේ පංතියේ හිටියා 'සුධර්මා' කියලා දුවෙක්. ඒ දුවට මේ කතාව ටිකක් හිතට කාවැදුණා. සුධර්මා කියන්නේ ඉස්කෝලේ දක්ෂම ගායිකාව, නැට්ටුක්කාරි සහ දක්ෂ කථිකාව. ඉතින් ඒ දුවට විතරක් තේරුණා මේ සර්ගේ කතාව තමන්ට හොඳට ගැළපෙනවා කියලා. එද ඉඳලා ඒ දුව මේ ගුරුතුමාගේ සිංහල පංතිය මගහැරියේ නැහැ. ඒත් තමන් වැටිලා තියෙන්නෙත් ඒ මහාධන සිටුපුතාගේ දුවගේ තත්ත්වෙටම කියලා විතරක් ඇයට වැටහුණා. ඉස්කෝලෙ විෂයානුබද්ධ වැඩ ඇයත් මගහැරියා. විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි වැනි ජීවිතයට ආර්ථිකයට වාසි ඇති කිසිදේකට එයාගේ හිත ඇදිලා ගියේ නැහැ. ඒ විෂයයන්වල ඇය අදක්ෂම ශිෂ්‍යාවක්. ඒත් පළාතෙම ඇය ප්‍රසිද්ධ වුණා නැටුමට, ගැයුමට, කතාවට.

අන්තිමට සුධර්මා තමන්ගේ පශ්චාත්තාපය ගැන විස්තර ලියලා සිංහල ගුරුවරයාට අතටම දෙන්න පටන්ගත්තා. ඒ දුව තම ජීවිත කතාව ගැන ලිව්ව සේරම දේ ඒ සර් සුරැකිව තියාගත්තා. අවශ්‍ය අවවාද දුවට දුන්නා. ඇගේ විශ්වාසම ගුරුතුමා වුණේ ඒ සර්.

මේ කියන අවදියේ වෙනත් ඉස්කෝලෙක පිරිමි ළමයෙක් එක්ක මේ දුව යාළු වුණා. නිතර නිතර හමුවුණා. ඒ දුවගේ අම්මා තාත්තා ගෙන්වලා ඒ අයට මේ දරුවා ගැන සර්ට හිතුණා කියන්න. ඒත් සර් ඒක කළේ නැහැ. ඒකට හේතුව ඒ දුව සර්ට ලිව්ව ලිපියේ තිබුණා ඒ අම්මයි තාත්තයි විරසකයි. අම්මට තාත්තව පේන්න බැහැ. තාත්තට අම්මා පේන්න බැහැ කියලා. සුධර්මාට හිටියේ නංගියෙක් විතරයි. ඉතින් සර්ට තේරුණා මේ ජෝඩුවට මේ දරුවගෙ දේවල් කියලා වැඩක් නැහැ කියලා. සුධර්මා සංගීතයට, නැටුමට, කතාවට ඇදිලා ගියෙත් ජීවිතයේ පාලුව මකාගන්න. ආදරය කියලා එකක් ගෙදර තිබුණෙ නැහැ. ඉතින් ඇයට ගෙදරින් නොලැබෙන ප්‍රේමය එයා හෙව්වේ ඒ පිරිමි ළමයාගෙන්. ඒ පිරිමි ළමයා කළේ ආදරයක්ද වංචාවක්ද කියලා මේ දුව දැනගෙන හිටියේ නැහැ.



අධ්‍යාපනයට යොමුවෙන්න තිබුණ කාලය එයා ගතකළේ අර කොල්ලා එක්ක රවුම් ගහන්න. එපා කියන්න අම්මෙක් අප්පෙක් හිටියෙ නෑ. ඉතින් මේ දුව හැමදම අර පිරිමි ළමයා එක්ක එහේ මෙහේ ගියා. පුංචි ළමයින්ට කාමර විකුණන හොටෙල්කාරයෝ කාමරෙත් විකුණලා ඒ දෙන්නා හෝටලේට එන යන ඡායාරූපයකුත් ගහගත්තා. ඊටපස්සේ ජංගම දුරකතන අතරේ ඒක හුවමාරු වුණා. මේ රහස විදුහල්පතිතුමා ළඟට ආවේ ඔය විදියට. ඒත් මේ ප්‍රශ්නේ දිහා මැදහත්ව බලන්න විදුහල්පතිතුමාට බැරි වුණා. මොකද ඒ වනවිට මේ රහස ළමයි දැනගෙන ඉවරයි. විදුහල්පතිතුමා දෙමව්පියන් කැඳෙව්වත් ආවේ නැහැ. සුධර්මා හින්ද ඉස්කෝලෙට සිදුවෙන කැළල බරපතළයි. දෙමාපියෝ විදුහල්පතිතුමාට බැන්නා. දවසක් උදේ පාසලේ රැස්වීමේදී විදුහල්පතිතුමා මේ ගැන කතාකළා. අධ්‍යාපනයෙයි විනයෙයි තියෙන සබඳතාව එතුමා පැහැදිලි කළා. නම සඳහන් නොකළට කවුරුත් දැනගත්තා මේ කියන්නේ සුධර්මා ගැන බව. රැස්වීමේ හිටපු සුධර්මටත් ඒක තේරුණා. විදුහල්පතිතුමා කතා කරගෙන යද්දි සුධර්මට සිංහල සර් කියලා දුන්න කාව්‍යශේකරයේ කවි පේළි දෙක මතක් වුණා.

**'අස බමුණ ගම්වැසී**
**මග රැඳුණ අද තෝ නසී**
**ගෙට ගිය අඹුව නසී**
**අතුරුදන් විය කියා මේ ලෙසී'**

ගුරු මණ්ඩලයේ හැම මුහුණකම තිබුණේ ජයග්‍රාහී හැඟීමක්. "හොඳ වැඩේ ඕකිට වුණේ." ඒත් සුධර්මා සිංහල සර් දිහා බැලුවා. සර් විතරක් බිම බලාගෙන හිටියා. සුධර්මා ඉස්කෝලේ ඇරිලා සිංහල සර් ළඟට ගියා. "සර් මං යනවා." සර් සුධර්මගේ ඔළුව අත ගාලා කිව්වා, "දුවේ කලබල වෙන්න එපා. අපි මේකට මූණදෙමු." කියලා.

ඒ සුධර්මා ඉස්කෝලෙන් එළියට බැස්ස අන්තිම මොහොත. ආයේ සුධර්මා ඉස්කෝලේ ආවේ නැහැ. ඈ යන්නම ගියා. සුධර්මා ගේ මැද සාලේ ලණුවකින් එල්ලිලා මැරිලා තිබුණා. ඇය අවසාන ලිපිය ලියලා තිබුණේ එයාගේ සිංහල සර්ට.

'සර්, මං ඉස්කෝලෙට ජාතික සම්මාන ගෙනාවා නැටුම්, ගැයුම්, වැයුම්වලින්. කවදවත් ප්‍රින්සිපල් සර් ඒවා ප්‍රසිද්ධියේ අගය කළේ නැහැ. ශිෂ්‍යත්වේ පාස් අය A9ක් ගත්ත අයගේ රූප බැනර්වල එල්ලුවා. මං විෂය පරිබාහිර කටයුතුවලින් ලංකාවෙම අංක එක. ඒත් කවුරුත් ඒ ගැන කතාකළේ නැහැ සර්. මට හිටියේ සර් විතරයි. මං යනවා සර්.'

> **අර ලිපිය ඇගේ මේසය උඩ තියලා තිබ්බා. අධ්‍යාපන අමාත්‍යංශය විදුහල්පතිතුමාගේ වැඩ කළා. ඇගේ මළගෙදරට ගියේ සිංහල සර් විතරයි**

මේ ලිපිය ඊට පහුවද ලංකාව පුරාම පැතිරුණා. ඇගේ රහස් රැකගෙන ඇයව බේරගන්න හිටියෙ සිංහල සර් විතරයි. ඇගේ එක රහසක්වත් සිංහල සර් කාටවත් දුන්නෙ නැහැ. අර ලිපිය ඇගේ මේසය උඩ තියලා තිබ්බා. අධ්‍යාපන අමාත්‍යංශය විදුහල්පතිතුමාගේ වැඩ තහනම් කළා. ඇගේ මළගෙදරට ගියේ සිංහල සර් විතරයි. අම්මලා තාත්තලා ඉඩම්, ගෙවල් දොරවල් විකුණලා යන්න ගියා. ඉඩම ගත්ත අය ඒ ගෙදර කඩලා බිඳලා දැම්මා. තාම ඒ ගෙදර තිබ්බ තැන විතරයි කාටත් මතක.

කවුද මේකට වැරදිකාරයෝ? මං හිතන්නේ දුවේ අම්මයි තාත්තයි අංක එක. දරුවෝ වැදුවට වැඩක් නැහැ හදන්නේ නැත්නම්. එල්ලිලා මැරෙන්න තිබ්බෙ තමන්ගේ ප්‍රශ්න ලොකු කරගත්ත අම්මයි තාත්තයි. සිංහල සර්ට තිබ්බ ඉව ගුරු මණ්ඩලයේ අනෙක් අයට තිබ්බෙ නැහැ. විදුහල්පතිතුමා කරපු එකම වරද ඇය ජයගත් තරඟවල ජයග්‍රහණ ප්‍රසිද්ධියේ අගය නොකිරීම. නැටුම්, ගැයුම්, ක්‍රීඩා, සාහිතය තරඟ අංක එක වීම ඒ තරම් නොවැදගත්නම් ඒවා විෂය පරිභාහිර ක්‍රියා ලෙස නම්කර තිබීමෙන් ඇති වැඩේ මොකටද?

මහාධන සිටුපුත්හුගේ වස්තුව ලිව්වේ ධර්මසේන හාමුදුරුවෝ. බලන්න ඒ කතාව අදටත් ගැළපෙන අපූරුව.

අත්තනායක එම්. හේරත්




දැන්වීමකි

# ඔබත් පොතුකබර රෝගයෙන් පීඩා විඳින්නෙක්ද? ස්ථිර වූ සුවයට හෝමියෝපති ප්‍රතිකාර



අපි කවුරුත් කැමතියි පියකරු පෙනුමකට, ඉන්න ශරීරයකට මෙවැනි ලස්සන පෙනුමට ගෙන දෙන ප්‍රධානම ඉන්ද්‍රිය ලෙස සම හදුන්වන්න පුළුවන්.නමුත් අද සමාජයේ 2% ආසන්න පිරිසක් සම අවලස්සන කරන පොතුකබර (Psoriasis) රෝගය නිසා පීඩා විඳින බව පෙනී ගොස් තිබෙනවා. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව මෙම රෝගය වැලඳිය හැකි බව පෙනී යනවා. ඒ වගේම රෝගය වැළඳුණු කෙනෙකු සමාජයට පෙනි සිටීමට ඇතිවන ලැජ්ජාව නිසා මානසික ආතතියට පත්වීමටද මෙම රෝගයේ දැකිය හැකි ලක්ෂණයකි. පොතුකබර (Psoriasis) රෝගය සුවකළ නොහැකි රෝගයක් සමාජයේ සම්මතව පැවතුණද හෝමියෝපති ප්‍රතිකාර මගින් පොතුකබර (Psoriasis) රෝගීන් සම්පූර්ණයෙන් සුවකල හැකි ප්‍රතිකාර ක්‍රමයක් බව කිව යුතුයි.

### පොතු කබර ( Psoriasis) රෝග වැලඳීමට හේතු සාධක

මෙම රෝගය වැලඳීමට හේතුව තවමත් හරියාකාරව සොයාගෙන නැහැ.නමුත් වඩාත් පිළිගත් මතය වන්නේ ජානවල බලපෑමක් නිසා ඇතිවන්නක් බවයි.මෙය කිසිවිටක බෝවන රෝගයක් නොවේ.මෙය අප ශරීරයේ ප්‍රතිශක්තිකරණයේ දුර්වලතාවයකදී සිරුරේම ඇති ප්‍රතිශක්තිකරණ යාන්ත්‍රයක් සිරුරට විරුද්ධව ක්‍රියා කිරීමක් නිසා ඇති වන්නක් (Autoimmune disease) ලෙස හැඳින්විය හැකිය.එම ක්‍රියාවලිය පනගැන්වීම පුද්ගලයාගෙන් පුද්ගලයාට විශේෂිත වූ යම් හේතුවක් (Provocating factor) බලපායි.

- උදා කෘත්‍රිම රසකාරක යෙදු ආහාර මෙන්ම එකිනෙකට නොගැළපෙන ආහාර නිතර පරිභෝජනය. (කිරි, මාළු)
- නිතර පවතින මළබද්ධය
- නිදි මැරීම
- තුවාල (වැටීම් සිරීම් නිසා ඇතිවන තුවාල ආසාදනයන්)
- ආසාදන (සමහර බැක්ටීරියා (Streptococcal pharyngit) හෝ වෛරස් (HIV) ආසාදන
- ඖෂධ Lithium, Sysyemic Corticosterids වැනි ඖෂධ නැවැත්තු විට, රුධිර පීඩනයට ලබා දෙන ඖෂධ නිසා (beta blockers)
- අධික තාපයට නිතර යොමු වීම.
- දුම් පානය.
- මත් පැන් පානය
- හෝර්මෝනවල වෙනස්කම්
- මානසික පීඩනය.

### පොතුකබර රෝගයේ වර්ග හා එහි ලක්ෂණ

හිස්කබල,නළල ,කන් දෙපස, වැලමිට, දණහිස් සිරුර පුරාම නියපොතු මතද වෙනස්කම් ගෙනදෙන රෝගී ලක්ෂණ ඇති කරයි.



Plaque Psoriasis (පොතුකබර) රෝගය
මෙය පොදුවේ දැකිය හැකියි රතුපාට සම හා සිල්වර් පාට පොතු දැකිය හැකියි ඒවා මත කැසීමක් ඇති අතර වේදනාකාරීයි. සමහර අවස්ථාවන්හි ඉරි තැලීම්,ලේ ගැලීම්ද දැකිය හැක.මෙය ශරීරයේ විශාල පරාසයකට පැතිර යයි.

Inverse Psoriasis (පොතුකබර)රෝගය
ඉකිලිවල, පියවුරු යට, කිහිලිවල වැනි සම්පූර්ණයෙන් නොපෙනෙන ස්ථානවල පොතුකබර ඇතිවිය හැක. රතු පාට දිලිසෙන ලෙස සමේ වෙනස්කම් දැකිය හැක.

Erthrodermiv Psoriasis (පොතුකබර) රෝගය
දීර්ඝ කාලයක් ගත් සමහර ඖෂධ නතර කළ විටද, අධික හිරු තාපය නිසාද, ආසාදන නිසාද හට ගන්නා පොතු කබර විශේෂයකි, සම රතු පාට, දිලිසෙන ආකාරයට මෙහිදී ද වෙනස්කම් දැකිය හැක.

Exfoliative Deratitis (පොතුකබර) රෝගය
මුළු සිරුර පුරාම 95% ක්ම සමේ රෝගයක් ලෙස පැතිරීමක් පෙන්නුම් කරන මෙය පොතුකබර වර්ගයට අයත් රෝගී තත්වයකි. ඉක්මන් ප්‍රතිකාර වෙත යොමුවිය යුතුයි. මෙම රෝගී තත්වයට ප්‍රතිකාර නොකිරීමෙන් ජීවිත අවදානමක් පවා ඇතිවිය හැක.

**Pustular Psoriasis**
ඉක්මන් ප්‍රතිකාර කළයුතු මෙම පොතුකබර තත්වයේ ලක්ෂණය වන්නේ සැරව ගෙඩි සිරුරේ තැනින් තැන ඇතිවීමය.මේ රෝගී ලක්ෂණය බොහෝ දෙනා බැක්ටීරියා ආසාදනයක් ලෙස සැක කළද මෙයද පොතුකබර වර්ගයකි.

**Psoriasis Arthritis**



සමහර රෝගීන්ගේ නියපොතුවල හිල් වශයෙන් ආරම්භ වන මෙම රෝගය පසුව නියපොතු අවපැහැ ගෙන,නියමල වෙන්වී පොතු වශයෙන් හැලීමට පටන්ගෙන නියපොතු නරක් වීමට සිදුවේ. ඒ සමග ඇඟිලි ආශ්‍රිත සන්ධි ඉදිමීම වේදනාකාරී තත්ව දැකිය හැක.තවද විශාල සන්ධි මතද (කොන්ද, දණහිස, වැලමිට, විලුඹ) ආශ්‍රිත සන්ධි ඉදිමීම, ශරීරය පුරා ඇති කරන වේදනාව ලෙස මේ සමග ආතරයිටිස් රෝගයද දැකිය හැකි වීම Psoriasis Arthritis රෝගයේ ලක්ෂණ වේ.

### හෝමියෝපති ප්‍රතිකාර ලබා දෙන ආකාරය

හරිම ලේහෙසියි, පහසුයි, කුඩා බෝල හෝ පෙති ඖෂධ ලබා දෙනවා. තිත්ත රසයක් නැහැ. ඕනෑම තැනක සිට භාවිතා කළ හැකියි. රෝග මූලයට ප්‍රතිකාරය මෙන්ම ආලේපයට සුදුසු හෝමියෝපති ආලේපනය ලබා දෙනවා. දවසට දෙවරක් ආලේප කළයුතුයි.අප හෝමියෝපති ඖෂධ භාවිතයෙන් සතියක් යන්නත් පෙර ප්‍රතිඵල දැකිය හැකි වනවා.

### කොහොමද මෙතරම් සරල සුවයක් හට ගන්නේ

හෝමියෝපති ප්‍රතිකාර මගින් රෝගයට හේතු වූ රෝග මුලය නැති කර දමනවා.එකිනෙකාට ආවේණික වූ දුර්වල වූ ප්‍රතිශක්තිය ගොඩනංවන ඖෂධ එකිනෙකාගේ රෝග ලක්ෂණ සැලකිල්ලට ගෙනදෙනු ලබනවා. මෙහිදී ප්‍රතිශක්තිකරණ ක්‍රියාදාමය නිවැරදි ආකාරයට ක්‍රියාත්මක කරන්න හෝමියෝපති ඖෂධ සමත් වනවා. හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ මුලධර්මයට අනුව ඉතා සාර්ථක ලෙස මෙමගින් ඕනෑම පොතුකබර රෝගයක් නිසැක සුවය ලබනවා. අපේ ඖෂධවල ගුණය කැළලක්වත් ඉතිරි නොකර මැකී යනවා. නියපොතු යථා තත්වයට පත්වෙනවා. සන්ධි වේදනා නැතිව යනවා. පොතුකබර රෝගීන් ඉහමත් සතුටක් ලබනවා. මානසික ආතතියද නැතිව යන්නේ හෝමියෝපති ප්‍රතිකාර ගැනීමේදී රෝගියාගේ කායික රෝගී තත්ව මෙන්ම මානසික රෝගී තත්වද සැලකිල්ලට ගනු ලබන බැවිනි.

### ප්‍රතිකාර ගැනිමේදී සැලකිය යුතු කරුණු

අධික උෂ්ණාධික ආහාර වන බලමාළු, බල කරවල, ඉස්සො, දැල්ලො, කකුළුවො, සාඩින්, සොසේජස් වැනි ආහාර මෙන්ම තක්කාලි, අන්නාසි, අඹ, මැන්ගුස්, රඹුටන් වැනි පලතුරුද කිරිපිටි වර්ගවලින්ද වැළකී සිටිය යුතු වනවාග ඒ වගේම ඖෂධ නියමාකාරයෙන් දෙනු ලබන පිළිවෙළට භාවිතා කළ යුතුයි. ප්‍රතිකාර වගේම සුවයට රෝගියාගේ සත්කාරයත් අවශ්‍ය වනවා.



සුවහසක් රෝගීන් හෝමියෝපති වෛද්‍ය ක්‍රමයෙන් සුවපත් කරන එච්.කේ. හෝමියෝපති ආරෝග්‍යශාලාවේ නිර්මාතෘ වෛද්‍ය අනුෂා හේමකුමාර

### සමාජයට දියයුතු පණිවුඩය

ඔබ මෙම පොතුකබර රෝගය සුවකර ගත නොහැකියි කියා බිය විය යුතු නැත. හෝමියෝපති ප්‍රතිකාර තුළින් පොතුකබර රෝගය ස්ථිර ලෙස නිසැක සුවයක් අතුරු ආබාධවලින් තොරව ලබාගත හැකියි. ප්‍රතිකාර ගැනිමේදී වැඩි වී අඩු වන්නේ නැහැ. පොතුකබර නිසා ඇතිවන කැළැල් පවා නැති වී ඔබේ සම පැහැපත් වී අලංකාර පෙනුමක් සුවයක් සතුටක් මෙම ප්‍රතිකාර තුළින් ඔබ ලබනු නිසැකය.

**සටහන ජේ. ඒ. සී ශාන්ත කුමාර**

**විමසීම් :**
**එච්. කේ. හෝමියෝපති**
**හෙල්ත් කෙයාර් සෙන්ටර් ප්‍රයිවට් ලිමිටඩ්**
**නො.12, පී.බී. අල්විස් පෙරේරා මාවත,**
**කටුබැද්ද, මොරටුව.**

**0112 637740/ 0112 637741**
**071 8250716 / 071 8250717**

# ‘අනන්තෙන් ආ තරු කුමරා’ වැඩිපුර කන්න කැමති ඉස්සෝයි දැල්ලොයිලු

**ඒ පසුගිය වසරේ සැප්තැම්බර් 01 වැනිදාය. එදා රාත්‍රියේ ඩුබායි ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය අතුරුසිදුරු නැතුව පිරී තිබුණේ ආසියා කුසලාන ක්‍රිකට් තරඟමාලාවේ අතිශය තීරණාත්මක තරඟයක් වූ ශ්‍රී ලංකා බංග්ලාදේශ තරඟය නරඹන්නන්ගෙනි. තරඟයෙන් පරාජය වෙන කණ්ඩායම තරඟාවලියෙන් ඉවතට විසිවීමට නියමිතව තිබුණි. කෙසේ හෝ මුලින්ම පන්දුවට පහරදුන් බංගලි ක්‍රීඩකයෝ සිය පන්දුවාර විස්ස නිමකළේ කඩුලු හතකට ලකුණු 183ක් ලබාගෙනය. කුසල් මෙන්ඩිස්, දසුන් ශානක වැනි පිතිකරුවන්ගේ කරමතින් ශ්‍රී ලංකා කණ්ඩායම එම ඉලක්කය හඹාගියද ළඟ ළඟ දැවීගිය කඩුලු නිසා ශ්‍රී ලංකා පිලේ ජයග්‍රහණයට මග ඇහිරී තිබුණි. 19 වැනි පන්දුවාරය වනවිට ශ්‍රී ලංකා ලකුණු පුවරුව දිස්වූයේ කඩුලු අටක් අහිමිව ජයග්‍රහණයට ලකුණු 10ක් පිටුපසිනි. නම් දැරූ පිතිකරුවන් සියල්ලෝම සිටියේ ක්‍රීඩාගාරයේය. ඒ මොහොතේ ජයග්‍රහණයේ සමස්ත වගකීම පැටවී තිබුණේ අංක 10 පිතිකරුවා ලෙස පිටියට පැමිණි වේගපන්දු යවන ක්‍රීඩක අසිත ප්‍රනාන්දුටය. පිතිකරුවෙක් නොවුණද බංගලි පන්දු යවන්නාව තඹ සතේකට මායිම් නොකළ අසිත තමාට ලැබුණු පළමු පන්දු දෙකම හතරේ සීමාවට හරවා යැව්වේය. ඉන් නොනැවතී තුන්වැනි පන්දුවට ලකුණු දෙකක් වෙනුවෙන් පැති මාරුකරගත්තේ බොඳවෙමින් තිබූ මුළු රටකම බලාපොරොත්තු මල්ඵල ගන්වමිනි. ඒ අනුව කඩුලු දෙකක ජයග්‍රහණයක් ශ්‍රී ලංකාවට හිමිවිය. එවර ශ්‍රී ලංකාවට ආසියා ශූරයන් වෙන්නට මඟ සැකසූවේ එම ජයග්‍රහණයයි. එදා කවුරු කවුරුත් අසිතව හැඳින්වූයේ ‘අනන්තෙන් ආ තරු කුමරා’ ලෙසිනි. පසුගියදා පැවති ශ්‍රී ලංකා නවසීලන්ත ටෙස්ට් තරඟාවලියේද ඔහු සුපිරි පන්දු යැවීමක නිරත විය. ඉතින් එවන් මොහොතක මේ කතාබහ අසිත ප්‍රනාන්දුගේ ආදරණීය මව වන අයිරින් ප්‍රනාන්දු සමඟිනි.**




**අසිත ආයෙමත් ක්‍රිකට් පිටියේ වැඩ පෙන්නන්න පටන් අරන් නේද?**

මටත් එහෙම හිතෙනවා. පසුගිය ශ්‍රී ලංකා - නවසීලන්ත ටෙස්ට් ක්‍රිකට් තරඟාවලියේ එයා හොඳින්ම පන්දු යැව්වා. පළවැනි තරඟයේදිම කඩුලු හතක් ගත්තා. පුතා සුපුරුදු දක්ෂතාවලට ආයෙමත් ආපු එක ගැන හරිම සතුටුයි.

**අපිට දැනගන්න ලැබුණා අසිත කියන්නේ දුෂ්කරතා ගොඩාක් එක්ක හරි පුංචි පවුලකින් ක්‍රිකට් ගහන්න ආපු ක්‍රීඩකයෙක් කියලා. ඒ කතාව ඇත්තද?**

ඒක ඇත්ත. අපේ ගෙවල් තියෙන්නේ කටුනේරියේ. ගෙවල් ළඟමයි මුහුද තියෙන්නේ. අසිතගේ තාත්තා කළේ ධීවර රස්සාව. ඉතින් ආර්ථික අතින් අපිට ගොඩාක් දුෂ්කරතා තිබුණා. එහෙම දුෂ්කරතා මැදින් ඇවිත් තමයි අසිත අද ජාතික කණ්ඩායමේ ක්‍රීඩා කරන්නේ. ඒ නිසාම අසිතගේ අම්මා විදියට මට ලොකු ආඩම්බරයක් තියෙනවා.

**පුංචි කාලේ අසිත ටිකක් විතර දඟකාරයෙක්ලු නේද?**

(සිනාසෙමින්) ඔව් ඔව් පුතා පොඩි කාලේ ටිකක් දඟයි. එයාට ඉන්නේ අයියලා දෙන්නෙක්. ඉතින් තුන්දෙනාගේ රණ්ඩු බේරලා මට ඉවරයක් නෑ. රෑට නිදාගන්න ගියත් කොට්ටවලින් හරි ගහගන්නවා. ඒ වුණාට ලොකු වෙනකොට ඒක හරි ගියා. දැන් නම් එයාට අයියලාව නැතුවම බෑ.

**එතකොට අසිත ක්‍රිකට් ගහන්න පටන්ගත්තේ කොහොමද?**

එයා යාළුවොත් එක්ක වැල්ලේ ක්‍රිකට් ගැහුවා. දවසක් එයාලා පොඩි මැච් එකකට ගිහින් දිනලා. ඉතින් කප් එකක් එහෙම අරන් ගෙදර ආවා. එදා තමයි එයාට ක්‍රිකට්වලට ආසාවක් ඇවිත් තියෙන්නේ. පස්සේ එයා ඉස්කෝලේ ටීම් එකට එකතුවුණා. ඒ වෙනකොට විදුහල්පති හිටියේ මොහාන් වික්‍රමසිංහ කියලා සර් කෙනෙක්. ඇන්ටන් කියලා සර් කෙනෙක් පුහුණුකරු හිටියේ. ඒ අය අසිත පන්දු යවන්නෙක් විදියට ඔපමට්ටම් කරවලා ගත්තා. බිග් මැච්වලදි එහෙම හොඳටම ක්‍රීඩා කළා. ඒ දක්ෂතා එක්ක එයාට කොළඹ යන්න අවස්ථාව ලැබුණා. මට මතකයි එයා ලොකු බෑග් එකකුත් පිටේ එල්ලන් කෝච්චියේ කොළඹ ගිය හැටි. එදා මං හොඳටම ඇඬුවා. අන්තිමේ එයා නැවතුණේ ජාතික කණ්ඩායමටත් තේරිලා.

**ඒ වෙනුවෙන් ඔහු ගොඩක් කැපකිරීම් කරන්න ඇති නේද?**

පුතා ඒ දවස්වල ක්‍රිකට් ගැහුවට අපේ ගෙදර තිබුණු ආර්ථික පසුබිමත් එක්ක ක්‍රිකට් බඩු ගන්න බැරිවුණු වෙලාවල් තිබුණා. ඒත් පුළුවන් විදියට අපි හැමදේම එයාට අරන් දුන්නා.



අසිත ප්‍රනාන්දුගේ මව අයිරින් ප්‍රනාන්දු

පුතා වුණාත් මදිපාඩු බැලුවේ නෑ. අසිතට යාළුවෙක් හිටියා සචින් කියලා. අනේ ඒ දරුවා මගේ පුතාට මේස් දෙකේ ඉඳලම අරන් දීපු වෙලාවල් තිබුණා. අදටත් ඒ යාළුකම වෙනස් වෙලා නෑ.

**අසිත ප්‍රනාන්දු කියන්නේ කවුද කියලා රටම දැක්කේ පසුගිය ආසියා කුසලාන ක්‍රිකට් තරඟාවලියේදි. මොකද අසිත නොහිටින්න ආසියා කුසලානය අපට හීනයක්ම වෙන්න තිබුණා. එහෙම නේද?**

එදා බංග්ලාදේශය එක්කනේ මැච් එක තිබුණේ. අපි පැරදුණා නම් එදා කැපෙනවා. ඒත් අසිත එදා මැච් එක දිනවලා දුන්නා. හැබැයි මං වුණාත් හිතුවේ නෑ අසිත ඒක කරයි කියලා. මොකද එයා පන්දු යවන්නෙක්. ඒත් එදා එයා අන්තිම මොහොතේ හොඳ පිතිකරුවෙක් කියලත් ඔප්පු කරලා පෙන්නුවා. එදා ඉඳන් හැමෝම පුතාට කියන්නේ ‘අනන්තෙන් ආ තරු කුමරා’ කියලා.

**මැච් එකක් පටන්ගන්න කලින් අම්මට කතා කරනවා කියන්නේ ඇත්තද?**

ඒක ඇත්ත. එයාට මැච් එකට කලින් මගේ ආශිර්වාදය ඕනේ. ඒ නිසා කොහේ මැච් එකක් තිබුණත් එයා මට කතා කරලයි මැච් එකට යන්නේ.

**ඒ කියන්නේ අසිත අම්මට හරි ආදරේ ඇති නේද?**

ඔව් ගොඩාක් ආදරෙයි. එයාට ක්‍රිකට් ගහලා මුලින්ම මුදලක් අතට ලැබුණු දවසේ ඒක අරන් මගේ ළඟට ඇවිත් “අම්මට මොනවද ඕන?” කියලා ඇහුවා. ඒක හරිම සංවේදී මොහොතක් වුණා. මං “අනේ මුකුත් එපා පුතේ” කිව්වා. දැන් නම් ටුවර් එකක් යන ගානේ මට බෑග් එකක් අරන් එනවා.

**අසිත ගෙදර එන දවසට අම්මට වැඩ වැඩියි කියන්නේ ඇත්තද?**

(සිනාසෙමින්) එහෙම නෙවෙයි. එයා ගෙදර එන දවසට කන්න ආස දේවල් හදලා තියන්න කියනවා. එයා ඉස්සෝ, දැල්ලෝ එහෙම කන්න හරි ආසයි. කොහොමත් කොල්ලා කෑමට හරි රුසියෙක් තමයි.

**පසුගියදා වනිදු හසරංගත් විවාහ වුණා. ඊළඟට ඉන්නේ අසිත නේද?**

(සිනාසෙමින්) ඔව් ඔව්. ගොඩාක් දුරට ලබන අවුරුද්දේ අසිතගේ විවාහය සිද්ධවෙයි.

**ඒ කියන්නේ අසිතට දැන් පෙම්වතියක් ඉන්නවද?**

ඔව් එයාට ගෑනු ළමයෙක් ඉන්නවා. එයා නිකේෂලා පෙරේරා. ඒක ඉස්කෝලේ කාලේ ඉඳන්ම තිබුණු ආදර සම්බන්ධයක්. නිකේෂලා මට මගේම දුවෙක් වගේ. අසිත ගැන වගේම මගේ ගැනත් හොයලා බලනවා. එයා අසිතට කැමතිවුණේ පුතාට කිසිම දෙයක් නැති කාලේ. ඒත් එයා දැන් ලොකු කාලයක් පුරාවට අසිතගේ ළඟින්ම ඉන්නවා. එයා අසිතට ගොඩක් ආදරෙයි. අසිතත් එහෙමයි. ඉතින් දෙන්නගේ විවාහය දවස වෙනකල් මටත් ඉවසිල්ලක් නෑ.


**එක්දින ලෝක කුසලානයට තව ටික දවසයි තියෙන්නේ. අසිත ප්‍රනාන්දු ඒ වෙනුවෙන් ලෑස්තියිද?**

මං හිතනවා අසිතට ලෝක කුසලාන කණ්ඩායමේ ඉඩක් ලැබෙයි කියලා. ඒ වෙනුවෙන් කොහොමත් එයා ලෑස්තිපිට ඉන්නේ. මමත් ආසාවෙන් ඉන්නවා මෙදා පාර ලෝක කුසලානේ පුතා ක්‍රීඩා කරනවා බලන්න. මගේ හිත කියනවා ඒ අවස්ථාව එයාට ලැබෙයි කියලා.

■ රුවන් එස්.සෙනවිරත්න

**සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම 'පවුල' නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.**

# මහත්තුරුන්ට 'ඩෝන්' ගියාම අපිට 'පාන්' ද?



ගොඩක් වෙලාවට පිරිමි හිත් දරදඬුයි වගේ අපට පේන්න තිබුණට ඒ හිත් ඇතුළෙත් පුංචි දරුවෙක් වගේ කෙනෙක් ජීවත්වෙනවා. මම එහෙම කියන්නේ මගේ සංසාරික ගමන් සගයා තුළිනුත් මට සමහර අවස්ථාවල ඒ විදියේ පුංචි දරුවෙක් මුණගැහෙන නිසා. අපි නොහිතන විදියට නොහිතන කාරණාවලදී පිරිමි හිත් ගොඩක් සංවේදී වෙනවා. එහෙම වුණාම සමහරු තරහා පිට කරලා ඒ සංවේදීකම පෙන්වනවා. සමහරු නිහඬවීමෙන් ඒ සංවේදී බව නොපෙන්වා ඉන්න උත්සාහ කරනවා. කොහොමවුණත් තමන්ගේ සහකාරයාගේ හිත කියවන්න පුළුවන් හැකියාවක් තියෙන ඕන ගැහැනියක්ට ඒ නිහඬ බව ඇතුළේ තියෙනන නොරිස්සුම වටහාගන්න අපහසු වෙන්නේ නෑ.

ගෙවුණ සුමානේ සතියේ දවසක ජපානයේ නිවාඩු දවසක් තිබුණා. එදා උදේ දහම්ගේ මං වෙනදා නොදකින නිහඬ බවක් දැක්කා. මං ගුඩ් මෝර්නින් කියද්දි ඒ මූණෙ වෙනදා තියන ලස්සන හිනාව තිබ්බේ නෑ. ප්‍රතිචාරය විදියට මට ලැබුණේ 'මෝර්නින්ග්' විතරයි 'ගුඩ්' නෑ. ඉතින් මං පන්න පන්න ඇයි කියලා අහන්න ගියේ නෑ. සුපුරුදු විදියටම උදේටත් කන්න හදලා දීලා, දවල්ට උයන්න පටන්ගත්තා. ඒ හැමදේම කරන ගමන් දහම් ගැනත් විපරමින් හිටියා. දරුවෝ එක්ක ඉන්නකොට මං දකින සුපුරුදු සුන්දර පිරිමියාම ඉන්න බව මට තේරුණා. හැබැයි මං ළඟදි වෙනස්. ඉතින් මේ නෝක්කාඩුව මාත් එක්ක තියන එකක් කියලා තේරුම්ගන්න මට මහ වෙලාවක් ගියේ නෑ. නෝක්කාඩුවට හේතුවත් මං දන්න හින්දා, සද්ද නැතුව වෙනසක් නොපෙන්වා මං මගේ වැඩ ටික කළා.

ඒ අතරේ කුස්සියට ඇවිත් එබිකම් කරපු දහම් "කන්න මොකුත් නැද්ද?" කියලා අහලා ෆ්‍රිජ් එක ඇරලා ඒකේ තිබ්බ කේක් කෑල්ලක් අරන් යන්න හදද්දී, යන්න නොදී අල්ලගෙන "තරහා වෙන්න එපා ඉතින්" කියලා පොඩි හාද්දක් දුන්නා. එතකොට කට කොනට පොඩි ළා හිනාවක් ආවා. ඒත් ඒක මට නොපෙන්වා එයා ගියා. හාද්ද වැඩ කරනවා වගේ මට දැනුණා. ඒ නිසා දහම් ගේ ඇතුළේ ඉන්න තැන්වලට ගිහින් මං හාද්දක් දුන්නා. ටික ටික සුපුරුදු දහම් විදියට එයා වෙනස් වෙන බව මට දැනුණා. මගේ හිතටත් සතුටුයි. මැජික් හාද්ද වැඩ කරනවා. ඒ හාද්දේ තිබුණේ ආදරේ විතරයි. පිරිමියෙක්ගේ මුරණ්ඩු ගති, දරදඬු ගති වගේම සංවේදී නෝක්කාඩු හෙමින් පිරිමදින්න ආදර හාද්දක් හොඳටම ප්‍රමාණවත් බව මම ආපහු පාරක් තේරුම්ගත්තා.

ඔයා කතා කරනකන් මං කතා කරන්නෙත් නෑ කියන තැන ඉන්නේ නැතුව, පැටලි පැටලි රණ්ඩු කරන්නේ නැතුව ආදර හාදු කීපයකින්, ආදරණීය වැළඳගැනීම් කීපයකින් පුංචි නෝක්කාඩුවක් ඉවර කරන්න ගෑනු අපිට පුළුවන් වෙන්න ඕනේ.

දහම් සුපුරුදු යථා තත්ත්වෙට ආවාම මං කිව්වා, "නිවාඩු දවස් අපිට මතක හිටින සුන්දර දවස් වෙන්න ඕන අයියේ, ඒ හින්දා මං නිසා දුක හිතුණොත් ඒක එවලෙම විසඳගමු. අනිත් දවසට අරන් යන්න එපා. අද නිවාඩු දවසෙ ඔයාගේ මූණේ කාටවත් නොතේරුණ මට තේරුණ දේ හින්දා දවසෙන් බාගයක්ම අපි දෙන්නට සතුට නැතිවුණා. ඔයා ගෙදර ඉන්න දවස්වලට ළමයින්ට විතරක් නෙවෙයි මටත් ආසයි. ඒක ඔයා හොඳටම දන්නවනේ. ඒ හින්දා නිවාඩු දවස්වල අපි සතුටෙන් ඉමු" කියලා කිව්වා.

එයා මට දේවල් කියලා දෙනවා වගේ, හරි වැරදි පෙන්නනවා වගේ, මටත් දැනෙන දේ එයාට මං කියනවා. හැබැයි ඒ නිවිලා මිසක් ඇවිලිලා නෙවෙයි.

අපේ පුංචි අතපසුවීම් එක්ක අපි නොහිතන දුකක් අපේ සහකාරයාට දැනෙන්න පුළුවන්. ඒ වෙලාවට ඉවසීමෙන්, කල්පනාවෙන් ඒ දුක සතුටකට හරවන දේවල් කරනවා මිසක්, එයත් එහෙමනම් මාත් මෙහෙමයි කියන තැන ඉන්නේ නැතුව එතැනින් ඉස්සරහට ඇවිත් හිතන්න. ඔයා නොහිතන ලස්සන උත්තර ඔයාට ලැබේවි. ආදරේ අලුත් වේවි. පවුල් ජීවිතේ තමයි මේ ලෝකේ සුන්දරම හැඟීම කියලා ඔයාට දැනේවි.

විශ්වාස කරන්න... ගෑනු අපි ඇතුළේ ඇවිලුන, නොරිස්සුමෙන් නෝක්කාඩුවෙන් ඉන්න පිරිමියෙක්ව නිවන්න පුළුවන් පුංචි පුංචි මැජික් ගොඩාක් තියෙනවා. එහෙම අවස්ථාවක ඔයාගේ මැජික් එක හොයාගන්න. ඒකෙන් උපරිම ප්‍රයෝජන ගන්න.

■ **හෂිණි මනමේන්ද්‍ර**









# සාධාරණ නඩු විභාගයක් තිබුණානම් ප්‍රමිලාගේ ලපය දැක්ක විදිය දස්කොන්ටත් කියන්න තිබුණා



**ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න යනු විද්‍යාත්මකව සහ කලාත්මකව පැමිණිල්ල මෙහෙයවීමට නම් දරා ඇති විශිෂ්ටයෙකි. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී ආන්දෝලනාත්මක නඩු රැසක පැමිණිල්ල මෙහෙයවීමට ඔහු දායක වී ඇත. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු විසින් රචිත 'යළි මැවෙන අපරාධයක්' කෘතියේ සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නීතිපති දෙපාර්තමේන්තුවෙන් පසුගිය වසරේදී සමුගත්තේ ජ්‍යේෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු ලෙස කටයුතු කරමින් සිටියදීය. නීතිය පිළිබඳව විවිධ කණ්ඩායම් දැනුවත් කිරීමටද හෙතෙම පසුබට නොවෙයි. අධිකරණ ක්‍රියාවලිය සහ විත්තිකරුවන්ගේ අයිතීන් සම්බන්ධව පසුගිය දිනවල දැඩි සමාජ කතිකාවක් මතු විය. සාධාරණ නඩු විභාගයක් යනු කුමක්ද යන්න පිළිබඳ ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න 'ධරණී' ට අදහස් දැක්වීය. මේ ඔහුගේ අත්දැකීම් සහ උපදෙස් මත පළකෙරෙන ලිපි මාලාවේ නවවැන්නයි මේ.**

'සක්මන් කරන මළුවේ දී බැඳි හාද
සිත් සන්තොසින් දුන් මුව මී බිව්වාද
ඉක්මන් ගමන් හිමියනි අද යනවාද
දස්කොන් මගෙ නමට ජීවය දෙනවාද'

දස්කොන් - ප්‍රමිලා ප්‍රේම වෘතාන්තය පිළිබඳව නොයෙකුත් කතා අප අසා ඇත. මේ කවියද එවැන්නකි. ප්‍රමිලා දේවිය මහත් වේදනාවෙන් යුතුව ලියූ මේ කවිය අනපේක්ෂිත ලෙස මරණයට නියම වූ දස්කොන් වෙත රහස් දූතයකු අත යැවූ බව සඳහන්ය. කවිකාර හිත් එකිනෙක හා එක්වීම අරුමයක් නොවේ. මරණය පෙනි පෙනී සිටියදී පවා ඔහු ප්‍රමිලා යැවූ කවියට පිළිතුරු කවියක් යොමු කර තිබේ. ඉන් පවසා ඇත්තේ සීතාව දැකීමෙන් පමණක් සැනසුණු රාවණා හිස් දහයක් දන් දුන්නේ නම් ඔබේ අමයුරු පහස ලැබූ මගේ හිස දන්දීම ඒ හැටි දෙයක් නොවේය යන්නයි.

'විසැස් කමලාව රස පහස නොවිඳමා
දසිස් දුනි පොරණ ඇසු දුටු පමණට මා
වෙසෙස් නුඹේ අමයුරු පහස ලද මෙමා
ම හිස් එකක් ගියෙ නම් නුඹ නමට කිමා'

අදටද ඔවුන්ගේ ප්‍රේමය නමින් බොහෝ කවි ගී ලියැවෙයි. දස්කොන් යනු සෙල්ලම් නිරිඳු ලෙස නම් ලබා සිටි නරේන්ද්‍රසිංහ රජුගේ කුඩා කල සිට මිතුරාය. විදේශිකයකු වූ දස්කොන්, රජු විසින් මහාදිකාරම් ධුරයට පත්කරනු ලැබූයේ රජකම ලබාගැනීමට ඔහු දුන් සහායට කෘතගුණ දක්වමිනි. සිංහල ප්‍රධානීන්ගේ දැඩි විරෝධයක් එල්ල වුවත් රජු ඒවා නොතැකුවේය. එතරම් වටිනා මිතුරාගේ හිස ගසා දැමීමට රජු තීරණය කළේ දස්කොන් සහ සිය අග මෙහෙසිය වූ ප්‍රමිලා අතර තිබූ බව කියන ප්‍රේමයක් හේතුවෙනි.

ප්‍රමිලා ඉන්දියාවෙන් මෙරටට ගෙන් වූ නායක්කාර් වංශික කුමරියකි. රජුට අයත් හඟුරන්කෙත, සෙංකඩගල සහ කුණ්ඩසාලේ මාලිගා අතරින් ප්‍රමිලා බිසව වාසය කළේ හඟුරන්කෙතයි. රජු වාසය කළේ සෙංකඩගලයි. රජුගේ මහාදිකාරම් වූ දස්කොන් සේම ප්‍රමිලා බිසවද කවි ලිවීමේ නිපුණයෝ වූහ. දෙදෙනා අතර සෙනෙහස වැඩීමට එයද හේතු වන්නට ඇත. මේ අතර විදේශිකයකු වූ දස්කොන් මහාදිකාරම් ධුරයට පත්කිරීම පිළිබඳ උරණ වූවෝ ඔහු පලවා හැරීමට විවිධ සැලසුම් දියත් කරමින් සිටියහ. ප්‍රමිලා බිසව රෝගී බවට පත්වූයේද මේ අතරතුරයි. රෝග නිවාරණය කරනු වස් දෛවඥයින් උපදෙස් දී තිබුණේ ඇගේ රුවට සමාන අනුරුවක් සෑදිය යුතු බවටයි. දස්කොන් මහාදිකාරම්ගේ නිරීක්ෂණය යටතේ මූර්ති ශිල්පියෙක් එම කාර්යය ඉටුකළේය. අනුරුව දැකීමෙන් දැඩි සතුටට පත් වූ රජු එකෙනෙහිම නොසන්සුන් විය. ඒ ප්‍රමිලාවගේ අනුරුවෙහි කලවේ උපන් ලපයක් සලකුණු කර තිබෙනු දැකීමෙනි.

"ඇගේ කලවේ ඇති උපන් ලපය ගැන මූර්ති ශිල්පියා දැනගත්තේ කෙසේද?"

රජුට ඇති වූ ගැටලුව එයයි. මූර්ති ශිල්පියා කීවේ දස්කොන් අදිකාරම්ගේ උපදෙස් මත එය සලකුණු කළ බවයි. ඉන් දැඩි කෝපයට පත්වූ රජු, වහා දස්කොන් සිරගත කර පසුව මරණයට පත්කළ බවට ඇතැම් පුරාවෘත්තවල සඳහන්ය.

'සක්මන් කරන මළුව පාලුයි දේවී
මං විතරයි ඔබ කිසි දිනක නොඒවී
ඉක්මන් ගමන් එපා පා පැකිලේවී
දස්කොන් සකි සඳ මා ඔබේ කුමාරී'
'දස්කොන් සකි සඳ ඉක්මන් ගමනින්
නොඑනා ගමනකි යන්නේ
එනමුත් ළඳුනේ මතු අත්භවයේ
ඔබ මා යළි හමුවන්නේ'
'දුකිනා වෙසෙනා
බිසවුනි ප්‍රමිලා
සතුටේ ගිලුනා - මගෙ මුදු පෙමිනා
රහසේ බැඳුනා - පහසේ මා හා
මාගේ දිවි දී - රැක ගම් සොඳිනා'

ආදී ගීත ගණනාවක් අපේ ගීත සාහිත්‍යයට හිමිවූයේ දස්කොන් - ප්‍රමිලා ආදරය සහ රුදුරු වියෝව පාදක කර ගනිමිනි.

සැබැවින්ම ඔවුන් අතර ප්‍රේමයක් තිබුණාද? දස්කොන් ඒ වෙනුවෙන් ජීවිතය දුන්නාද? ඔහුට දිවි රැකගැනීමට හැකියාවක් නොතිබිණිද?

මේ ගැන කියැවෙන තවත් අපූරු පුරාවෘත්තයක් ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න සිය 'යළි මැවෙන අපරාධයක්' ග්‍රන්ථයේ සංස්කරණය කළ දෙවන මුද්‍රණය එළිදැක්වූද සඳහන් කළේය.

"රජතුමා සහ ප්‍රමිලා දේවිය දිනක් ස්නානය සඳහා පොකුණට ගියා. දස්කොන් මහාදිකාරම ඉන්නෙ අවට ගැන දැඩි විමසිල්ලෙන්. ඒ අතර ඔහු දැක්කා පොකුණේ ජලය මත මැස්සකු රැඳී සිටිනවා. බුද්ධිමතකු වූ දස්කොන්ට ඒ ගැන සැකයක් මතුවුණා. ජල පෘෂ්ඨයේ මැස්සෙක් ඉන්නේ කොහොමද කියන එක ගැන. ඒ ගැන සොයා බැලූ ඔහුට දැනගන්නට ලැබුණා මැස්සා වසා සිටින්නේ පොකුණේ සිට ඉහළට මතුවූ කිණිස්සක අගිස්සේ බව. කිසියම් කුමන්ත්‍රණයක් සිදුවන බව වටහාගත් ඔහු වහාම රජු සහ බිසව ගොඩට ගත්තා. ඒ අවස්ථාවේදී ඔහු ප්‍රමිලාවගේ කලවේ වූ ලපය දකින්නට ඇති කියලා ඇතැම් පුරාවෘත්තවල සඳහන් වෙනවා."

මරණ දඬුවමට නියම වූ පසු හෝ කිසියම් වරදකට වැරදිකරු වූ පසු අභියාචනයක් ඉදිරිපත් කිරීම අදත් සිදුවෙයි. එදා දස්කොන්ද සිය දුක්ගැනවිල්ල ගැන කියා අභියාචනයක් සකසා තිබේ. 'නෝක්කඩු මාලය' නමින් හැඳින්වෙන්නේ එයයි. ඇතැම්විට ප්‍රමිලා දේවියගේ කලවේ උපන් ලපය දුටු ආකාරය පිළිබඳ එහි කිසියම් විස්තරයක් තිබුණා විය හැකිය. එය රජතුමා වෙත යැවීමට දස්කොන්, තමාගෙන් පසු මහාදිකාරම වූ ලෙව්කේ රාළ වෙත බාර දී තිබේ. එහෙත් ඔහු හිතාමතා එය රජුට බාරදීම ප්‍රමාද කර ඇත. රජතුමා දස්කොන්ගේ 'නෝක්කඩු මාලය' ගැන දැනුවත් වී ඇත්තේ ඔහුගේ හිස ගසා දැමීමෙන් අනතුරුවයි. එයින් කිපුණු රජු ලෙව්කේ රාළ සහ ඔහුට උදව් කළ ස්වාමීන් වහන්සේ නමකුත් දස්කොන් මැරීමට කුමන්ත්‍රණය කිරීමේ චෝදනාව මත හිස ගසා දැමූ බවයි පුරාවෘත්තවල සඳහන් වෙන්නේ.

කෙසේවෙතත් දස්කොන් මරණ දණ්ඩනයට ලක්වූයේ තමා වෙනුවෙන් අදහස් දැක්වීමට කිසිඳු ඉඩක් නොලබාමය. ශිෂ්ට සම්පන්න සමාජයක යුක්තිය පසිඳලීමේ වැදගත්ම අංගයක් වන ස්වභාවික යුක්ති මූලධර්මයක් ඉන් කඩ වී තිබේ. එනම් විත්තිකරු හට සවන් දිය යුතුය (Audi alteram partem) යන්නයි.

නඩු විභාගයකදී විත්තිකරුට තම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට සාධාරණ අවස්ථාවක් දිය යුතුය. එහිදී පැමිණිල්ල විසින් විමර්ශනයේදී හෙළි වූ සියලු තොරතුරු විත්තියට දැනගැනීමට ඉඩ සැලසිය යුතුය. නැතහොත් සිය විත්තිවාචකය නිසි පරිදි ඉදිරිපත් කිරීමට විත්තියට ඉඩ අහිමි වනු ඇත. නීතිය ඉදිරියේදී පැමිණිල්ල සහ විත්තියට සමාන ලෙස සැලකීමෙන්ද නඩු විභාගය සාධාරණ එකක් බවට පත්වේ. එසේ නොමැතිව පොදු ජනයා හිතන හෝ මාධ්‍ය මගින් දෙන තොරතුරු පදනම් කරගෙන තීන්දු දිය නොහැකිය. සාධාරණ විමර්ශනයක් සිදුකර නිසි පරිදි නඩු විභාගය පවත්වා තීන්දු ලබාදීමෙන් නීතියේ පාලනය සුරැකෙයි. එලෙස සාධාරණ විමර්ශනයක් හෝ නඩු විභාගයක් පවත්වා නැති අවස්ථාවකට හොඳ උදාහරණයකි දස්කොන්ගේ සිදුවීම. වර්තමානයේදී සත්‍යය අනාවරණය කරගැනීම වෙනුවෙන් තාක්ෂණයේ සහයෝගයද ලබාගත හැකිය. සී.සී.ටී.වී. කැමරා, දුරකතන කුලුණු වාර්තා, ඩී.එන්.ඒ. තාක්ෂණය, ජී.පී.එස්. මෙවලම් සහාය ආදිය ඊට උදාහරණ වේ. එමෙන්ම විත්තියට නීතීඥ නියෝජනයක් ලබාගැනීමේ අයිතියද පවතී.

ස්වභාවික යුක්ති මූලධර්මවල අනෙක් අංගය වන්නේ තමාගේ නඩුව තමාම විසඳීම සිදු නොකිරීමයි. (Nemo Judex in causa sua) ඉහත සිදුවීමේදී රජු විසින් තමාගේ නඩුව තමාම අසා ඇත. එම නඩුවේදී ස්වාභාවික යුක්ති මූලධර්ම සම්පූර්ණයෙන් උල්ලංඝනය වී තිබේ.

එසේම සාධාරණ නඩු විභාගයක් අහිමි වූ එවැනි සිදුවීමක් මෑතකදී ගාල්ලෙන් වාර්තා විය. ප්‍රදේශයේ සිල්ලර වෙළඳසැලක් වැටලූ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු එහි තිබූ සිසිල් බීම බෝතල් කිහිපයක් අත්අඩංගුවට ගත්හ. ඊට හේතුව කල් ඉකුත්වීමේ සහ නිෂ්පාදිත දින සඳහන් නොවීමයි. ඒ අනුව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136(ආ) උපවගන්තිය යටතේ කඩ හිමියා පළමු විත්තිකරු ලෙස නම් කර නීති කටයුතු ආරම්භ කෙරිණ. පළමු විත්තිකරුට අදාළව චෝදනා පත්‍රයක්ද ඉදිරිපත් කර ඇත. මෙහිදී දෙවන විත්තිකරු ලෙස නම්කර තිබුණේ අදාළ සිසිල් බීම සමාගමයි. ඔවුන්ටද චෝදනා පත්‍ර ඉදිරිපත් කර ඔවුන්ට එරෙහිවද එදිනම නඩු කටයුතු ආරම්භ කර තිබුණි. චෝදනා පත්‍ර දෙකටම මහේස්ත්‍රාත්වරයාගේ අත්සනද තබා තිබිණ. නමුත් ඊට පෙර ඒ සම්බන්ධව විත්තිකාර සමාගම කිසිඳු අයුරකින් දැනුවත් කර තිබුණේ නැත. අවසානයේ විත්තිකරුවන් දෙදෙනාම වරදකරුවන් බවට අධිකරණය තීන්දු කෙරිණ. එම නියෝගය අභියෝගයට ලක් කරමින් අදාළ සමාගම ගාල්ල මහාධිකරණයට අභියාචනයක් යොමුකළේය. නීත්‍යානුකූල නොවන අන්දමින් නඩු පැවරීම, සාධාරණ විමර්ශනයක් නොපැවැත්වීම සහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු විභාගයේදී අනුගමනය කළ නීතියට පටහැනි ක්‍රියාමාර්ග ගැන එහිදී අවධානය යොමු විය. ඊට අදාළ කරුණු සලකා බැලූ මහාධිකරණය 2021 දෙසැම්බර් 08 වනදා තීන්දුව ලබාදෙමින් දෙවන විත්තිකාර සමාගම සියලු චෝදනාවලින් නිදෙස්කොට නිදහස් කළේය.

අධිකරණයෙන් වරදකරුවකු කරන තෙක් සෑම පුද්ගලයකුම නීතිය ඉදිරියේ නිර්දෝෂී අයෙකි. එනිසා සියලු කරුණු ගැන දැනුවත්ව පැමිණිල්ල හා සමාන තැනක සිට නඩුවට පෙනී සිටීමට විත්තියටද අවස්ථාව හිමිවිය යුතුය.

රාජාණ්ඩු සමයේදී නීතිය වූයේ රජු මිස වෙන යමක් නොවේ. එහෙත් එය ශිෂ්ට සම්පන්න සමාජයකට උචිත නොවේ. ඕනෑම මිනිසකු යම් ක්‍රියාවක් කරද්දී එය වරදක් වේද සහ ඊට හිමි දඬුවම ගැන දැන සිටිය යුතුය. එහිදී අතීතයට බලපාන පරිදි දඬුවම් පැනවීමද ශිෂ්ට සම්පන්න සමාජයක් පිළි නොගනී. මෙරට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාව අනුවද අතීතයට බලපාන පරිදි දඬුවම් නියම කළ නොහැකිය. එහෙත් ජාතීන්ගේ සම්මතයෙන් පිළිගත් පොදු නෛතික මූලධර්ම අනුව සාපරාධී ක්‍රියාවක් කිරීමෙන් හෝ නොකිරීමෙන් අතීතයට බලපාන පරිදි දඬුවම් කළ හැකි බව එහිම දක්වා ඇත.

සේපාල ඒකනායක නඩුව ඊට හොඳම උදාහරණයයි.

මෙහි කතානායකයා ඉතාලි ජාතික කාන්තාවක සමඟ විවාහ වී සිටියේය. ඔවුන්ට පුතෙකුද ලැබිණ. ඉතාලියේ වූ සිද්ධියක් හේතුවෙන් ඔහුට වීසා බලපත්‍රය අහිමි වූ අතර, නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට සිදුවිය. එහෙත් ඔහු මෙරටට පැමිණ බලපත්‍රය අලුත් කරගැනීමට ගත් උත්සාහයට නිලධාරීන්ගේ කිසිඳු සහායක් හිමි නොවීය. සැලකිය යුතු කාලයක් ඒ සඳහා වෙහෙසීමෙන් පසු හෙතෙම දැඩි සේ කෝපයට පත්ව වෙනත් සැලසුමක් සඳහා ඉන්දියාවේ නවදිල්ලියට ගියේය. එහිදී 1982 ජුනි 30 වනදා අලිතාලියා සේවයට අයත් ගුවන්යානයකට ගොඩ වූ ඔහු ඉහළ අහසේදී එය පැහැරගත්තේ නියමුවාට ලිපියක් මගින් ඉල්ලීම් ඉදිරිපත් කරමිනි. සිය බිරිය සහ දරුවා ගෙන්වා දෙන ලෙස සහ ඇමරිකානු ඩොලර් 300,000 ක කප්පමක් ලබාදෙන ලෙස ආදී වශයෙන් ඉල්ලීම් විය.





**නඩු විභාගයකදී විත්තිකරුට තම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට සාධාරණ අවස්ථාවක් දිය යුතුමයි**

ඒවාට එකඟතාව හිමි නොවුණහොත් යානය පුපුරුවා හරින බවට ඔහු තර්ජනය කළේය. ඔහුගේ ඉල්ලීම් ඉටු විය. එහෙත් පසුව හෙළි වූයේ ඔහු සතුව බෝම්බයක් නොතිබූ බව සහ වයර් කැබලි කිහිපයක් පමණක් තිබූ බවයි. ඒ සමඟ ගුවන්යානයක් පැහැරගත් පළමු ශ්‍රී ලාංකිකයා බවට ඔහු පත්වූ අතර මෙරට බොහෝදෙනා ඔහු වීරයකු ලෙස සැලකූහ. එහෙත් මෙය ඉතාලි රජය සුළුවෙන් තැකුවේ නැත. ඔහු කළ වරදට එරෙහිව ක්‍රියා කරන ලෙස ශ්‍රී ලංකා රජයට ඔවුන්ගේ බලපෑම් එල්ල විය. ඒ අනුව මෙරට නීතියේ ගුවන්යානා කොල්ලයට අදාළ නීතියක් ඒ වනවිට තිබුණේ නැත. නමුත් කොල්ලකරුට එරෙහිව දඬුවම් ලබාදීමට ක්‍රමයක් සෙවීමට ශ්‍රී ලංකාවට සිදුවිය.

1982 අංක 24 දරන ගුවන්යානාවලට එරෙහි වැරදි පනත පිහිටුවා 1982 ජූලි 26 වනදා බලාත්මක කෙරුණේ එබැවිනි. ඒ අනුව මහාධිකරණය හමුවේ විත්තිකරුට එරෙහිව නඩු පැවරූ අතර ජූරි සභාවකින් තොරව කොළඹ මහාධිකරණය ඔහුට එරෙහිව දඬුවම් නියම කළේය. ඊට එරෙහි අභියාචනයේදී විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි නීතීඥයින් තර්ක කළේ ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව අතීතයට බලපාන පරිදි දඬුවම් පැමිණවිය නොහැකි බවයි. ගුවන්යානාවලට එරෙහි වැරදි පනත විත්තිකරුගේ ක්‍රියාවෙන් පසු පැනවූ එකක් බව ඔවුහු පෙන්වා දුන්හ. එයට එකඟ වුවද ඊට ව්‍යතිරේඛ අවස්ථා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙහිම දක්වා තිබෙන බව අධිකරණය පෙන්වා දුන්නේය. ගුවන්යානා කොල්ලය අන්තර්ජාතික වශයෙන් පිළිගත් අපරාධයකි. ඊට අදාළ සම්මුතීන් කිහිපයකට ඒ වනවිට ශ්‍රී ලංකාව අත්සන් තබා තිබිණ. ඒ අනුව අන්තර්ජාතික වශයෙන් පිළිගත් අපරාධයකට එරෙහිව දඬුවම් ලබාදීමට අතීතයට බලපාන ලෙස නීති සකස් කිරීමට මෙරට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් ඉඩ ලබාදෙන බව අභියාචනාධිකරණය පෙන්වා දුන්නේය. අතීතයට බලපාන පරිදි මෙරට නීති සැකසුන පළමු අවස්ථාව එයයි.

යම් තැනැත්තකු යමක් කිරීම හෝ නොකිරීම මෙරට නීතිය හෝ අන්තර්ජාතික නීතියට අනුව වරදක් විය හැකිය. ඒවාට දඬුවම් දීමේ ක්‍රමවේදයක් තිබේ. එය බහුතරය කැමති වන හෝ නොවන දඬුවමක් විය හැකිය. එසේ වුවද නීතියේ පාලනය පවත්වා ගැනීම වෙනුවෙන් කළ යුතු වන්නේ සැවොම තුටු කිරීමට වඩා නිවැරදි ක්‍රමවේදය අනුගමනය කිරීමයි. සාධාරණය ඉටුවන බව සියල්ලන්ට පෙනී යන්නේනම් වඩා උචිතය. ඒ සඳහා විමර්ශනය මෙන්ම නඩු විභාගයද සාධාරණ විය යුතුය. එය බිඳ වැටීමට ඉඩ නොදීම සියලු ජනයාගේ වගකීමකි.

**නීතීඥ රශ්නිකා ලියනගේ**



**තිසංක ගමගේ**
**'ප්‍රාණ' සංවිධායක සහ මෙහෙයවීම**

# ගීයකට හිස තියන් සනීපෙට ඇඳි ගන්න
## අප්‍රේල් 4 වැනිදා රෑ 7ට සඳුන් උයනට එන්න




ගීතයකට ජීවිතයක් වෙනස් කරන්න පුළුවන් කියලා ඉංග්‍රීසි කියමනක් තියෙනවා. ඒ කතාව ඇත්ත කියලා පිළිගන්න ඕනතරම් උදාහරණත් තියෙනවා.

දවසක් සුනිල් එදිරිසිංහ මහත්මයා සංගීත ප්‍රසංගයකදී ඔහුගේ ගීයක් නිසා වෙනස්වුණු ජීවිතයක කතාවක් ගැන කිව්වා. ප්‍රේමයෙන් පැරදුණු තරුණ ගැටයෙක් මැරෙන්න කියලා හිතාගෙන කෝච්චියක් එනකල් බලාගෙන හිටියලු. ඒ අතරතුරේදි ඔහුට අහම්බෙන් වගේ සුනිල් එදිරිසිංහ මහත්තයාගේ සිංදුවක් ඇහිලා.

**'සදාකාලික නොවූ ලෝකේ**
**සදාකාලික ප්‍රේමයක්...**
**සොයා නෙක ගම් දනව් පීරා...**
**ගෙවූ කාලය සිහිනයක්...'**

සිංදුව ඇහුණු තරුණයා එවෙලේ ඒ සිංදුවේ අර්ථය ගැන ගැඹුරින් කල්පනා කරලා. ඊටපස්සේ ප්‍රේමයේ යථා ස්වභාවය තේරුම් අරන් සියදිවි හානිකරගන්න අදහස අතඇරලා. පසුකාලීනව රටේ ප්‍රසිද්ධ පුද්ගලයෙක් වෙච්චි ඔහු සුනිල් එදිරිසිංහ මහත්මයා ඉන්න වේදිකාවකදිම ඒ ගැන කියලා තියෙනවා.

ඔය කිව්වත් වගේ සංගීතය කියන්නේ මහ පුදුමාකාර බලයක් තියෙන විශ්ව භාෂාවක්. ඔය විශ්ව භාෂාවට ලයාන්විත හඬක් අරුත්බර අපූරු පද පේළියක් මුහුවෙලා හැදෙන ගීත වෙලාවකට අධිමාත්‍රා වේදනානාශක විදියට මිනිස්සුන්ගේ ජීවිතවල වැඩකරනවා. ඒ වේදනානාශක ආමන්ත්‍රණය කරන්නේ මිනිස් හැඟීම්වලට. ලයාන්විත හඬවලින් ගැයෙන සුභාවිත ගී අහන්න සමහරු කැමති ඒකයි.

හැබැයි පොඩි ප්‍රශ්නයක් තියෙනවා. අද ගොඩක් සංගීත ප්‍රසංගවල ගී ගැයෙන්නේ ඇඟට දැනෙන්න නටන්න. ඉස්සර තිබුණු සුභාවිත තාලේ හිතට දැනෙන සිංදු කියන සංගීත ප්‍රසංග දැන් ටිකක් අඩුයි. අර කලින් කිව්වා වගේ හදවතට දැනෙන්න සිංදු අහන්න කැමති අයට එතකොට මොකද වෙන්නෙ?

**"හදවතට දැනෙන්න සිංදුවක් අහන්න කැමති අයට තමයි අපි 'ප්‍රාණ' ප්‍රසංගය කරන්නේ."**

ඒ තිසංක ගමගේ. අප්‍රේල් 4 රෑ 7ට බත්තරමුල්ල ජාතික සඳුන් උයනේ 'ප්‍රාණ' කියලා ලයාන්විත ප්‍රසංගයක් තියෙනවලු. ඒ ප්‍රසංගය සංවිධානය කරන්නේ ජනප්‍රිය නිවේදක තිසංක.

**"අපේ රටේ දැන් තියෙන ගොඩක් සංගීත ප්‍රසංගවල තියෙන්නේ කෑගලා, දඟලලා හයියෙන් සිංදු කියන සංස්කෘතියක්. හැබැයි පැත්තකට වෙලා වාඩිවෙලා නිදහසේ සිංදුවක් අහන්න කැමති අයත් ඉන්නවනේ. අන්න ඒ අය වෙනුවෙන් දෙයක් කරන්න ඕනේ කියලා මීට අවුරුදු 4කට විතර කලින් මට හිතුණා. ඒ සිතුවිල්ලේ ප්‍රතිඵලය තමයි 'ප්‍රාණ'. සංගීත ප්‍රසංගයකට වඩා මේක සංගීත චිකිත්සාවක්. 'ගීයකට හිස තියන් සනීපෙට ඇඳි ගන්න එන්න' කියන එකයි 'ප්‍රාණ' ප්‍රසංගයේ තේමා පාඨය. ඉතින් එදාට එළිමහනේ සුළඟයි, හඳ එළියයි විඳින ගමන් හිත පතුලට දැනෙන්න සිංදුවක් අහන්න පුළුවන්. සිංදු එක්ක කතා කරන්න පුළුවන්.**

**මගේ ළඟම හිතවතුන් තමයි මේ වැඩේට මට සහාය දෙන්නේ. 4 වැනිදාට තියෙන්නේ ප්‍රසංගයේ එළිදැක්වීම විතරයි. එතැනින් එහාට 'ප්‍රාණ' එක්ක ලංකාව වටේ ලෝකේ වටේ යන්න අපි බලාපොරොත්තු වෙනවා. සිංදුවලින් හැඟීම්වලට කතා කරන මේ වගේ රහ වැඩක් ලංකාවේ මීට කලින් වෙලා නැහැයි කියලා මම හිතනවා. ඉතින් එදාට හදවතින් සිංදුවක් අහන්න 'ප්‍රාණ' ප්‍රසංගයට එන්න කියලා හැමෝටම ආරාධනා කරනවා."**

දුමාල් වර්ණකුලසූරිය, සුනීර සුමංගල, කල්පනා කාවින්දි, මහේෂා සඳමාලි වගේ හදවතට ආමන්ත්‍රණය කරන්න පුළුවන් ලයාන්විත හඬ පෞරුෂ කිහිපයක්ම එදාට සිංදු කියනවා. 'ප්‍රාණ' සංගීතයට පණ දෙන්නේ ශාලික ඉෂාන්. ප්‍රසංගය මෙහෙයවන්නේ තිසංකමයි. මේ ප්‍රසංගය ගැන විශේෂම කාරණාව කියන්නේ දැන්. ඒ තමයි 'ප්‍රාණ' ඕනම කෙනෙක්ට නොමිලේ නරඹන්න පුළුවන් කියන එක. ඉතින් නොමිලේම ගීයකට හිස තියන් සනීපෙට ඇඳි ගන්න අප්‍රේල් 4 රෑ 7ට සඳුන් උයනට එන්න.

## කෙටි කතාව

# මට ඕනෙ යක්ෂ ගෑනියෙක්

"බලපන්කෝ අලුත් බැච් එකේ අහිංසක, බිම බලාගෙන යන කෙල්ලෝ කීයක් ඉන්නවද කියලා. නැද්ද උනන්දුවක්? අර උඹ සෙට් වෙලා ඉන්න සිංහ ධේනුවට වඩා, මේ මුව පැටික්කියෝ ටික කොච්චර හොඳද?" රසිත් ඇහුවේ සිසිරගෙන්.

"මම අහිංසක කෙල්ලන්ට කැමති නැහැ."
සිසිරගේ ඍජු උත්තරේ නිසා රසිත්ට කැස්සකුත් ආවා.

"මොකක්?"

"මම කැමති එඩිතර කෙල්ලන්ට."


"ඕනෙවට වඩා ෆෝර්වර්ඩ් කෙල්ලො හරි යන්නේ නැහැ මචන්. උන් උන්ට ඕනෙ දේ තමයි කරන්නේ. නිකමටවත් කොල්ලගෙන් අහන්නේ නැහැ. උඹට දවසක තේරෙයි." රසිත් කිව්වේ සිසිරට හිනාවෙන ගමන්.

"අහිංසක කෙල්ලෝ ඇත්තටම අහිංසක නැහැ මචන්. අහිංසකයි කියන ලේබලය වැදිච්ච කෙල්ලන්ගෙන් බහුතරයකගේ පෞරුෂය බිඳලා දලා."

"කවුද?"

"උන්ගේ අම්මලා, තාත්තලා, ආච්චිලා, සීයලා, කිරි කිත්තලා හැමෝම එකතුවෙලා උන්ගේ පෞරුෂය බිඳලා දලා. ඉරක් ඇඳලා ඒක උඩ හිටන් ඉන්න කිව්වම එහෙම හිටන් ඉන්නේ අහිංසකකම නිසා නෙවෙයි. ඇයි මම එහෙම හිටන් ඉන්න ඕනෙ කියලා ආපස්සට අහන්න බැරි තරම් පෞරුෂයක් උන්ට නැති නිසා. මොකද එහෙම ආපස්සට ඇහුවොත් ගුටි කන්න, බැනුම් අහන්න වෙන නිසා." සිසිර කියද්දී රසිත් බයවෙලා වගේ බලාගෙන හිටියා.

"උඹ ඉස්සෙල්ලා කිව්වා නේද ෆෝර්වර්ඩ් කෙල්ලෝ දෙයක් කරන්න කලින් අහන්නේ නැහැ කියලා. ඔව්. අහිංසක කෙල්ලෝ අහනවා ඇති. අයියේ මම අහවල් කඩේට යන්නද? අයියේ මම ලෙක්චර්ස් ඉවර වෙලා ලයිබ්‍රරි එකට යන්නද, අයියේ මම රෑට බත් නොකා කොත්තු කන්නද වගේ චූටි චූටි දේවල් අහද්දි ඒක මුලින් පිරිමියට සතුටක්. ඒත් බන් ජීවිත කාලෙම ඔහොම අහන්න ගියාම මේ මොන වදයක්ද කියලා හිතෙන්නෙත් පිරිමි අපිටමයි. ඊට වඩා හොඳ නැද්ද අයියේ මම ලයිබ්‍රරි එකට යනවා කියලා මැසේජ් එකක් දලා තමන්ගේ පාඩුවේ තමන්ගේ වැඩක් කරගන්න කෙල්ලෙක්?" සිසිරගේ කතාවට රසිත් ඔළුව වැනුවා.



"උඹගේ පැත්තෙන් උඹ හරි. ඒත් මම කැමති අහිංසක කෙල්ලෙක්ට. ඉතින් ඒක වැරද්දක්ද?" රසිත් සැකයෙන් වගේ ඇහුවේ තමන් කැමති ඒ අහිංසක මුහුණ මවාගන්න ගමන්.

"නැහැ. උඹට වරදින්නේ අහිංසක කෙල්ලෙක්ට ආස කරන ගමන් ෆෝර්වර්ඩ් කෙල්ලෙක්ට ආදරේ කරන්න ගියොත්."

"සිසිර උඹේ කතා හරිම සංකීර්ණයි. හොඳයි කියපන් බලන්න මට ඒ අහිංසක කෙල්ල එක්ක ඔය ප්‍රශ්න ඇති නොවෙන විදියට ජීවත් වෙන්නනම් මම මොකද්ද කරන්න ඕනෙ?" රසිත් ඇහුවේ ඇත්තටම කළ යුතු දේ නොතේරෙන නිසා.

"උඹේ කෙල්ලට තමන්ගේ අහිංසක පෙනුම මූණේ විතරක් තියාගෙන, හිතින් එඩිතර වෙන්න උදව් කරපන්."

"ඒ කොහොමද?"

"උඹලා දෙන්නම වැඩිහිටියෝ නිසා ඔය පුංචි පුංචි දේවල් කරද්දී කවුරුවත් කාගෙන්වත් අවසර ගන්න ඕනෙ නැති බව කියපන්. ජීවිතේට බලපාන ලොකු තීරණ ගන්න කලින් මිසක් පුංචි පුංචි තීරණ ගනිද්දි අනිත් එකාගෙන් අහන පුරුද්ද මුල ඉඳලම මකලා දාපන්. ළමා කාලේ ඉඳන් මනසින් හිරවෙලා ඉන්න තැන්වලින් නිදහස් වෙන්න අත දීපන්." සිසිර කියද්දි රසිත් හිස වැනුවා.

"හරියට හරි. කෙල්ලට කවදාවත් ගෙදරින් ඩෙනිම් අඳින්න දීලා නෑ. ඒත් අඳින්න ආසයි කියලා මා එක්ක දැන් කීපසැරයක්ම කිව්වා. එහෙනම් මම කෙල්ලට ඊළඟට අරන් දෙන තෑග්ග ඩෙනිම් කලිසමක්." රසිත් තමන්ටම කියාගත්තේ හරිම සතුටින්.

■ සමාධි ඩයස්

# උගත් පාඩම් කොමිසමට අලියෙකුගෙන් නිර්දේශයක්



අවස්ථාව වනවිටත් ඇය ගඟේ සැඩ ජලපහරින් බේරීමේ සටනකය. සිදුවීම ඇසූ මහාචාර්යවරයා ගොළු විය. ඇගේ ලේ වතුර වෙන පණිවිඩයක් ලද විට මොනවා කියා කියන්නද? දෙවියන් බුදුන් සිහි කරමින් තරුණ වෛද්‍යවරියගේ දිවිය රැකේවායි පතනවා හැර කරන්නට දෙයක් ඔහුට නැත. තත්පර, මිනිත්තු ක්‍රමයෙන් ගෙවී ගියේය. එහෙත් මහාචාර්ය දංගොල්ලගේ මනසට කිසිඳු නිදහසක් නැත. ගෙවෙන තත්පරයත් ඔහුට මහා දිගු වූවාට සැක නොවේ. අඩ පැයක් පමණ ගතවෙද්දී තවත් ඇමතුමකි. මහාචාර්ය දංගොල්ලගේ ඇඟට ලේ ටිකක් ඉනුවේ එවිටයි. තරුණ පශු වෛද්‍යවරිය කෝප වූ අලියාගෙන් දිවි ගලවාගෙන තිබේ. ඇයට සිදුව ඇත්තේ සීරීම් තුවාල පමණි. අලියා හා ගඟේ දියකෙළිය හමාර කර ගොඩට පැමිණි ඈ ස්නානය කර ඇඳුම් මාරු කරගත් බවත් සියල්ල යහපත් අයුරින් විසඳුන බවත් මහාචාර්ය දංගොල්ල දැනගත්තේය. එය මනසට සහනයකි. වෛද්‍යවරියගේ දිවි රැකීම ගැන හෙතෙම සියලු දෙවි දේවතාවුන්ට ස්තූති කළේය. ඒ ඈ වෙනුවෙන් කිලෝමීටර ගණනක් එපිට සිට කිරීමට කිසිවක් ඔහුට නොතිබූ නිසාම විය හැකිය. පේරාදෙණියට යළි පැමිණි තරුණ වෛද්‍යවරිය මාස කිහිපයක් ගතවන තෙක්ම අලි හා ගනුදෙනුව ප්‍රතික්ෂේප කළාය. අලියකු හා ගඟේ බැස උගත් පාඩම තදින්ම ඇගේ මතකයේ තිබීම ඊට හේතු වන්නට ඇත.



තොරතුරු:
**මහාචාර් අශෝක දංගොල්ල**
(පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

හොඳ ගුරුවරයකු වන්නේ නම් දක්ෂ ගෝල පරම්පරාවක් බිහිකළ විටය. රට පුරා අලි ඇතුන්ට ප්‍රතිකාර කළ අලි වෙදැදුරෙකු වූ මහාචාර්ය අශෝක දංගොල්ලද එවැනි ගෝල පිරිසක් බිහි කර ඇත. හෙතෙම ගහෙන් ගෙඩි එන්නා සේ ගෝලයින්ට රාජකාරි පැවරීමට සමතෙකි. කල්යල් බලා නිසි අවස්ථාව එළැඹි වහාම ඔහු ගෝලයා රාජකාරියට යොමු කරයි. ඇතැමුන් රාජකාරිය ගැන දැනගන්නේත් අදාළ ස්ථානයට ගිය විටයි. එනිසා මහාචාර්ය දංගොල්ලගේ ගෝලයින්ට ඕනෑම වේලාවක සූදානම් ශරීරයෙන් සිටීමට සිදු වේ.

අලි ඇතුන් හා බැඳුණ විවිධ පරේයේෂණ කිරීමට මහාචාර්ය අශෝක දංගොල්ල කිසිවිටෙකත් පසුබාන්නේ නැත. අලි සම්බන්ධවද අලුත් අලුත් දෑ සොයා යෑමට හෙතෙම බොහෝ සේ ඇලුම් කළේය. දිනක් පරීක්ෂණ කටයුත්තක් වෙනුවෙන් අලින් කිහිපදෙනෙකුගේ රුධිර සාම්පල එක්රැස් කිරීමට ඔහුට අවශ්‍ය විය. ඒ සඳහා යෙදවීමට සුදුසු ගෝලයකු ගැන මහාචාර්ය දංගොල්ල කල්පනා කළේය. තරුණ සහ නවක පශු වෛද්‍යවරියක ඔහුට සිහිපත් විය. සිය විෂය පිළිබඳ විදෙස් පුහුණුවකින් පසු ඈ දිවයිනට පැමිණ වැඩි දිනක් ගතවී නොතිබිණ. වැඩේට ඈ කදිමට ගැළපෙන්නීය. ඒ අනුව තරුණ සහ නවක පශු වෛද්‍යවරිය කෑගල්ල ප්‍රදේශයට පිටත් කර යැවීමට මහාචාර්ය දංගොල්ල පියවර ගත්තේය.

පැය දෙකක පමණ කාලයක් ගතවිය. අනතුරුව සිය ජංගම දුරකතනයට පැමිණි ඇමතුමෙන් මහාචාර්යවරයා හෝන්දු මාන්දු වී ගියේය. පණිවිඩය භයානකය. ඉන් කියැවුණේ මහාචාර්යවරයා කෑගල්ලට යැවූ පශු වෛද්‍යවරිය අලියෙකුගේ උදහසට ලක්ව සිටින බවයි. එම අලියා ගඟට බැස සිටිද්දී වෛද්‍යවරිය රුධිර සාම්පල ගැනීමට උත්සාහ දරා තිබේ. නිදහසේ වතුර ටිකක් නා ගැනීමට ඉඩ නොදෙන තරුණිය කෙරෙහි අලියා කෝප ගන්නට ඇත. එකෙනෙහිම වෙදැදුරුවරිය පරලොව යැවීමට අලියා උත්සාහ දරා ඇත. අලියාගෙන් ගැලවුණද මහාචාර්යවරයාට දුරකතන ඇමතුම ලැබෙන

පොලී නැතුව සල්ලි බෙදන....
ලංකාවේ ලොකුම අවුරුදු තෑග්ග

අප්‍රේල් මාසයේ අවුරුදු කන්න
පොලී නැතුව රන් ණයක් ගන්න
සැඟවුනු ගාස්තු කිසිවක් නෑ
ඉහළම ආරක්ෂාව සමඟින්
මෙදා අවුරුද්දේ හදවතේ
ගණුදෙනුව

පොලිය 0%

" ඔබේ වටිනා රන් භාණ්ඩය උකස් කර
ලබා ගන්නා මුදල පමණක් නැවත ගෙවන්න "


Asia Asset Finance

රන් ණය ලොවේ පෙරළිකාර
පෙර ගමන්කරුවා
දැන්ම අමතන්න

| | | | |
|---|---|---|---|
| කොළඹ | 0771 408 547 | මීගමුව | 0766 227 056 |
| හෝමාගම | 0778 330 346 | ගම්පහ | 0779 230 549 |
| පස්සර | 0772 700 002 | කළුතර | 0776 167 149 |
| කොටහේන | 0702 539 382 | හලාවත | 0779 256 191 |
| වැල්ලවත්ත | 0710 870 686 | මාතර | 0705 979 237 |
| ග්‍රෑන්ඩ්පාස් | 0742 379 739 | ගම්පොල | 0710 870 735 |
| මොරටුව | 0766 227 059 | නාවලපිටිය | 0710 870 706 |
| පානදුර | 0767 952 286 | හැටන් | 0778 790 372 |
| වෙන්නප්පුව | 0710 869 378 | කෑගල්ල | 0703 583 363 |
| ගාල්ල | 0705 979 274 | ත්‍රිකුණාමලය | 0771 201 854 |
| කුරුණෑගල | 0766 227 061 | පුත්තලම | 0771 201 861 |
| දිගන | 0778 156 738 | මහියංගනය | 0771 201 862 |
| බේරුවල | 0740 920 356 | වත්තේගම | 0742 551 103 |
| මතුගම | 0771 201 860 | හපුතලේ | 0760 677 018 |
| මොණරාගල | 0771 201 852 | මාතලේ | 0702 539 389 |
| බදුල්ල | 0771 201 863 | තලවකැලේ | 0710 871 009 |
| කල්පිටිය | 0761 605 803 | රාගල | 0710 870 703 |
| කටුගස්තොට | 0779 476 206 | පූඩළුඔය | 0740 929 541 |
| නාඋල | 0763 226 230 | මස්කෙලිය | 0760 909 822 |
| කන්තලේ | 0742 572 585 | පුස්සැල්ලාව | 0742 531 360 |
| පොතුවිල් | 0771 201 855 | මට්ටක්කුලිය | 0742 127 665 |
| වැලිමඩ | 0778 764 751 | ඇලකන්ද | 0771 201 857 |
| බගවන්තලාව | 0742 588 267 | හාවඑළිය | 0773 394 209 |
| ආගරපතන | 0742 499 563 | | |

*කොන්දේසි අදාළයි

පුරා සරා



# අපිට අවුරුදු අරහං

දැක්කද අර අපේ හාමුදුරුවො කට්ටියක් අලුත් කතාවක් පතුරුවනවා?

**මොකක්ද?**

උන්වහන්සේලා කියනවනේ මේ සිංහල අවුරුද්ද අපිට අයිති එකක් නෙවෙයි කියලා.

**අපිට නැත්නම් කාටද අයිති?**

උන්වහන්සේලා කියන්නෙ මේක කාලිංඝ මාඝට අයිති අවුරුද්දක් කියලා.

මාත් ඔය කතාවනම් අහලා තියෙනවා... ඇත්තටම ඔය කියන විදියට ඕක අයිති කාලිංග මාඝට කියමුකෝ. මේක ආවෙත් එයාගේ ආක්‍රමණයත් එක්ක කියමුකෝ. ඒත් මොකක්ද ඉතින් අවුරුද්ද සමරන එකේ ඇති වැරැද්ද? ඒකෙන් කාටවත් අවැඩක් වෙන්නෙ නෑනේ.

**ඒකම තමයි මගෙත් අදහස. අවුරුද්දෙ ජාතකය හොය හොය ඉන්නෙ නැතුව ඒක ජාතික සංස්කෘතික මංගල්‍යයක් බව දැනගෙන සමරන එකයි කරන්න ඕන.**

හැබැයි ඉතින් අපි එහෙම හිතුවට එහෙම හිතන්න බැරි කට්ටියකුත් ඉන්නවා.

**කවුද ඒ?**

එක කොටසක් තමයි අපිට ආගමක් නෑ කියලා නිරාගාමික වෙන්න හදන අය සහ අපි සර්ව ආගමිකයි කියන අය. අනිත් කොටස තමයි ඔය චාරිත්‍ර වාරිත්‍ර අපිට දිරවන්නේ නෑ. අපි ඕවට නෑ කියලා මෝඩ විදියට රැඩිකල් වෙන්න හදන සෙට් එක.

හරියටම හරි. හැබැයි ඔය දෙගොල්ලොන්ට ප්‍රශ්නෙ තියෙන්නේ අවුරුද්ද එක්ක නෙවෙයි.

**එහෙනම්?**

සංස්කෘතිය එක්කයි ප්‍රශ්නෙ තියෙන්නේ. උන් ගරහන තරමක් ගරහන්නෙ සංස්කෘතියට. මේ අවුරුද්ද කියන එකත් ඇත්තටම පරම්පරා ගාණක් පැවතගෙන ආපු සංස්කෘතික මංගල්‍යයක් නිසා උන්ට අවුරුද්ද අරහං.

ඒ වුණාට බලන්න මිහිඳු හාමුදුරුවො වුණත් ලංකාවට වැඩලා දේවානම්පියතිස්ස රජතුමාගෙන් පටන්ගෙන හතරවරිගෙටම බණ දෙසුවට උන්වහන්සේ සංස්කෘතිය අකාමකා දන්න හැදුවා කියලා ඉතිහාසෙ කොහේවත් සඳහන් වෙලා නෑනේ. පැවතිච්ච සංස්කෘතියට අලුත් දර්ශනයක් එකතු කරලා, ඒකත් එක්ක ඉස්සරහට යන්න අලුත් අවස්ථාවක් හදලා දීපු එකනේ උන්වහන්සේ කළේ. ඒකනේ මේ බුදුදහමේ තියෙන විශේෂත්වයත්.

එහෙව් එකේ සමහර ආරණ්‍යවාසී ස්වාමීන්වහන්සේලාගෙන් පටන්ගත්තම අපි හරි රැඩිකල් කියලා හිතාගෙන ඉන්න උපාසක සෙට් එක මේ සිංහල අවුරුද්ද එක්ක පිරිමහන්න හදන තරහ මොකක්ද කියල මට නම් තේරෙන්නෙ නැ. ඇත්තටම ඔය කියන විදියට අවුරුදු සමරන එක, අවුරුද්දේ නැකත් ඉෂ්ට කරන එක මිත්‍යාදෘෂ්ටිකයි නම් අවුරුදු චාරිත්‍රවලට කලින් ගරහන්න තව ඕනතරම් දේවල් අපේ රටේ තියෙනවා.

සිංහල අලුත් අවුරුද්ද කියන්නෙත් තව එක දවසක් විතරයි කියන ගොඩක් දෙනෙක්, මිනිස්සු කේන්දර සහ ජ්‍යෝතිෂ්‍යකාරයො පස්සේ දුවන දිවිල්ල ගැන කට හොලවන්නෙ නෑනේ. තවමත් සමහර ආරණ්‍යවල පිරිමි දරුවො මහණ කරගන්නෙ කේන්දර බලලා. ඒවා මිත්‍යාදෘෂ්ටික නොවී නැකතට වැඩ අල්ලන එකයි නොනගතය වෙලාවට වැඩ අතාරින එකයි විතරක් මිත්‍යාදෘෂ්ටික වෙන්නෙ කොහොමද?

අනිත් එක මිනිස්සු සුබ වැඩකට අතගහද්දි නැකතක් බලන එක අපි විවේචනය කරන්න යන්නේ නෑනේ. ඒක ඒ මිනිස්සු පුරුදු වෙච්ච විදිය. කේන්දරේ ඔළුව උඩ තියාගෙන හණමිටිය කරේ ගහගෙන යන්නෙ නැතුව මනුස්සයෙක් අහිංසක විදියට නැකතක් බලලා වැඩක් පටන්ගත්තා කියලා ඒකෙන් අපි කාටවත් වරදක් වෙන්නේ නෑ. ඒ වගේම තමයි අවුරුද්දේ නැකත්, චාරිත්‍ර වාරිත්‍ර ඉෂ්ට කළා කියලා කාටවත් නිවන් දකින්න බැරි වෙන්නෙත් නෑ. නැකැත් විශ්වාස නොකළ පලියට පරම්පරා ගාණක් මුළු රටක් ජාතියක් එකට එක්කාසු වෙලා සමරපු මේ මහ සංස්කෘතික මංගල්ලෙ හෑල්ලුවට ලක් කරන්න අපිට සාදාචාරාත්මක අයිතියක් නෑ.

**තවමත් සමහර ආරණ්‍යවල පිරිමි දරුවො මහණ කරගන්නෙ කේන්දර බලලා. ඒවා මිත්‍යාදෘෂ්ටික නොවී නැකතට වැඩ අල්ලන එකයි නොනගතය වෙලාවට වැඩ අතාරින එකයි විතරක් මිත්‍යාදෘෂ්ටික වෙන්නෙ කොහොමද?**

අනික මේ විදියට සාමූහිකව එකතු වෙලා සමරන උත්සවවලදී අපේ සාමූහික විඥ්ඥාණය වැඩෙනවා කියලා මනෝ විද්‍යාවෙන් තහවුරු කරපු බව මං අහලා තියෙනවා.

වෙන්න පුළුවන්. එහෙම වැඩකටවත් සම්බන්ධ නොවී විහින් හුදෙකලා වෙන කට්ටිය තමයි පස්සේ ඩිප්‍රෙෂන් කිය කිය මනෝ වෛද්‍යවරු පස්සේ දුවන්නෙ.

අනිත් එක, අවුරුද්දෙ එක දවසක් හරි එකම වෙලාවකට වැඩ අතහරින, එකම වෙලාවකට ලිප ගිනි මොලවන, එකම වෙලාවකට ආහාර අනුභව කරන රටක් ලෝකෙ කොහේහරි තියෙනවා කියලා අහල තියෙනවද?

**ලෝකෙ කොහෙවත් එහෙම රටක් නෑ.**

එහෙව් රටක ඉපදෙන්න වාසනාව තිබුණාට එදා දවසෙත් තර්ක විතර්ක කර කර, නැකැත් කියලා දෙයක් නෑ, අවුරුද්ද මිත්‍යාදෘෂ්ටිකයි කිය කිය ඉන්න එකම මොන අවාසනාවක්ද?

අනිත් එක මේක සිංහල, දෙමළ අලුත් අවුරුද්ද කියලා කිව්වට බර්ගර්, කතෝලික උදවියත් අවුරුද්ද දැට හරි කැමැත්තෙන් මේ චාරිත්‍ර ඉෂ්ට කරනවානේ.

**ඔව්. හරියට අපි නත්තල් සමරනවා වගේ.**

ඒ විදියට මුළු රටක් ජාතියක් එකට එකතු වෙලා ආගම් භේද, ජාති භේද නැතුව සමරන මේ ජාතික මංගල්ලෙ පැත්තකට දාන එකෙන් වෙන්නෙ අපිත් නිකන් ඔහේ පාවෙන සරුංගල් ගාණට වැටෙන එක විතරයි. ඒ නිසා මේ අවුරුද්දෙවත් ඔය රැඩිකල් වීම පැත්තක තියලා කට්ටියම එකතුවෙලා අවුරුද්ද සැමරුව නම් තමයි හොඳ.

එහෙනම් ලබන්නා වූ අවුරුද්ද සුබ අලුත් අවුරුද්දක් වේවා!

පුරා

ධරණී

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්

අංක 91, විජේරාම මාවත, කොළඹ 07.
දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය
0112 127204
දැන්වීම් අංශය
0112672601, 0112672603, 0761393811
ෆැක්ස් 0112 673 451

ධරණී

පුවත් පත නිවසටම
ගෙන්වාගන්න අමතන්න
076 1367 623

# පෞරුෂ ආබාධ personality disoders

අනුන්ට තියා තමන්ටවත් හඳුනාගන්න බැරි අතිශය වැදගත් ලිපියක් ඔබ දැනුවත් වී අප ආදරැති සමාජයටත් දෙමු. පුද්ගලයකුගේ චර්යා රටා පෞරුෂ ආබාධයන් වල ගැබ්ව ඇත. පෞරුෂ ආබාධ යනු පුද්ගල සබඳතා පවත්වා ගෙන යාම සහ අන් අය සමග කටයුතු කිරීමට ඇති අපහසු බවයි. බාහිර ලෝකයට ඔබ කවුදැයි විනිවිද දැනෙන්නේ ඔබේ පෞරුෂය තුළිනි. පෞරුෂය කඩයකින් කමිස මිලදී ගන්නා ලෙස කළ නොහැකිය. එයට මනෝ විද්‍යාත්මක හේතු ඇත. අපි ජීවිතේ එක වතාවක් හෝ මේ ආබාධ සහිත පුද්ගලයන් සමග කටයුතු කර ඇත.

එසේ කිරීමේදී ගැටලු වලටද මුහුණ පා ඇත. එය නිවසේ, සේවා ස්ථානයේ, රෝහලේ, බැංකුවේ, කඩයකදී, සුපිරි වෙළඳ සැලකදී, නේවාසිකාගාරයේදී, පන්සලේ, බසයේ, පෝලිමකදී සිදු විය හැක.

**ලක්ෂණ:-**

- පෞරුෂ ආබාධ ඇත්තන්ට සැහැල්ලුවෙන් යාළු මිත්‍රකම් පවත්වා ගෙන යාමට නොතේරේ.
- තමාට අනන්‍ය වු හැසිරීම් රටාවකට යොමු වී සිටී.
- අවස්ථාවට අනුව හැඩ ගැසෙන්නට, ඊට අනුගත වන්නට අපහසුය.
- බාහිර ලෝකයේ දී ඉතා කරුණාවන්ත, විනීත ආචාරශීලි, වන ඇතැම් පුද්ගලයන් සිය නිවසේ දී තම සමීපතමයන්ට ඉතා ආවේගශීලිව කතා කරයි, අකාරුණිකව හැසිරෙයි, රෞද්‍ර වෙයි, පරුෂ වචන තෙපලයි. මෙය antisocial personality disorder ලෙස හැඳින්වෙයි.
- බොහෝ දෙනා මෙම ආබාධ සහිත පුද්ගලයන් ගේ හැසිරීම් රටාවට අකමැතිය. ඔහු ඇය සමග කාලය ගත නොකරයි.
- හැඟීම් මවා පායි.
- අනෙකාව වරදවා වටහා ගනියි.
- අනෙකා දෙස වපර ඇසින් බලයි.
- ස්වයං දැනුවත් බව ඉතා අඩුයි.
- තමාට රෝගී තත්ත්වයක් තිබෙන බව පිලි නොගනියි.
- අනෙකා මතම වරද පටවයි.
- වෘත්තීය ජීවිතය අසාර්ථකයි.
- අනවශ්‍ය මැදිහත්වීම් වැඩිය.
- චිත්තාවේග හඳුනාගත නොහැකිය.
- චිත්තාවේග සමග කටයුතු කිරීමටද නොහැකිය.
- කණ්ඩායමක් ලෙසද කටයුතු කළ නොහැකිය.
- බොහෝවිට මුරණ්ඩු ලෙස තමාගේ හැසිරීම් රටාවක කොටු වී සිටියි.
- නොසැලකිලිමත්ය.
- තමා අතින් වන අඩුපාඩුව කල්පනාවට නොගනියි.
- වැඩ කිරීම කෙසේ වෙතත් තරහෙන් පිපිරෙමින් එහෙමෙහෙ යයි.
- ගැටළුවකදී සාමකාමී විසඳුමකට එන්නෙ නෑ
- මෝහය හා තණ්හාව අධිකයි.

මේ ලිපියෙන් වර්තමාන සමාජයේ දිවි ගෙවන අපට පුද්ගලයන් පිළබඳ මනා අවබෝධයක් ලබා ගනු ඇතැයි සිතමි.මේ තත්ත්වයන් පැවතීම මිනිස් ජීවිතයට අහිතකරය. ඒ සඳහා මනෝ විද්‍යා උපදේශනය හා ඇතැම් විට මනෝ වෛද්‍ය ප්‍රතිකාරද ඇවැසි වේ. මෙයින් යම් තරමකින් පාලනය කර ගත හැකි නමුත් 100% ක් සුව කළ නොහැක. මට නම් මේ ක්ෂේත්‍රයෙදී මේ චර්යා ඇති පුද්ගලයින් සිය ගනන් හමු වී ඇත.

මෙලොව මනුෂ්‍යයන් ලෙස උපත ලද අපි සතුටින් සුවෙන් සිටීමට හැකි අයුරින් ප්‍රජාවට යම් මෙහෙයක් කිරීමට උත්සුක වීම ශ්‍රේෂ්ඨ ගුණාංගයකි.



භද්‍රා ජී. කිරින්ගොඩ
ළමා හා මානසික රෝග පිළිබඳ උපදේශන නිලධාරිනී.
කුරුණෑගල

චැනල් සේවාවෙන් හමුවිය හැක
077 5 736 446
https://www.facebook.com/Badragkiringoda




අපේ පුංචි නංගිලා මල්ලිලාට දැන් පෙර පාසලේ පටන් ශිෂ්‍යත්වය දක්වාම හරිම පිළිවෙළට ඉගෙන ගන්න

පාඩම් සඳහා මාර්ගෝපදේශ නිර්දේශිත පිංතූර පොත් දරුවන්ගේ නිපුණතා වර්ධනය පෙන්වයි

මාසික අධ්‍යාපනික පුවත්පත් 6 ක්

අප්‍රේල් කලාපයන් දැන් වෙළෙඳපොළේ

අවුරුදු උත්සවය වෙනුවෙන් සැකසූ පින්තූර කොළයක් සමඟ

විශේෂ ඇණවුම් සඳහා විමසන්න 076 2568348
දැන්වීම් සඳහා විමසන්න ශෙහාන් - 076 1393811

දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන් , සරසවි පොත්හල් සහ අනෙකුත් පොත්හල්වලින් මිලදී ගතහැක



අද 'ධරණී' කවරය හැඩ කරන්නේ සුන්දර මනාල යුවලක්. ඒ වෙන කවුරුත් නෙමෙයි 2020 වර්ෂයේ ලෝක විවාහ රූ රැජින කිරුළ දිනූ කැරොලයින් ජූරි සහ ඇගේ සැමියා නිශාන්ත දීපාල්. කවදාවත් නැතිව 'ධරණී' මනාල යුවලක් දරාගෙන ඉන්නේ ඇයි කියලා හිතුණා නේද? ඒක බොහොම විශේෂ කතාවක්.

ඒ කතාව මෙහෙම පටන්ගන්නම්. ලෙයිනි ජෝන්ස් අවුරුදු 25ක ඇමරිකානු තරුණියක්. ලෙයිනිගේ ප්‍රේමවන්තයා සැමුවෙල්. අවුරුදු ගාණක සම්බන්ධයකට පස්සේ මේ යුවල විවාහවෙන්න තීරණය කළා.

"කැන්සර් එකක් තියෙනවා කියලා දැනගන්නකොට වෙඩින් එකට මාසයයි. මොන දේ වුණත් ප්ලෑන් කරපු විදියටම වෙඩින් එක ගන්න අපි දෙන්නම තීරණය කළා."

වෙඩින් එකට සති තුනක් තියෙද්දි ලෙයිනිගේ කීමෝ ප්‍රතිකාර ආරම්භ කරලා. කීමෝ එකෙන් පස්සේ ඇගේ කොණ්ඩය සේරම වගේ ගියාලු. හැබැයි ලස්සනට මල්වලින් හිස සරසලා ලෙයිනි ලස්සන මනාලියක් වුණා. ඒ විතරක් නෙමෙයි ධෛර්යවන්ත මනාලියක් විදියට ඇගේ විවාහ මංගල්‍යයේ ඡායාරූප සමාජ මාධ්‍යවල පවා ...වමාරු වුණා. ඇය මේ හරහා අනිත් අයට හයියක් වුණා ... හොඳ පණිවිඩයක් දුන්නා කියලයි ගොඩක් අය කිව්වේ.

මේ සිදුවීම වුණේ ඇමරිකාවේ. හැබැයි අපේ රටේ විවාහ වෙන්න ඉන්න යුවතියකට පිළිකාවක් හැදුනොත්?

පිළිකාවක් හැදිලා කියලා දැනගත්තු හැටියේම අපේ උදවිය සිහින, බලාපොරොත්තු වගේ දේවල් අතහරිනවා. ඉතින් ඒ විවාහය එතැනින්ම ඉවරයි. ඇත්තටම පිළිකාව නිසා යුවතියකගේ ලස්සනම දවස කල්දාන්න ඕනද? ඒ ප්‍රශ්නෙට උත්තරයක් එක්ක සුබ පණිවිඩයක් සමාජගත කරන්න පහුගිය දවසක අපේ ප්‍රවීණයෝ පිරිසක් උත්සාහ කළා.

පහුගිය මාර්තු 21වැනිදා කොළඹ හිල්ටන් හෝටලේ 'Celebrity Designer Wedding Show' කියලා ලොකු විවාහ ප්‍රදර්ශනයක් තිබුණා. මේක සංවිධානය කරලා තිබුණේ 'Bride and Groom' සඟරාවේ ප්‍රධාන විධායක නිලධාරී ප්‍රමිත් මල්ලවාරච්චි. ඉන්දිරා කැන්සර් ට්‍රස්ට්, Triad වෙළඳ දැන්වීම් ප්‍රචාරක ආයතනය වගේම රූපලාවණ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් රැසක්ම මේ වැඩේට ඔහුත් එක්ක එක්කාසු වෙලා හිටියා. කොණ්ඩේ නැති යුවතියකටත් ලස්සන මනාලියක් විදියට හැඩවෙන්න පුළුවන් කියන එක උපහැරණෙන්ම පෙන්වන්න ඔවුන් ජටා බැඳගත්තු මනාලියන් තුන්දෙනෙක්ව ඉදිරිපත් කළා. අර ඉහතින් කිව්වා වගේ අද 'ධරණී' කවරය සරසන්නේ එයින් එක මනාල යුවලක්.

පිළිකාවක් හැදුණු යුවතියකට ඔවුන් දීපු ඒ පණිවිඩය ගැන කතා කරන්න 'Celebrity Designer Wedding Show' එක පිටිපස්සේ ඉන්න පිරිස සමඟ අපි කතා කළා.

INDIRA CANCER TRUST
ඉන්දිරා පිළිකා භාරය
Unveil
ඇණවුම් කිරීමට හෝ
සහයෝගතාවයට අමතන්න
0773 709 775
www.unveil.indiracancertrust.org

# පිළිකාව පස්සෙන් ආවත් ඔබ ඉස්සරහට යන්න

## කොණ්ඩේ නැති අයටත් දැන් ලස්සන මනාලියක් වෙන්න පුළුවන්




**ප්‍රමිත් මල්ලවාරච්චි**
**ප්‍රධාන විධායක නිලධාරී/කළමනාකාර සංස්කාරක**
**Bride and Groom සඟරාව**
**'Celebrity Designer Wedding' දැක්මේ සංවිධායක**

අපි මුලින්ම කතා කළේ 'Celebrity Designer Wedding Show' සංවිධායක ප්‍රමිත් මල්ලවාරච්චිට. මේ උතුම් කර්තව්‍යයේ අදහස ඔහුගේ.

"Celebrity Designer Wedding Show' එක 2009 ඉඳලම කරන වෙඩින් ශෝ එකක්. විවාහ වෙන අයට අලුත් අදහස් ගන්න වගේම අපේ විලාසිතා නිර්මාණකරුවන්ට ඔවුන්ගේ නිර්මාණ එළිදක්වන්නත් මේ විවාහ දැක්ම හොඳ වේදිකාවක් වුණා. හැබැයි මේ අවුරුද්දේ වෙනස්ම වැඩක් කරන්න ඕන කියලා මට හිතුණා.

පස්සේ මම ඉන්දිරා කැන්සර් ට්‍රස්ට් එකේ සභාපතිනිය ලංකා ජයසූරිය මහත්මිය එක්ක ඒ ගැන සාකච්ඡා කළා. 'Unveil' කියන සංකල්පය නිර්මාණය වුණේ එතැනදී.

පිළිකාවක් හැදුනහම එතැනින් එයාගේ ජීවිතේ ඉවරයි කියලා තමයි ගොඩක් අය හිතන්නේ. විවාහය කියන්නේ කෙනෙක්ගේ දෙවැනි උපත කියනවනේ. හැබැයි කැන්සර් එකක් හැදුනට පස්සේ ගොඩක් අය විවාහයත් කල්දානවා. එහෙම නැත්නම් කීමෝවලට කොණ්ඩේ ගියොත් කොණ්ඩෙ නැතිව විවාහ වෙන්න බැහැ කියලා හිතනවා.

පිළිකාවක් හැදුනු පලියට හැම මනුස්සයම මැරෙන්නේ නැහැ. පිළිකාව සාර්ථකව පරාජය කරලා සුවවුණු අය ඕනතරම් ඉන්නවා. ඉතින් පිළිකාව නිසා තමන්ගේ ජීවිතේ වැදගත්ම දවසක් කල්දාන්න ඕන නැහැ. කොණ්ඩය නැති වුණත් ඒ දවස ලස්සන කරගන්න පුළුවන් කියන පණිවිඩය දෙන්න විතරක් නෙමෙයි ඒ අයට උදව් කරන්නත් අපි සූදානමින් ඉන්නවා.

'Triad' ඇඩ්වර්ටයිසින් ආයතනය එක්ක එකතු වෙලා තමයි අපි මේ ව්‍යාපෘතිය පටන්ත්තේ. මයිකල් විජේසූරිය, රමනි ෆර්නෑන්ඩෝ, කැරොලයින් ජූරි, පවුසිල් හුසේන්, රොසෑන් ඩයස් වගේ ලොකු පිරිසක් 'Unveil' ප්‍රොජෙක්ට් එක පිටිපස්සේ ඉන්නවා.

'Unveil' සෙග්මන්ට් එක වෙනුවෙන් අපි මනාලියන් තුන්දෙනෙක් ඉදිරිපත් කළා. කැරොලයින් ජූරි, ස්ටෙෆනි සිරිවර්ධන, චන්දි අලුවිහාරේ වගේ ප්‍රවීණ ශිල්පිනියන් මනාලියන් විදියට හැඩවුණා. මනාලියන්ට කොණ්ඩා මෝස්තර වෙනුවට ජටාවලින් ලස්සන හෙඩ් ගියර් දාලා තියෙනවා. කොණ්ඩය නැති මනාලියකට වුණත් මේ විදියට ඇඳලා ආත්මවිශ්වාසයෙන් යුතුව තමන්ගේ ලස්සනම දවසට මුහුණදෙන්න පුළුවන්. එදා ඒ පණිවිඩය සමාජගත වුණා කියලා මම හිතනවා.

පිළිකාව නිසා විවාහ වෙන්න බැරිව ඉන්න කෙනෙක් මේක දැකලා අපේ උදව් ඉල්ලුවොත් ඒ අයට අවශ්‍ය සහාය ලබාදෙන එක තමයි අපේ ඊගාව පියවර. ඒ වෙනුවෙනුත් මේ වෙනකොට අපි සැලසුම් කරගෙන යනවා. ඒ වගේම 'Celebrity Designer Wedding Show' එකෙන් ලැබුණු ලාබය, ඉදිරියේදී ඉන්දිරා පිළිකා භාරයට ලබාදෙන්නත් අපි කටයුතු කරනවා."

## වෛද්‍ය ලංකා ජයසූරිය දිසානායක

**සභාපති/නිර්මාතෘ ඉන්දිරා පිළිකා බාරය**

ඉන්දිරා පිළිකා බාරයේ සභාපතිනිය වෛද්‍ය ලංකා ජයසූරිය දිසානයක මහත්මිය 'Celebrity Designer Wedding Show' ගැන අපිත් එක්ක කිව්වේ මෙහෙම කතාවක්.

"Celebrity Designer Wedding Show' හැම අවුරුද්දෙම කරන එකක්. මේ අවුරුද්දේ මේ මංගල ප්‍රදර්ශනය හරහා ගැඹුරු පණිවිඩයක් සමාජගත කරන්න ප්‍රමිත්ට අවශ්‍ය වුණා. ඉතින් ඒකත් එක්ක විලාසිතා දිගහැරෙන වේදිකාවක පිළිකාව සම්බන්ධ පණිවිඩ කිහිපයක්ම දෙන්නත් අපිට පුළුවන් වුණා. ලංකාවේ පිළිකා සම්බන්ධ වැඩ කරන ආයතනයකුයි රූපලාවණ්‍ය ක්ෂේත්‍රයයි එකට එකතු වෙලා මෙහෙම වැඩක් කරපු පළවැනි වතාව මේක.

පිළිකා රෝගියෙක් කිව්වහම ගොඩක් අයගේ ඔළුවට එන්නේ කොණ්ඩය නැති කෙනෙක්ගේ රූපයක්. පිළිකාවට කීමෝ ප්‍රතිකාර කරද්දි කොණ්ඩය යනවා. ඒක සාමාන්‍යයි. ඒ විදියට කොණ්ඩය ගියාට පස්සේ ගොඩක් අය තමන්ගේ විවාහය කල්දානවා. පිළිකාවක් තියාගෙන විවාහ වුණ කිසිම කෙනෙක් මට මුණගැහිලා නැහැ. විවාහය කියන්නේ මනුස්සයෙක්ගේ ජීවිතේ වැදගත් සන්ධිස්ථානයක්. පිළිකාවක් හැදුනු කාන්තාවකටත් ඒක එහෙමමයි. ඉතින් පිළිකාවක් තියෙනවා කියලා හෝ කොණ්ඩේ නෑ කියලා විවාහය ප්‍රමාද කරන්න අවශ්‍ය නැහැ. 'Unveil' ප්‍රොජෙක්ට් එක හරහා මඟුල් දිනයේදී කොණ්ඩා මෝස්තරය වෙනුවට ලස්සන ජටාවක්, මඟුල් ඇඳුම්, මේකප් ඒ සියලු දේ නොමිලේම නැත්නම් සහනදායී විදියට සපයලා දෙන්න අපි බලාපොරොත්තු වෙන්නේ ඒ නිසයි.

ඒ වගේම 'Celebrity Designer Wedding Show' එකේ සංකේතය වුණේ පියයුරු පිළිකා රිබන් එකක්. කල්තියා හඳුනාගත්තොත් පියයුරු පිළිකාව සම්පූර්ණයෙන්ම සුව කරන්න පුළුවන් කියන පණිවිඩය සමාජගත කිරීමයි ඒකේ අරමුණ වුණේ. මේ කර්තව්‍යයට ඉන්දිරා පිළිකාබාරය සමඟ අත්වැල් බැඳගත්තු හැමෝවම ගෞරවයෙන්, ආදරෙන් මතක් කරනවා. ඒ වගේම සමාජ සත්කාරයක් විදියට මේ වැඩේට අත්වැල් බැඳගන්න කැමති රූපලාවණ්‍ය ශිල්පීන්, ඡායාරූප ශිල්පීන් සහ විවාහ සැලසුම් ශිල්පීන් ඉන්නවා නම් අපිත් එක්ක එකතුවෙන්න ඔවුන්ටත් ආරාධනා කරනවා.

ඒ වගේම කියන්න ඕනේ ගිය අවුරුද්දෙදි අපි ලෝක රූ රැජින කැරොලයින් ජූරි එක්ක 'ජටා' කියන සංකල්පයට අවබෝධතා ගිවිසුමක් අත්සන් කළා. පිළිකාවක් හැදුනු කාන්තාවන් ඔළුවේ ජටාවක් ගැටගහනවා. සමාජයේ ඉන්න ගොඩක් උදවිය මේක දිහා අමුතු විදියට බලනවා. හැබැයි ජටාවක් බඳින එක සාමාන්‍ය විලාසිතාවක් කරන්න පුළුවන් නම් ඒකේ අමුතුවෙන් බලන්න දෙයක් නැහැ. කැරොලයින්ට අවශ්‍ය වුණේ ඒ ජටාව සාමාන්‍යකරණය කරන්න. මේ වගේ දේවල් සාමාන්‍යකරණය කරමු, ඒ සංකල්පය සමාජගත කරමු කියලා මම අපේ අනිත් කාන්තාවන්ගෙනුත් ඉල්ලනවා."

## මයිකල් විජේසූරිය

**ප්‍රවීණ ඇඳුම් නිර්මාණ ශිල්පී සහ විලාසිතා උපදේශක**

'Celebrity Designer Wedding Show' හි මනාලියන් තුන්දෙනාව හැඩකළේ මයිකල් විජේසූරිය. ඉතින් ඒ සද්කාර්යය ගැන ඔහු එක්ක කතා නොකර කොහොමද?

"හැම කාන්තාවක්ම මනාලියක් වෙන්න කැමතියි. හැබැයි පිළිකාවක් හැදුනු කාන්තාවෝ ආදරවන්තයෙක් හිටියත් විවාහය ගැන අදහස අතහැරලා දානවා. පිළිකාවක් වගේ දෙයක් තියෙද්දි විවාහ වෙන්න පුළුවන් නම් ඒ කෙනාගේ ධනාත්මක ශක්තිය වැඩිවෙනවා. ඒක ලෙඩ හොඳ වෙන්නත් උදව්වක්. ඉතින් ඒ අය ගැන හිතලා තමයි අපි මේ 'Unveil' ප්‍රොජෙක්ට් එක කළේ.

ශෝ එකේදි මම මනාලියන් තුන්දෙනෙක් හැඩ කළා. කොණ්ඩය යාන්තමින්වත් නොපෙනෙන්න ඔවුන්ට ලස්සන ජටාවක් බැන්දා. නළල් පටිය, මාල හත දැම්මා. පිළිකාවක් හැදුනු යුවතියක්වත් සාමාන්‍ය මනාලියක් වගේම හැඩ කරන්න අපිට පුළුවන්. අපි ඒක කරන්නේ මුළු හදවතින්ම. ඉතින් කෙස් නෑ කියලා විවාහ වෙන්න දාගෙන හිටපු දින කල්දාන්න එපා. අපිත් එක්ක එකතු වෙන්න. අපි ඒ හැම ප්‍රශ්නයක්ම විසඳලා දෙන්නම්.

රූපලාවණ්‍ය ශිල්පීන් විදියට ඇත්තටම අපිට මේක අමාරු කාලයක්. කොවිඩ් නිසා අපේ ක්ෂේත්‍රය කඩාවැටුණා. ඒ වගේම උද්ධමනයත් අපිට ලොකුවටම බලපාලා තියෙනවා. එහෙම තත්ත්වයක් තියෙද්දිත් පෞද්ගලිකව වියදම් කරගෙන මෙහෙම දේකට සම්බන්ධ වුණේ මේක මගේ යුතුකමක් කියලා හිතුණු නිසා. ඒ වගේම එක ශෝ එකක් කරලා අපි මේක අතඇරලා දාන්නේ නැහැ. පිළිකාවෙන් පීඩා විඳින යුවතියන් වෙනුවෙන් මේ ව්‍යාපෘතිය අපි ඉදිරියටම ගෙනියනවා."

## කැරොලයින් ජූරි

**ලෝක රූ රැජින 2020**

අද අපේ කවරය හැඩ කරන්නේ 2020 ලෝක රූ රැජින කැරොලයින් ජූරි කියලා අපි මුලදි මතක් කළා. පිළිකාව නිසා කොණ්ඩය අහිමිවුණ කාන්තාවන් වෙනුවෙන් 'ජටා' සංකල්පය සමාජගත කරන්න ඇය සෑහෙන වෙහෙසක් ගන්නවා. ඇයත් 'Unveil' පිටිපස්සේ ඉන්න එක හස්තයක්.

"පිළිකා ප්‍රතිකාරයක් විදියට කීමෝතෙරපි කරද්දි හිසකෙස් වැටෙනවා. එතකොට ඉතින් ගොඩක් කාන්තාවන් ඔළුවට ස්කාෆ් එකක් බඳිනවා. එහෙම ඇඳගෙන යද්දි පාරේ ඉන්න මිනිස්සු පිළිකාවක් හැදුනු කාන්තාවක් කියලා අඳුනගෙන අමුතු විදියට ඒ අය දිහා බලනවා. 'Jataa' ව්‍යාපෘතියෙන් වෙන්නේ ස්කාෆ් එක සාමාන්‍ය විලාසිතාවක් කරන එක. පිළිකාවක් නැතත් එදිනෙදා විලාසිතාවක් විදියට ස්කාෆ් එකක් ඇන්දහම ඒක සාමාන්‍ය දෙයක් වෙනවා. ජටා කියන්නේ ලාබ ලබන ව්‍යාපෘතියක් නෙමෙයි.

ඉතින් ජටා එක්ක'Unveil' ප්‍රොජෙක්ට් එකට සහභාගී වෙන්න කියලා මට ආරාධනාවක් ලැබුණා. 'Unveil' සහ 'Jataa' සංකල්ප අතර සමානාත්මතාවයක් තිබුණා. ඉතින් ඒ ආරාධනාව බාරගන්න දෙපාරක් හිතන්න දෙයක් තිබුණේ නැහැ.

පිළිකාවක් හැදුනු පලියට සිහින අත්අරින්න ඕන නැහැ කියන පණිවිඩය සමාජගත කරන්නයි අපට අවශ්‍ය වුණේ. පිළිකාවට එරෙහිව සටන් කරන හැම කෙනෙක්ටම අපේ හදවතින්ම හයියක් වෙන්න පුළුවන් නම් ඒ අය තවත් ශක්තිමත් වෙයි, ධෛර්යමත් වෙයි කියන එකයි මගේ අදහස."

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

ඡායාරූප pulse





# ඒ වසර්යි

**බියංකා නානායක්කාර ලියයි**

**116 කොටස**

තේනුක තෙන්නකෝන් දුටු චතුමිණීගේ දෙතොලේ විසල් සිනාවක් ඇඳුනත් ඔහු සිටියේ කිසිවක් සිතාගත නොහැකිවය. පසුගිය දිනවල සෙනෙහෙලතා මැණිකේට අනන්තවාරයක් කීවේ ගෙදර තියෙන තැනක ඉඟියක් හෝ චතුමිණීට දැනගන්නට ඉඩ තබන්නට එපා කියාය. අම්මා ඒ පොරොන්දුව කඩ කර තිබේ. තේනුකට හිතුණේ ඇරුණු ගේට්ටුව යළි වසා දමා කාරයට නැගී ආපසු යන්නය. තේනුක තෙන්නකෝන් සිතුවිලි සමඟ ගනුදෙනු කරද්දී උතුරායන සතුටෙන් චතුමිණී ඔහු වෙත ආවාය.

**"අයියෝ තේනුක අයියා. ඔයා එනකම් කොච්චරවෙලා ඉඳලද මේ බලාගෙන ඉන්නේ..."**

චතුමිණී දැකුමෙන් හිතේ ඉපදුණ කේන්තිය දෙගුණ වූයේ ළඟටම විත් ඇය බාහුවේද එල්ලුණ නිසාය.

**"ඒ මොනවටද මං එනකම් බලන් ඉන්නේ..? ඊටත් ඔයාට කවුද මෙහෙ එන්න කිව්වේ? කොහොමද ඔයා මේ ගේට්ටුවෙන් ඇතුළට ආවේ..?"**

සෙනෙහෙලතා මැණිකේ ගේ ඇතුළේ ඉන්නා බව දන්නා මුත් ඒ බව නොපෙන්වමින් ඇගේ අතේ ග්‍රහණය දැඩිලෙස ප්‍රතික්ෂේප කරමින් ඔහු අමනාප ස්වරයෙන්ම කීවේය.

**"මං ආවේ නැන්දම්මා එක්ක... ආන් නැන්දම්මා ඔයා එනකම් උඩට වෙලා බලන් ඉන්නවා..."**

තේනුක උඩ බැලුවේය. ඔහු සිතුවේ සෙනෙහෙලතා මැණිකේ සඳැල්ලට වී පහත බලා සිටිනවා කියාය. ඒත් සඳැල්ලේ ඈ පෙනෙන්නට වූයේ නැත. මේ මොහොත වනතුරුත් හදවත පිළිගෙන තිබුණේ අක්කාටත් අයියාටත් වඩා වැඩියෙන් සෙනෙහෙලතා මැණිකේගේ ආදරය ඇත්තේ තමන්ට බවය. ඒත් අම්මා විසින්ම එය බොරුවක් කර තිබේ. කිසිදු නොමැතිව අම්මා කරන මේ හැංගිමුත්තන් සෙල්ලම මොකක්දැයි ඔහුට සිතුණි. අම්මාගේ ප්‍රශ්නය කෙසේ හෝ විසඳගන්නට පුළුවන්කම තිබුණත් ඇය දැන් සමාවක් දෙන්නට බැරි බරපතළ වරදක් කර ඇත්තේය. ඒ නිදහසේ ජීවත් වූ නිවස ඇති තැන චතුමිණීගේ ඇස ගැස්වීමය. ඉතින් අංජනා හා ජීවිතය මෙතැන තවදුරටත් සුරක්ෂිත නැත්තේය. තේනුක තෙන්නකෝන්ට සිතුණේ මේ සියල්ල අම්මාටම දී වහා මේ බිමෙන්ම නික්මී ඔහු පතන ජීවිතය සොයායන්නටය. ඒ නිසා තවත් පමා නොවී මේ මොහොතේම ඔහුට සෙනෙහෙලතා මැණිකේ සමඟ මේ ප්‍රශ්නය කතා කරන්නට ඕනෑ වුණේය. ඒ ගැම්මෙන්ම ඔහු ආපිට හැරී ගොස් කාරයට නැගී වේගයෙන්ම එය හරවා නිවසේ මිදුලට ගත්තේය. කාරය ගත් වේගයට ඇඟ හිරිවැටී ගිය චතුමිණී ඔහු කාරයෙන් බසින්නට පෙර ගේට්ටුව වසා ඇතුළතින් ඉබ්බාද දැමුවාය. ඇය ගේට්ටුව වසා ආපසු හැරෙද්දීත් ඔහු කාරයෙන් බිමට බැස තිබුණේ නැත. ඒ නිසාම චතුමිණී හෙමින් ඔහුගේ කාරය ළඟට ගියාය. තේනුක තෙන්නකෝන් කොතෙක් නපුරුකම් පෑවද චතුමිණීට ඒවා ගානක් නොවීය. ඒ කෙසේ හෝ ඔහු දිනාගැනීමේ බලාපොරොත්තු හිතේ යළි යළිත් ඉපදීම නිසාය. මෙතෙක් වේලා ඔහුත් සමඟ මේ නිවසේ වසන අයුරු ගැන ඇය සිතේ දහසක් හීන මවමින් සිටියාය. ඒ සතුට කොතෙක්දැයි කියනවා නම් පඩිපෙළ බැස පහළට ආවේ සමන්තිනී රාජපක්ෂට ඇමතුමක් ගැනීමේ උවමනාවක් තිබූ නිසාය. එතෙක් ඔහුගේ නිවස ඇත්තේ කොහිදැයි සොයාගන්නට නොහැකිව සිටි චතුමිණීට අහම්බෙන් හෝ මේ උදවුයේ වචනයෙන් මිල කළ නොහැකි අවස්ථාවකි. ඔහු ආවේ සමන්තිනීට ඒ සුබදායි පණිවිඩය ලබාදීත් බොහෝ වේලාවක් ගෙවී ගිය පසුවය.

තේනුක තෙන්නකෝන් තවමත් කාරයෙන් නොබැස්සේ ඇයිදැයි බලන්නට ඇය කාරය වෙත ගියාය. වැසුණු කවුළුවෙන් චතුමිණී රාජපක්ෂ දුටුවේ ස්ටියරින් වීලයට හිස ගසාගෙන රියදුරු අසුනේ සිටින තේනුක තෙන්නකෝන්ය. ඇය අනවසරයෙන්ම කාරයේ දොර අරින්නට හැදුවද එය ඇතුළතින් අගුලුවැටී තිබුණි. ඒ නිසා ඇය පිටතින් කවුළුවට තට්ටු කළාය. තේනුක තෙන්නකෝන් ස්ටියරින් වීලයට හිස ගසාගෙන කල්පනා කළේ අම්මා හා මේ කතාවට මුලපුරන්නේ කොහොමද කියාය. හිතේ ආවේගයට කේන්ති ගත්තද තමන් එක් තැනෙක හිරවන බව මතක්වන්නේ මොහොතකට පසුය. සියල්ල අතහැර ලංකාවට පැමිණියේ ඇය හදවත් රෝගියෙක් නිසාමය. ඉක්මන් ආවේගයට වැඩ කරන්නට යාමෙන් ඇයට කිසියම් නපුරක් වූවොත් මේ කරන කැපකිරීමෙන් වැඩක් නැතුවා සේම, සසර පුරා එය පසුපස එන පාපයක්ද වනු ඇත. මොහොතක් යද්දී තේනුකගේ සිත නිවුණේය. නිය අගින් කවුළුවේ වීදුරුවට තට්ටු කරන චතුමිණී දකිද්දී නිවුණු සිත ඇවිලෙන්නට ගියත් ඔහු එය වළකාගෙන කාරයෙන් බිමට බැස්සේය.

**"අයියෝ... ඔයා නිකම් ලෙඩෙක් වගේ තේනුක අයියා..."**

ඔහුගේ අවුල්වුණු කෙස්රොදක් අල්ලන්නට සැරසෙමින් චතුමිණී කියද්දී තේනුක තෙන්නකෝන් දකුණත දිගුකොට ඇය වැළකුවේය.

**"පොඩ්ඩක් පස්සට වෙලා ඉන්නවද.. වද නොදී..?"**

තේනුකගේ කතාවට චතුමිණී රාජපක්ෂගේ කට ඇද වුණේය.

**"වද නොදී..!? මොනවද තේනුක අයියා ඔයා කතා කරන කැත වචන."**

**"කැත වැඩ කරන අයට කතා කරන්න ඕනත් එහෙම තමයි..."**

ඔහුගේ හිත සැක කළේම අම්මා මේ නිවසට මේ ලෙස ආවේ චතුමිණී ඇයගේ හිත ගිනි තබා වන්නට ඇත කියාය. ඒත් තේනුක කාරයට හේත්තු වුණේ ඇයත් සමඟ තරහත් නැති යාළුත් නැති කතාවකටය. නිවස තුළට යන්නට පෙර සෙනෙහෙලතා මැණිකේ මෙහි ආවේ ඇයිදැයි ඉඟියක් හෝ ඇගෙන් දැනගත හැකි වෙතැයි ඔහුගේ හිත කීවේය

**"මං මොනාද ඔයාට කරපු කැත වැඩේ..?"**

ඇයද ඒ කතාවට අකමැත්තක් නැති බවක් තේනුක තෙන්නකෝන්ට හැඟුනේ ඔහු කොපමණ කේන්ති ගත්තද ඇය කේන්ති තියා කඳුළක්වත් නොහෙලා ඔහු හා කතා කිරීම නිසාය.

**"මට ඇත්ත කියනවා, අපේ අම්මට මං ගැන මොනවද කිව්වේ?"**

**"මං මොනවා කියන්නද?"**

"ඔයා මොනවහරි කියලා අම්මගෙ හිත ඇවිස්සුවේ නැත්තම් එයා මොනවටද මේ හදිස්සියේ මාත් එක්ක තරහවෙලා වගේ ඉන්නේ? දැන් දවස් දෙක තුනකින් හරියට කතා නෑ. හොරෙක් වගේ මට නොකියා අපේ ගෙදර ඇවිත්..."



**"ඒක ඉතින් මගෙන් අහලා වැඩක් නෑ. ආන් උඩ නැන්දම්මා ඉන්නවා. අහගන්න ගිහින්..."**

**"චතු... මට අම්මත් එක්ක ඕන වෙලාවක කතා කළෑකි... මට දැනගන්න ඕනි දේ කියනවා. මාව අයිතිකරගන්න බලාගෙන අම්මට කේලම් කිව්වා කියලානම් වැඩක් වෙන්නෙ නෑ. ඔයාට මං දවසක් කිව්වා නේද, ඔය හිතේ තියෙන ඒවා වෙන්නෙ නෑ කියලා. අම්මට නෙවේ, කාට කිව්වත් මගේ හිත වෙනස් කරන්න බෑ..."**

අඩු හඬකින් මුත් තද ස්වරයකින් ඔහු කීවේ ඇගේ වෑයම නිෂ්ඵල බව දනවන්නටයි.

**"තේනුක අයියේ... ඔයා දන්න දෙයක් කියන්නද මං... මං කැමති දේ කොහොමහරි මං අයිතිකරගන්න කෙනෙක්..."**

තේනුක තෙන්නකෝන්ගේ කතාව ගැඹුරින්ම හිතට දැනුණෙන් ඒ මදිපුංචිකම නිසාම චතුමිණීද නිහඬව නොසිට වචන හරඹ කළාය.

**"මෙච්චර ලොකු ගෙදරක් තියාගෙනනේ අප්පච්චි මට ගෙවල් හොයනකම් ඔයා සද්ද නැතුව හිටියේ... මේ ගෙදර යට තට්ටුවේ මට ඉන්න පුළුවන් කියලා මං නැන්දම්මට කිව්වා..."**

**"ඇත්තද... ඇයි නැන්දම්මා කිව්වෙ නැද්ද ඒ තට්ටුව මං රෙන්ට් කරලා තියෙන්නෙ කියලා..."**

ඇගේ කතාව අවඥාවට ලක්කරමින්ම ඔහු කීවේ ඇගේ කතා මෝඩ කතා ලෙස සලකමිනි.

**"මතක තියාගන්නවා චතු... දන්නවනෙ මගෙත් හැටි, මගෙ නිදහසට බාධා කරන්න ලෑස්තිවුණොත් නැන්දම්මලාට ලේලිලට ඕන නැටුමක් නටාගන්න කියලා මං යනවා ආපහු. මං නැතත් දැන් ඔය අපේ අම්මට හොඳ ලේලියෙක් හම්බවෙලා ඉන්නේ. එයාට බැරියෑ සෙනෙහෙලතා මැණිකෙව හොඳට බලාගන්න..."**

තේනුක කීවේ ඇත්තටම සිතේ කරණම් ගහන සිතුවිල්ලය. අම්මා ඒ තරමට චතුමිණීට ආදරේ නම් තමන් ළඟ නැතැයි ඇගේ හිතට පාලුවක් තනිකමක් නොදැනෙනු ඇත.

**"මං නැන්දම්මා බලාගන්නවා තමා. ඔයා කියන්න ඕනි නෑ."**

චතුමිණී එතැනින් මෑත්වෙමින් කීවාය. සෙනෙහෙලතා මැණිකේ මෙහි ආවේ ඇයි කියා ඉඟියකින්වත් දැනගන්නට නොහැකිවීම ගැන ඔහු සිතේ හිස්බවක් ඇතිවිය. තාමත් උඩට නගින්නට හිතේ කුකුසක් ඇති අනෙක් කරුණ කාමරයයි. අම්මා කාමරය තුළට ගොස් ඇත්නම් මුහුණදෙන්නට සිදුවන්නේ අසීරු මොහොතකටය.

**"මෙතන මාත් එක්ක පැටලෙන්න එපා හැමදේටම බොරුවට. ගිහින් බලන්න. නැන්දම්මා දැන් ගොඩ වෙලාවක ඉඳන් ඔයා එනකම් බලන් ඉන්නේ..."**

චතුමිණී කීවේ ඔහුව ඉක්මනට නිවස තුළට යවන අදහසෙනි. ඇයට ආයෙත් සමන්තිනීට ඇමතුමක් දීමේ උවමනාවක් විය.

**"චතු ඔයා ඉස්සරත් ඔය වගේ... ගිනි තියලා පස්සෙ ඇවිලෙන හැටි බලලා සතුටුවුණා... ඒ ගතිගුණ මෙච්චර ඉගෙනගෙනත් නැති කරගන්න බැරිවුණ එක ගැනනම් දුකයි..."**

තේනුක තෙන්නකෝන් අමනාපයෙන්ම එතැනින් මෑත් වී අඩියට දෙකට පඩිපෙළ නැග නිවස තුළට ගියේය. ඔහු බලාපොරොත්තු වූයේ අම්මා විසිත්ත කාමරයේ පුටුවකට වී හිඳගෙන ඇත කියාය. ඒත් එහි ඇය වෙනුවට ඔහු ඈත තියා දැක්කේ පුටුවක හිඳගෙන ඇලයට හිස හරවන් රූපවාහිනිය දෙස බලා හිඳින තරුණියකි.

**"මොනවද මේ වෙන්නේ අම්මා..?"**

ඔහු ඔහුටම ඇසෙන්නට කියාගනිමින් හඬ නගා සෙනෙහෙලතා මැණිකේට කතා කළේය. ඒ හඬට ගැස්සුණු තරුණිය හිස හරවා බලද්දී ඔහුන්ගේ සිව්නෙත් එකට හමුවුණේය.

**"අක්කා...!!!"**

එතෙක් හිතේ තිබූ සියලු තරහ අමනාප තේනුකගේ හිතෙන් වාෂ්ප වී ගියාසේ දැනුණි. ජපානයේ සිටි අක්කා මේ මොහොතේ සිය නිවසේ විසිත්ත කාමරයට ආවේ කොහොමදැයි සිතමින් ඔහු ළඟට දිව ආ සහෝදරියව බදාගත්තේය.

ලබන සතියට

# හාදු යන්තරෙන්

## මා ඔබ සිපගමි හමුවිය නොහැකි නිසා



2013 අවුරුද්දේ තායිලන්ත ජාතික යුවලක් වන එක්කචයි සහ ලක්සනා අපූරු ලෝක වාර්තාවක් පිහිටෙව්වා. ඒ පැය 58යි මිනිත්තු 35යි තත්පර 58ක කාලයක් පුරාවට ඔවුන්ගේ තොල් සිප ගැනීමෙන්. ඒක ලෝක වාර්තාවක් වුණේ ලොව දිගම හාදුව විදියට. මේ අතරේ පසුගියද කැනේඩියානු සහ දකුණු අප්‍රිකානු ජාතික යුවලක් වන බෙත් නීල් සහ මයිල්ස් ක්ලූටියර් කියන දෙදෙනා ලෝකයේ දිගම දිය යට හාදුව දීමෙන් ලෝක වාර්තාවක් පිහිටෙව්වා. ඒ මාලදිවයිනේ නිවාඩු නිකේතනයකදි. ඔවුන් ඒ වාර්තාව පිහිටෙව්වේ විනාඩි 4යි තත්පර 6ක් පුරාවට දිය යට කිමිදිලා තොල් සිපගැනීමෙන්. ඉතින් දිගම දිග හාදු ගැන කතා ඔහොම ලියවෙනකොට පසුගිය සතියේ චීනයෙන් ඔය හාදු සම්බන්ධවම හරි අපූරු දෙයක් ගැන අහන්න ලැබුණා. ඒ වෙන මොකවත් නෙවෙයි හාදු යන්තරේ.

චීනය මේ හාදු යන්ත්‍රය හදලා තියෙන්නේ ආදරවන්තයින් වෙනුවෙන්. නිතර දෙවේලේ මුණගැහෙන්න බැරි ආදරවන්තයින්ට මේක පංකාදු උපකරණයක් කියලයි අපිටනම් ආරංචි. මොකද තමන්ගේ සහකාරයා හෝ සහකාරිය කොච්චර දුරක හිටියත් හරියට ළඟ ඉන්නවා වගේ උණුසුම් හාදුවක් දෙන්න මේ යන්තරේ හරහා පුළුවන්ලු. මේක හදලා තියෙනවා කියන්නේ පීඩන සංවේදක සහ නොයෙකුත් සිපගැනීමේ ක්‍රියාකාරකම්වලින් සමන්විත වෙන විදියට. ඉතින් ඒ නිසාම ඒක භාවිතා කරන ආදරවන්තයින්ගේ තොල් මත පීඩනයක්, චලනයක් සහ උණුසුමක් සංවේදනය කරන්න මේකට පුළුවන්. ඒ විතරක් නෙවෙයි සිපගැනීමේදී ඇතිවෙන චලනය වගේම හැඟීම් උද්දීපනය කරන්නත් පුළුවන් වෙන විදියට මේකෙන් යම් යම් ශබ්දත් නිකුත් වෙනවා. ඒ නිසාම මේ වෙද්දිත් හාදු යන්ත්‍රයට ප්‍රේමවන්තයින්ගෙන් ලොකු ඉල්ලුමක් තියෙනවා කියලයි චීන මාධ්‍ය සඳහන් කරන්නේ.

**"දන්නවද මං විශ්වවිද්‍යාලයේ ඉන්න කාලේ තරුණියක් එක්ක ප්‍රේම සම්බන්ධයක් තිබුණා. ඒත් අපි නිතර නිතර මුණගැහුනේ නෑ. මොකද ඇය හිටියේ ගොඩක් දුරබැහැර ප්‍රදේශයක. ඉතින් ෆෝන් විතරයි අපිට තිබුණේ. ආදරේ කරන දෙන්නෙක්ට ෆෝන් එකෙන් ආදරේ කරන්න අමාරුයි. ඔය කාලයේ තමයි මට මෙවැනි උපාංගයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවයක් දැනුණේ. මං හිතනවා අවසානේ ඒකට ගැළපෙනම ක්‍රමයක් හොයාගත්තා කියලා."**

පසුගියද හාදු යන්ත්‍රය ගැන චීන මාධ්‍යයට එහෙම කියලා තිබුණේ 'ජිආන්ග් සෝංන්ග්ලි' (Jiang Zhongli). ඔහු තමයි මේ උපාංගය නිර්මාණය කරන්න මූලිකත්වය අරගත් පුද්ගලයා. චීනයේ රාජ්‍ය මාධ්‍ය ආයතනයක් වන 'Global Times' වාර්තා කරන විදියට ජිආන්ග්ගේ මූලිකත්වය එක්ක චීනයේ තාක්ෂණය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනයක අධ්‍යාපනය ලබන සිසුන් පිරිසකුයි හාදු යන්ත්‍රය නිර්මාණය කරලා තියෙන්නේ. මේක සිලිකන් භාවිතයෙන් නිෂ්පාදනය කළ කෘත්‍රිම මුඛ කුහරයක්. ජංගම දුරකතන යෙදවුමක් හරහා තමයි මේ උපාංගය ක්‍රියාත්මක කරන්න තියෙන්නේ. කොහොමින්හරි වීඩියෝ ඇමතුමක් අරන් හාදු යන්ත්‍රයේ තියෙන මුඛ කුහරය මත දෙතොල් තියලා ආදරේ කරන ඕනෑම කෙනෙක්ට ඇත්තටම දෙනවා වගේ හාදු දෙන්න මේ යන්තරේ හරහා පුළුවන්.

සමහරුනම් කියන්නේ මේ යන්තරේ අසම්මත පෙම් කතාවලට කියාපු උපකරණයක් කියලයි. ඒ වගේම හාදු යන්ත්‍රය පාසල් සිසුන් සහ තරුණ පිරිස් අතර ජනප්‍රිය වීම එච්චර හොඳ දෙයක් නෙවෙයි කියලත් බොහෝදෙනා කියනවා.

හැබැයි කවුරු කොහොම මොනවා කිව්වත් මේ මොහොතේත් හාදු යන්තරේ උණු කැවුම් ගාණට විකුණෙනවා. ඒ ඇමෙරිකානු ඩොලර් 43ක මිලකට. ලංකාවේ මුදලින් නම් රුපියල් දහසයදහකට ආසන්න මුදලක්. චීනයේ මාර්ගගත ක්‍රමය හෙවත් ඔන්ලයින් ක්‍රමයෙන් භාණ්ඩ අලෙවි කරන විශාලතම වෙබ් අඩවියක් හරහා තමයි මේක අලෙවි වෙන්නේ.

**"මමත් ගෑනු ළමයෙකුට ආදරේ කරනවා. මං කවදවත් හිතුවේ නෑ එයාට දුර ඉඳලා කිස් එකක් දෙන්න පුළුවන් වෙයි කියලා. ඒත් මං හාදු යන්ත්‍රයෙන් ඒක කළා. එයාටත් ඒ ගැන පුදුමයි."**

ඒ හාදු යන්ත්‍රයක් මිලටගත් තරුණයෙකුගේ ප්‍රතිචාරයක්. ඔය වගේ ප්‍රතිචාර ගොඩාක් මේ වෙනකොට මේකට ලැබෙනවලු. වැඩේ කියන්නේ චීනයේ පෙම්වතුන් අතර මේ දිනවල තෑග්ගක් විදියට වැඩිපුරම හුවමාරු වෙන්නෙත් මේ හාදු යන්ත්‍රයලු. හැබැයි මේකේ තියෙන 'Kissing Square' කියන විශේෂාංගයකට නම් මේ වෙනකොටත් පොඩි කොක්කක් වැටිලයි තියෙන්නේ. මොකද ඒ විශේෂාංගය හාදු යන්ත්‍රයට ඇතුළත් කරලා තියෙන්නේ උවමනා නම් පෙම්වතා හෝ පෙම්වතිය නොවන නාඳුනන පුද්ගලයයෙක්ට වුණත් හාදු දෙන්න පුළුවන් විදියට. ඒ නිසා මේක අනාගතයේදී ප්‍රේමවන්තයින් අතරින්ම ප්‍රතික්ෂේප වෙන්නත් බැරි නෑ.

■ රුවන් එස්.සෙනවිරත්න

AUTOWHEEL
පවුලේ අවන්හල දැන් විවෘතයි
ශ්‍රී ලාංකීය දිවා ආහාර දැන් ලබාගත හැක
සජීවී සංගීතය සමඟින්

ප්‍රයිඩ් රයිස - සඳුදා
රයිස් ඇන්ඩ් කරි - අඟහරුවාදා
කහ බත් - බදාදා
රයිස් ඇන්ඩ් කරි - බ්‍රහස්පතින්දා
බිරියානි - සිකුරාදා
එකක මිල රු.455/=
AA CEYLON Estd. 1904
ලංකා ඔටෝමොබයිල් සංගමය
40, ශ්‍රීමත් මාකන් මාකර් මාවත, කොළඹ 03.
විමසීම්: 077 - 4369013 ( ක්‍රිෂෝන් )


ඔබ දෛවයට පිටුපායිද.. ?
දෛවය ඔබට පිටුපායිද.. ?
● ජීවිතයේ අතීත සහ වර්තමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
● වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමග හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඔබේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.
හස්ත රේඛා විශේෂඥ
එස්. කෝරළේගේ
520, වාසනා මාවත, කොට්ටාව, පන්නිපිටිය,
සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි
පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.
0112 783172 / 0773 775094

ආදරය නිසා කදුළු සැලූ මට පිහිටවූ එකම තැන
■ පවුලේ ඇති වන සියලුම ගැටලු වලට විසඳුම්
■ මත් කුඩු සුරාව නවතා දැමීමට
■ පෙම්වතා/පෙම්වතිය ලඟා කර ගැනීමට
■ අඹු සැමියන් අතර ආරවුල් වලට විසඳුම්
■ ව්‍යාපාර දියුණුවට හා නොවිකිණෙන ඉඩම් විකිණීමට
■ 2023/2024 සියලු විභාග සමත් වීම සඳහා විමසන්න
■ නිවාස ආරක්ෂාවට හා පවුලේ දියුණුවට
■ රැකියා ලබාගනීමට
■ හැරගිය අය ගෙන්වීමට
■ අයුතු සබඳතා නැවැත්වීමට
ක්ෂණික ඇමතුම් -0777 444908
බිංගිරියේ ගුරු හාමුදුරුවෝ
සමග සේන මහතා 037 22 48 828
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුය)
හමුවීම
සෙනසුරාදා - ඉරිදා
උදේ 8.00 සවස - 3.00 දක්වා
ගමන් මාර්ගය නාරම්මල සිට කුලියාපිටිය පාර, වැවගම හෙට්ටිපොළ කුලියාපිටිය බසයක නැග හොරොම්බා හන්දියෙන් බැස මැටිවල ගෙදර පාරේ මීටර් 50 ඉදිරියෙන් ගුරුගල්ගොඩ මෝලවත්ත කාර්යාලය පිහිටා ඇත.
careteker
— Guru Dewa Shanthi Services —
Post Code No ' 60181
Gurugalagoda "Molawatta"
Horombawa
භාරකාරතුමා
"ගුරුදේව ශාන්ති සේවාව"
තැ. ස අංකය 60181
ගුරුගල්ගොඩ
මෝලවත්ත
හොරොම්බාව
විදේශගත අයගේ රැකියා, ගේ දොර ඕනෑම ප්‍රශ්නයක් සඳහා මුහුදෙන් එතරට බලපාන පරිදි සකසා DHL මගින් ඔබ අතට ඉක්මනින් විසඳුම්
0094 37 22 48828

උගස් තැබූ රත්තරං
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 22 සඳහා ඉහල මිලක්
076 101 88 53
SL PROMO

දැන්වීම් සඳහා අමතන්න
0112 672 601 0112 672 603

දිවයින පුරා නිවෙස් වල නැවතී වැඩ කිරීමට කැමති ගෘහසේවිකාවන් අවශ්‍යයි.

ඉවුම් පිහුම්, පිරිසිදු කිරීම්, දරුවන් බලාගැනීමට හා මහළු හෝ රෝගී වූ අය බලාගැනීමට කැමති අය අමතන්න.



වැටුප රුපියල් 35,000 - 40,000
ආහාර ඇතුළු සියලු පහසුකම් නොමිලේ
072 945 9247

රෝගී, නිරෝගී ඕනෑම සෞඛ්‍ය තත්ත්වයක, ඕනෑම වයස් මට්ටමක වැඩිහිටියන් සඳහා සුවපහසු ආරක්ෂිත නවාතැන්, වෛද්‍ය සහ හෙද පහසුකම්, තනි කාමර, හුවමාරු කාමර, ශාලා ආදී වශයෙන් ඔබේ ගෙවීමේ හැකියාව මත තෝරාගත හැක. A/C කාමර සහිතයි. හදිසි අසනීප හා රෝහල්ගත කිරීමේ කටුයුතු භාරකරුවන් හට බාධාවක් නොවන පරිදි ඉටු කිරීම, රජයේ ලියාපදිංචි ශාඛා ජාලය

ගුරුගේ එල්ඩස් කෙයා පුද්ගලික සමාගම පානදුර.
076 - 55 60 608 / 070 - 44 14 444
070 - 44 41 244 / 076 - 71 44 449

දසක හතක් පුරා ජනතා විශ්වාසය දිනූ ක්‍රිමිරාජ නිවසින් ක්‍රිමිරාජ®

ක්‍රිමිරාජ කරල්ගුලි කුඩා ළමයිගේ සිට වැඩිමහල්ලා දක්වා එක සේ ගුණ දෙන බඩේ කැක්කුමට, බඩ පුරවා දැමීමට, අජීර්ණය, වමනය සියලු බඩේ අමාරුවට

- ක්‍රිමිරාජ මුඛ සෝදනය
- දත් පණුවෝ කෑමට
- මුඛයෙන් දුගඳ හැමීම
- දත් කැක්කුම
- දත් මුල්දියවීම



ක්‍රිමිරාජ නිෂ්පාදන නිසි වගකීමෙන් ලංකාව පුරා, සිංහල බෙහෙත් අලෙවිය සිදුකරන වෙළඳ සැල්වලින් මිලදී ගත හැකිය.



මහාචාර්ය සුමනරත්න අමරතුංග
කළමණාකාර අධ්‍යක්ෂක

ඇම්.ඩී. ලිවේරිස් අමරතුංග
ඖෂධාගාරය
කිරිවත්තුඩුව
ආරම්භය 1949

මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින්
විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න.
නැතහොත් ලිපියක් මගින් විමසන්න.
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි?
ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි?
අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?
මෙන්න!
එයින් මිදෙන්න නිසි මඟක්...

අයුතු සම්බන්ධතා නැවතීම

- නිවාස ආරක්ෂා
- නඩුහබ දිනීමට
- දරුඵල ලබීමට

මත්කුඩු සහ සුරාව

- රැකියා ලබා ගැනීමට
- සියලු විභාය සඳහා
- නොවිකිනෙන ඉඩම් විකිණීමට

- විවාහ පමා අයට
- හැරගිය අය ගෙන්වීම
- අසාර්ථක ව්‍යාපාර දියුණුවට

මාතර වෙද හාමුදුරුවෝ

ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යකට ඇබ්බැහි වූ අයෙක් ද?
එසේ නම් ඉන් මිදීමට අමතන්න.
වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න
අමතන්න 077 362 77 14

හමුවීම
බදාදා, සෙනසුරාදා
පෙ.ව. 8.00 සිට
ප.ව. 3.00 දක්වා

කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

ශාස්ත්‍රවේදී පණ්ඩිත මාතර වෙද හාමුදුරුවෝ
භාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, චන්ද්‍රසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**



**සීතා පොන්නම්පෙරුම**
**ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා**

# ගහේ වැඩ හිටියට දෙයියෝ කරල් ඇහිඳින්න තහංචි නෑ ගොයියෝ

ඉස්සර අපේ ඉස්කෝලෙට හැරෙන පාර කිට්ටුව මහ රූක්ෂ සියඹලා ගහක් තිබුණා. කරල් හැදෙන කාලෙට අහුරු පිටින් සියඹලා ඇහිඳිනවා ඇරෙන්න ඉස්කෝලේ යන්න ළමයින්ට නිච්චියක් තිවුණේ නැහැ.

කුළුබඩුවක් විදියට හැඳින්නුවට සියඹලා කියන්නේ පලතුරක්. රසවල් කීපයක් එක්කාසු වෙලා හැදුනු අමුතු රසයක්නේ සියඹලාවේ තියෙන්නේ. මතක් වෙද්දි කට ඇඹුල් වෙලා කෙල ඉනුවට මොකෝ ඒ රසේට අපි නම් පොඩි කාලේ හරි ආසයි.

සියඹලා ගහක් සාමාන්‍යයෙන් අඩි 80- 100 දක්වා උඩට වැඩෙන්න පුළුවන්. මේ ගස් ගැන අපූරු විත්ති ඕනෑතරම් තියෙනවා. එකක් තමයි කැබිලිත්තෑවේ සියඹලා ගහේ විත්තිය.

මේ සියඹලා ගහ තියෙන්නේ යාල කැලේ. එකදස් හයසිය ගණන්වල ලංකාව පාලනේ කරලා තියෙන්නේ ලන්දේසි. රට ආක්‍රමණය කළාට පස්සේ ලන්දේසියෝ ලංකාවෙ තියෙන පන්සල් දේවාල හොය යොයා ඒවාට පහර දීලා ඒවගේ තිබුණු වටිනා වස්තු කොල්ලකන්න ගත්තලු. කතරගම දේවාලෙත් මුන්දැලගේ ඇස් ගැටිලා. ඔය කාලේ දේවාලේ පාලනේ බාරවෙලා තිබිලා තියෙන්නේ කැබලිත්තේ රාළට. ලන්දේසියෝ කතරගමට ළංවෙන්ට කලින් දේවාලේ වටිනා වස්තුව අරන් කැබලිත්තේ රාළ යාල කැලේට පැනලා කැලේ තිබුණු මහා රූක්ෂ සියඹලා ගහ ඇතුළේ වස්තුව හංගලා. සියඹලා ගහ ගැන දැනගත්තු ලන්දේසි සියඹලා ගහ විනාශ කරලා වස්තුව ගන්න තැනුවලු. එතැනදි ලන්දේසියි කැබලිත්තේ රාළයි අතර මහා හටනක් ඇතිවෙලා ඒ හැමෝම මියගියාලු. හැබැයි කැබලිත්තේ රාළ දෙවියෙක් වෙලා අදටත් මේ මහ ගහ ආරක්ෂා කරනවා කියලයි මිනිස්සුන්ගේ විශ්වාසය. ඉතින් අදත් මේ සියඹලා ගහ වන්දනාමාන කරන්න මිනිස්සු යනවා.

නාඋල ගිරිතල පාරේ ඇළහැර පැත්තට වෙන්නත් සුප්‍රකට මහා සියඹලා ගහක් තියෙනවා. ඒ කාලේ මහසෙන් රජ්ජුරුවෝ විනෝදාංශයක් විදියට රාජකීය ඔරුවේ නැගලා යෝධ ඇළේ වටයක් දෙකක් යනවමලු. ඔය යද්දි ඔරුව ගැටගන්නේ මේ යෝධ සියඹලා ගහේලු. හැමදාම ඔරුව ගැටගහන ගහට මහසෙන් රජ්ජුරුවෝ 'ඔරු බැඳි සියඹලාව' කියලා නම් තියලා. ඓතිහාසික වටිනාකමක් තියෙන මේ සියඹලාව අදටත් තියෙනවා.

අතුපතර විහිදෙන මහා වෘක්ෂයක් නිසා සියඹලා ගස්වල දෙයියෝ වැඩ ඉන්නවය කියලයි ඒ කාලේ උදවිය විශ්වාස කළේ. දෙයියෝ වැඩ ඉන්න එක කෙසේ වෙතත් සියඹලා කරලේ දිව්‍යමය ගුණයක් තියෙන බවනම් අතිශයෝක්තියක් නෙවෙයි. ඇස් පෙනීම දියුණු කරන්න වගේම දියවැඩියාව පාලනේටත් සියඹලා හොඳයි. අනික සියඹලා තන්තුවලට කොලෙස්ටරෝල් පාලනේ කරන්නත් පුළුවන්. කෑම රුචිය වැඩි කරන්න, කෙස් වැටීම නතර කරන්න එකී මෙකී නොකී ගුණ රාශියක්ම සියඹලාවල තියෙනවා.

සියඹලා කියන්නේ පලතුරක් කිව්වනේ. හැබැයි එච්චරයේ ඇඹුල නිසාදෝ සියඹලා කන්න කට්ටිය ලොකු උනන්දුවක් දක්වන්නේ නැහැ. ඒත් සියඹලා කනවට වඩා සියඹලා බොන්න මිනිස්සු ආසයි. ස්වයං රැකියාවක් විදියට සියඹලා නෙක්ටා එකක් හදාගන්න හැටි කියලා දෙන්න හිතුවේ ඒකයි.





ඒ වැඩේට ඕනේ මේ බඩු ටික විතරයි. සියඹලා පල්පය 500g (සියඹලාවලට වතුර ඇබින්දක් දාලා දියකරලා පල්පය හදාගන්න), වතුර 4L 400ml, සීනි 500g, ලුණු 10g, sms0.5g, සිට්‍රික් ඇසිඩ් 5g. සියඹලා ගනිද්දි හොඳම සියඹලා ගන්න. එතකොට නෙක්ටා එකේ රහ පංකාදුවට එනවා. රහ හොඳ වෙන්න වෙන්න බිස්නස් එකත් හොඳ වෙනවා කියලා අමුතුවෙන් කියන්න ඕනා නෑනේ.

**පියවර 1**

සීනි ටිකයි වතුරයි භාජනේකට දාලා අඩු ගින්දරේ ලිපේ තියන්න. විනාඩි 10ක් විතර උණු කරන්න. මේක ලිපෙන් බාලා නිවෙන්න තියලා සියඹලා පල්පය එකතු කරලා හොඳට දියකරන්න.

**පියවර 2**

පිරිසුදු රෙදි කඩකින් පෙරලා sms, සිට්‍රික් ඇසිඩ් එකතු කරන්න. ජීවානුහරණය කරාපු බෝතල්වලට දාලා යන්තමින් මූඩිය වහලා 80C කට වගේ උෂ්ණත්වය තියෙන භාජනේකට දාලා විනාඩි 20ක් තියලා මූඩි තද කරන්න.

සියඹලා නෙක්ටා 200ml රුපියල් 300 වගේ ඉඳලා මිල කරන්න පුළුවන්. 0714766819 අංකයට කතා කරලා වැඩි විස්තර අහගන්න පුළුවන්.





**■ සෙව්වන්දි හෙට්ටිආරච්චි**

# කවි සොයුර

## ඇගේ වෙන්වීම

අපි හමුවුණ වෙරළ තීරෙ තාම තියෙනවා
රැල්ල ඇවිත් හාදු දීලා ආපසු යනවා
මම විතරක් වෙරළ තීරෙ සුසුම් හෙළනවා
ඔබ කොහිදැයි රැල්ල ඇවිත් මගෙන් අහනවා

ගහට පොත්ත වගේ ඔහෙල බැඳුණා නේද අහනවා
අහසට සඳ වගේ අඹරෙ නැත්තෙ කිමද අහනවා
ඔබ තනියම සුසුම් ලන්නෙ ඇයිද අහනවා
කියාගන්න පිළිතුරු නෑ මම ගොළුවෙනවා

ගහෙන් පොත්ත ගැලවෙනවා මට සිහිවෙනවා
පායපු සඳ හිමිදිරියේ අවරට යනවා
මා තනිකර ඈ වෙන හිතකට ළංවූවා
කියාදෙන්නෙ කොහොමද මම රළ හිනැහෙනවා

**බී.ඩී.අනුර විජේසෝම**
**නැගෙනහිර පල්ලියපිටිය**
**දුනගහ**

## අරුම මෙහෙවර

කඩාවැටෙන තරමටම
පරිගණක තීරයේ නෙතු
නටන මෙරුන්වන් දැඟිලි
කඳුපංති සිහි කරන ලිපිගොනු
මේසය පුරා යුද පිටියක

පැමිණුනත් දසත සේවාලාභීන්
වගකටවත් නොගෙන
දෙඩවති අල්ලාප සල්ලාප
වහසිබස් කෙළිකවට
තැනින් තැන
ආපනශාලා බිමක

එකට බත්පතක රස විඳ
පටු වාසි සිහිනයට
ගෙනයති දිය යටින් ගින්දර
සීතල කාමරේ නොඇසෙන තරම්
කසුකුසුවක

සියල්ල මිල කරන
පුරපසක් ගෙවන සඳ
අල්ලක් පමණවත් නොමැති පඩිපත
හිනාවෙයි ඉකිලනු නොහී සරදමට

**නිරූපමාලි පවිත්‍රා දිසානායක**

## අලුත් මිස්

මල් සුවඳ මුසු වූ
විලවුන් සුවඳ
ගී හඬ බඳු වූ
මිහිරි වදන්
නිල් මලක් වැනි වූ
දෙනුවන්
පන්තියට අලුත් ඉරක්
දරුවන්ට සෙනෙහසක්
නැගිට යයි
ඒ මේ අත
පෙරළයි පොත්
ප්‍රශ්න වැලක්
පසු - ඉදිරි පෙළ
දරුවන්ගේ
මුළු පන්තියම
මල් ගොමුවක්
අද
වෙනද නොතිබුණ

**චාන්දනී දේවිකා පුංචිහේවා**

## ආල හැඟුම්

සිතට නැගි ප්‍රේමය එක්පසකින් වුවත්
සැබෑට ගැළපුමකි ඔහු නොදනී ඒ බව

ප්‍රේමය පරිත්‍යාගයකියන බසෙහි අරුත
තවමත් නොවැටහේ මට

දෙඇස් එකිනෙක ගැටුණ නමුත්
ඉන් අප්‍රකාශිත ආලය
නොතේරුණේ මන්ද

ඔහු මවෙතින් ගිලිහී යයිදෝ
දැනෙන විට දෙකොපුල්
කඳුළින් තෙත් වන්නේ
හදවත දෙකඩ වන්නා වූ
ළපිරුණු ශෝකයකිනි

එකී වූ ළබැඳියාව ජීවිතේ යම් දිනක
ශේෂ වූ ස්මරණයක් ලෙස
තැන්පත්ව හදවතෙහි මියෙන තුරාවට
දැනෙනා නමුත් ප්‍රේම විරහවේ වේදනාව
පසෙකට වන්නෙමි ඔබ යන මාවතෙන්
සැබෑට හැඟුමක් සිත තුළ සැඟව
පරිත්‍යාගයට ඉඩ තබමි ආලෙන්

**දිනුකි**




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.